## වර්ෂ 2022 ක් වූ ඔක්තෝම්බර් මස 11 වන දින පෙ.ව. 10.00 ට සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද
## මතුගම ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාව

**සහභාගිත්වය :- සභිකවරු**

01. ලෙව්වන්දුව ලියනගේ මෙරිල් මුණසිංහ මහතා - ගරු සභාපති
02. ආර්.ඒ.ඩී. ලලිත් රණසිංහ මහතා - ගරු උප සභාපති
03. මද්දුමගේ දොන් අතුල මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
04. කේ.කේ.ඩී. ලලිත් නිශාන්ත කුලතුංග මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
05. කසුන් හිරෝෂණ මුණසිංහ මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
06. විජේසිංහ ආරච්චිගේ විජිත සිල්වා මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
07. කත්‍රිආරච්චිගේ කාන්ත සිරිවර්ධන මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
08. චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
09. වික්‍රමආරච්චි කංකානම්ගේ කමිල් කුමාර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
10. පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
11. සෙම්බප්පෙරුම ආරච්චිගේ සිරිසේන මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
12. කේ. ප්‍රියන්කා දමයන්ති ගුණවර්ධන මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
13. කාලංචිදූරගේ මිත්‍රානන්ද මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
14. ප්‍රේමරත්න නාකන්දල මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
15. සංජේ එරංග කරවිට මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
16. සීතා ඩයස් ජයසිංහ මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
17. සූරියආරච්චිගේ සුජීව නිර්මාන මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
18. පන්නිල විතානගේ පුෂ්පා නන්දනී මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
19. සම්පතා වඩුගේ තුසිතා ප්‍රියංගණී සිල්වා මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
20. ජේ.කේ.ඩී. පුබුදු මධුරංග ජයනෙත්ති මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
21. අබ්දුල් හමීඩ් මොහොමඩ් රම්සාන් මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
22. තුඩුගලගේ දොන් රෝහිත මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
23. මද්දගේ හින්ටන් ගුණසිරි මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
24. මුල්ලේ විතානගේ ටෙක්ලා ෆ්ලෝරි මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
25. එච්.ඩී. සුරේෂ් දර්ශන ජයසේකර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
26. අයි.එච්.ඩී. ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
27. දිසානායක සුදේශ් ලක්මාල් ජයවර්ධන මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
28. හෙලබගේ නිමාලක සුරංග විමලසූරිය මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
29. කේ.ඩබ්. නිලූකා දර්ශනී සිල්වා මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි

**නොපැමිණි සභිකවරු :-**

01. එච්.ඩී. නාමල් ප්‍රදීප් විජේකුමාර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
02. කරුණාමුණි ප්‍රසාදික නඳුන් ද සිල්වා මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
03. ධම්මික නිර්මාල් විජේසිංහ මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
04. දෝන ලීලා මුණසිංහ මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී

**නිලධාරීන්:-**

**01.** ඩබ්.ඒ.එම්.අයි.එස්.තෙන්නකෝන් මිය - ලේකම්
**02.** රම්‍යා මල්කාන්ති සන්දනායක මිය - ප්‍රධාන කළමණාකරන සේවා නිලධාරී
**03.** එම්.කේ.ඩී.සී.අවන්ති මෙනවිය - සංවර්ධන නිලධාරී(සභා කටයුතු)

මෙදින පෙ.ව. **10.00** ට පමණ මතුගම ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති මෙරිල් මුණසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මාසික මහ සභාව රැස්වුහ.පළමුව ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් සභාවට පැමිණ සිටි ගරු උප සභාපතිතුමා ඇතුලු ගරු මන්ත්‍රී මණ්ඩලයත්,නිලධාරීන් හා මාධ්‍යවේදීනුත් පිළිගැනීමෙන් අනතුරුව න්‍යාය පත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ විය.

**01. 2022.09.13 වන දින පැවති මහ සභා රැස්වීමේ වාර්තාව සහා අනුමැතිය සලකා බැලීම :**

ඉහත සභා වාර්තාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙම්බප්පෙරුම ආරච්චිගේ සිරිසේන මහතාගේ සහ කාලංචිදූරගේ මිත්‍රානන්ද මහතාගේ ස්ථීරත්වයෙන් සංශෝධනයන්ට යටත් ව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පුෂ්පා නන්දනී මහත්මිය**

පසුගිය න්‍යාය පත්‍රයේ යෝජනාවක් දාලා තිබුණා කමිටු වෙනස් කරන්න ඕන,ඒවා අළුත් කරන්න ඕන කියලා.ඒක ක්‍රියාවට නැංවුණේ නැහැ.මම යෝජනා කරනවා මේ සභාවේ දී න්‍යාය පත්‍රානුකූල ව කටයුතු කරන්න,ඉන් පරිබාහිර ව කිසි ම දෙයක් මේ සභාවේ දී සාකච්ඡා කිරීමෙන් වළකින්න.කාලය රන් හා සමාන යි.ඒ නිසා හැකි ඉක්මනින් අපේ යෝජනා ටික ඉදිරිපත් කරලා ඒ අනුව කටයුතු කරන්න කියලා ඉල්ලීමක් කරනවා මේ ගරු සභාවෙන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**

පසුගිය සභා වාර්තාවේ ලොකු අඩුපාඩුවක් නොවන කුඩා අඩුපාඩුවක් තියෙනවා.මේක කාරුණික ඉල්ලීමක්.යම්කිසි අවස්ථාවක දී අපේ සභාවේ ඉන්න මන්ත්‍රීවරු ප්‍රශ්නයක් ඇහුවොත් ඒක මට හොඳ නැති නිසයි කියන්නේ.මම සභා වාර්තාව හදන ඒ විෂය කරන මිස්වත් දැනුවත් කළා. පසුගිය සභා වාර්තාවේ “ඉමිරිච්” ආයතනය සම්බන්ධ ව ප්‍රශ්න කරන අවස්ථාවේ දී මම අදහස් දක්වපු අවස්ථාවක 59වෙනි පිටුවේ,**“187 වන වගන්තිය යටතේ”** කියලා මුද්‍රණය කරලා තියෙන්නේ.ඒක **182 වගන්තිය** විය යුතු යි.ඒ නිසා ඒක වෙනස් කරන්න.කවුරුහරි මේක දැක්කොත් හැමදාම මේ සභාවේ මම වගන්ති අනුව කතා කරද්දි බොරු කියන්නේ කියලා හිතනවා.මොකද මේක අවශ්‍ය වුණොත් අනාගතයේ දී යම් කිසි අවස්ථාවක උසාවියට ගෙනයන්න පුළුවන් වාර්තාවක්.ඒ නිසා ඒක වෙනස් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා**

පසුගිය සභා වාරයේ අපි ලබා දුන්න වීදි ලාම්පු වගයක් පිළිබඳ ව වැරදි වැටහීමක් තියෙනවා.ඒ පිළිබඳ ව මම පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍ය යි.මේ වීදි ලාම්පු පනහක්ම රුපියල්

47 000.00කට තමයි මිලදී ගෙන තියෙන්නේ. මුලින් ම කියන්න ඕන, හදිසි තත්ත්වයක් උඩ මේ සභාවේ බල්බ් එකක් එකක්වත් තිබුනේ නැහැ. ඒ වගේ වෙලාවක සභාපතිතුමා, ලේකම්තුමිය මට කතා කළේ.ඒ වෙලාවේ මම කොලේ පුරවලා දුන්නා. මොකද වෙළඳපොලේ මිළ අනුව තමයි මම ඒ කොලේ දුන්නේ.ඒ අතරේ අපේ බොන්දුපිටියේ නාගතිස්ස ස්වාමීන් වහන්සේ අපවත් වුණා.ඒ වේලාවේ මට අපේ ලේකම්තුමිය කතා කරලා ඇහුවා,"මන්ත්‍රීතුමා,බල්බ් දාන්න ඕන.මොකුත් කරගන්න විදිහක් නැහැ,බල්බ් නැද්ද කියලා ඇහුවා.මම ඒ වෙලාවේ අයි.ඕ.සී.එකේ තෙල් ගහන්න ලොරිය නවත්තලා තිබුණේ මේ සභාවේ ඉස්සරහම.ඒ වෙලාවේ මම කතා කරලා බලද්දී ලොරියේ තිබුණේ වොට් 12 බල්බ් 23යි.ඉන්දිකා මහත්මිය තමයි බල්බ් 23 සභාවට අරන් ආවේ.මට ඇත්තට ම කණගාටුයි. මන්ත්‍රීවරයෙක් විදිහට මේ බල්බ් දෙන එකත් වැරදියි කියන එක මට හිතෙනවා.මම

මන්ත්‍රීවරයෙක් වශයෙන් මට මේ සභාව මගේ ගෙදර වශයෙන් මයි සලකන්නේ.අපි මේ දේවල් කළේ සද්භාවයෙන්.ඒ නිසා මේ වැරදි වැටහීමක්. ඔබතුමාලාගෙන් සමාවෙන්න කියලා ඉල්ලනවා.අද කොහේ හරි රුපියල් 950.00ට බල්බ් එකක් ගන්න පුළුවන් නම් ඒක ගැන පැහැදිලි කරන්න.ඒ වගේ ම රුපියල් 1650.00ට මම දුන්නට ඒ කම්පැනියට ගියාම මට කිව්වේ ස්කූප් බල්බ් වගයක් තියෙනවා, රුපියල් 950.00ට විකුණගන්න පුළුවන්.ඒ නිසා ඒක ඔබතුමාට දෙන්න ද කියලා.ඊට පස්සේ මම කල්පනා කළා,දෙකක් ගන්න පුලුවන්නේ මේ මුදලට.ඒ නිසා ඒ පෙට්ටියේ ගහලා තියෙන්නේ රුපියල් 960.00යි.රුපියල් 950.00ට තමයි සභාවට දුන්නේ.ඒ වගේම තව කියන්න ඕන බල්බ් 50 ම ඔයාලා පාවිච්චි කරලා ඒ අවුරුදු දෙක ඇතුළත ගෙනාවත් මට ඊට වඩා අය කරගන්න පුලුවන්. රුපියල් 1700.00ක වගේ තමයි ලාභයක් තියෙන්නේ.ඒක නිසා ඒ වැරදි වැටහීම දුරු කරගන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඔය කියන සාරාංශය වාර්තාවට ඇතුළත් වෙන්න ඕනේ කියලා ද කියන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා**
ඔව්.

**02. ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතාගේ නිවේදනය :-**

**03. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා :-**

3.1 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කරුණාමුණි ප්‍රසාදික නඳුන් ද සිල්වා මහතා
3.2 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නාමල් ප්‍රදීප් විජේකුමාර මහතා
3.3 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධම්මික නිර්මාල් විජේසිංහ මහතා යන මන්ත්‍රීවරු නොපැමිණෙන බව දන්වන ලදී.

**04. සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම් හා පැමිණිලි සභාගත කිරීම :-**

4.1 මතුගම ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩලයෙන් බුදු දහම විකෘති දහමක් ලෙස පෙන්වා එය ව්‍යාප්ත කිරීමේ අරමුණින් අනවසර මධ්‍යස්ථානයක් ඉදි කිරීම පිළිබඳ ව වන ලිපිය සභාගත කරන ලදී.මේ පිළිබඳ ව අදාළ කමිටුව සම්බන්ධ කරගෙන එහි සත්‍ය තොරතුරු සොයා ගෙන අවශ්‍ය ඉදිරි කටයුතු කිරීමට සියලු දෙනාගේ එකඟතාවය මත ඒකමතික ව තීරණය කරන ලදී.

4.2 පළාත් පාලන දෙපාර්තමේන්තු ව මඟින් එවන ලද,1975 අංක 04 දරණ වීථි නම් කිරීම සහ ස්මාරක ඉදි කිරීම පාලනය කිරීමේ පනත යටතේ ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍රය සභාගත කරන ලදී.

4.3 අංක 804,පාන්තිය,වැල්කන්දල,මතුගම"එකමුතු වැඩිහිටි සමිතිය මඟින් "කොම්පෝස්ට් පොහොර පැකට් 20ක් පමණ ලබා දෙන ලෙසට ඉල්ලීම් කළ ලිපිය සභාගත කරන ලදී.

4.4 මතුගම "ඉමිරිච්" ආයතනයේ පී.වී.සුමිත් මහතා බදු කුලී සහනය ලබා ගැනීම සඳහා ඉල්ලුම් කළ ලිපිය සභාගත කරන ලදී.
(එහි දී මන්ත්‍රීවරු සාකච්ඡා කිරීමෙන් අනතුරු ව මේ ඉමිරිච් ආපනශාලාව සම්බන්ධ ව අපේ සභාවට අයවෙන්න ඕන මාසික කුලිය පිළිබඳ ව තීරණයක් ගත්තා.එහි දී ඔක්තෝම්බර් සිට මාසික කුලිය රුපියල් 90 000.00 සමඟ හිඟයෙන් අවමය රු.50 000.00 බැගින් මාසික ව ගෙවිය යුතු බවට තීරණය වුණා.එහි දී වසර දෙකක උපරිම කාල සීමාවක් තුළ ගෙවා අවසන්

කිරීමටත්,ඊටත් අමතර ව බදුකරු විසින් සාකච්ඡාවේ දී අදහස් දැක් වූ පරිදි ණය පහසුකමක් ලබා ගෙන හෝ ඉතිරිය ගෙවා අවසන් කිරීමටත් "ඉම්රිච්" ආයතනයට ලිඛිත ව දැනුම් දෙනවා.

4.5 පළාත් පාලන දෙපාර්තමේන්තු ව මඟින් එවන ලද,ප්‍රාදේශීය සභා අරමුදල් භාවිත කර සභාවේ තියෙන පාරවල්වල නඩත්තු කිරීම්,අනෙකුත් පොදු පහසුකම් කිරීම හා සම්බන්ධ චක්‍රලේඛනය සභාගත කරන ලදී.මේ සඳහා සැලැස්මක් සැදීමට සියලු දෙනාගේ එකඟතාවය මත ඒකමතික ව තීරණය කරන ලදී.

**05. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න :-** නැත

**06. යථා පරිදි කල් දී ඇති යෝජනා :-**

**6.1 ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා -:**

6.1.1 2018.04.10 දින මහ සභාවේ 5.1.8 යෝජනා සම්මුතිය අනුව ආවරණ අනුමැතියට යටත්ව මා වෙත පැවරී ඇති බලතල අනුව 2022.08.01 දින සිට 2022.08.31 දින දක්වා, කරන ලද පහත ගෙවීම් සහා අනුමැතියට ගරු සභාවට යෝජනා කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියළු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගෙවීම් විස්තර 2022 අගෝස්තු මාසය</u>**

| අනු අංකය | නම | වවුචර් අංකය | විස්තරය | මුදල |
|---|---|---|---|---|
| | **2022.08.01** | | | |
| 1 | මෙට්‍රොපොලිටන් ටෙක්නොලජි | 1 | ඩුප්ලෝ යන්ත්‍රයට තීන්ත 04 ක් මිලදී ගැනීම | 33,824.00 |
| 2 | මුදල් භාරකරු | 2 | ඇණවුමට ඉන්ධන ලබා නොදෙන බැවින් මතුගම ඒජන්සීස් වෙතින් ඩීසල් ලීටර් 500 ක් මුදල් ගෙවා ලබා ගැනීම | 220,000.00 |
| 3 | මුදල් භාරකරු | 3 | වැලිපැන්න උපකාර්යාලයේ සංග්‍රහ වියදම් | 1,000.00 |
| 4 | එච්.ඩබ්.ඩී. ඉන්දිකා | 4 | කාර්යාල කාර්ය සහායක - 2022 ජුනි අතිකාල දීමනා | 4,755.08 |
| 5 | ජී.එම්. දිසානායක | 5 | සංවර්ධන නිලධාරී - රාජකාරී ගමන් වියදම් | 1,600.00 |
| 6 | එම්.කේ. කළුතරගේ | 6 | රියදුරු - රාජකාරී ගමන් වියදම් | 700.00 |
| 7 | යූ.එස්. මුණසිංහ | 7 | සංවර්ධන නිලධාරී - රාජකාරී ගමන් වියදම් | 4,200.00 |
| 8 | ඩී.එච්. නිපුණි දිනූෂා | 8 | සංවර්ධන නිලධාරී - රාජකාරී ගමන් වියදම් | 700.00 |
| 9 | එම්.ඩී.ආර්. තිලිණක | 9 | සංවර්ධන නිලධාරී - රාජකාරී ගමන් වියදම් | 2,100.00 |

| | | | | |
|---|---|---|---|---|
| 10 | අචිනි නිසංසලා | 10 | සංවර්ධන නිලධාරී - රාජකාරී ගමන් වියදම් | 1,400.00 |
| 11 | කාර්යභාර නිලධාරී - හොරවල | 11 | සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය | 2,485.00 |
| 12 | කාර්යභාර නිලධාරී - හොරවල | 12 | මුද්දර අග්‍රිමය ප්‍රතිපූර්ණය | 2,000.00 |
| 13 | ටී.ඩී. අජිත් | 13 | ව්‍යාපෘති කම්කරු - 2022 මැයි අතිකාල දීමනා | 4,644.20 |
| 14 | එස්.කේ. අතුකෝරාල | 14 | ව්‍යාපෘති කම්කරු - 2022 මැයි අතිකාල දීමනා | 4,221.07 |
| 15 | ඩී.එච්. ජයන්ත | 15 | ව්‍යාපෘති කම්කරු - 2022 මැයි අතිකාල දීමනා | 4,830.00 |
| 16 | කේ.ඒ. උදය නෙලුපුල් | 16 | රාජකාරි ගමන් වියදම් - වැඩ ක්ෂේත්‍ර කම්කරු | 1,400.00 |
| 17 | ඩබ්.ඒ. සුනිල් ප්‍රසන්න | 17 | අදායම් පරීක්ෂක - 2022 මැයි පරිවර්තිත ගමන් වියදම් | 1,455.00 |
| 18 | ඩබ්.ඒ. සුනිල් ප්‍රසන්න | 18 | අදායම් පරීක්ෂක - 2022 ජුනි පරිවර්තිත ගමන් වියදම් | 1,500.00 |
| 19 | ඩබ්.ඩී. සුනිල් ශාන්ත | 19 | අදායම් පරීක්ෂක - 2022 ජුනි වැඩ බැලීමේ දීමනා | 4,523.33 |
| 20 | ඩබ්.ඩී. සුනිල් ශාන්ත | 20 | අදායම් පරීක්ෂක - 2022 මැයි නිවාඩු දින වැටුප් | 3,675.00 |
| | **2022.08.02** | | | |
| 21 | කේ.එම්.ඩී. බුද්ධික | 21 | සාමකන්ද සුසාන භූමියේ කළුගල බෝර ගසා කඩා ඉවත් කිරීම | 124,600.00 |
| 22 | කේ.එම්.ඩී. බුද්ධික | 22 | පොදු වෙළඳපොල මාළු කඩ අළුත්වැඩියාව සඳහා 6x4 කළුගල් කියුබ් 1.09 ක් සැපයීම | 7,630.00 |
| | **2022.08.03** | | | |
| 23 | විතාන ඉන්ඩස්ට්‍රීස් | 23 | LL-7571 කෘ කැබ් රථයේ ‍ පෙෂර් ප්ලේට් ක්ලච් ප්ලේට් පද්ධතිය සැකසීම | 56,200.00 |
| | **2022.08.05** | | | |
| 24 | මුදල් භාරකරු | 24 | මතුගම ඒජන්සීස් වෙතින් මුදල් ගෙවා LJ-9413, RB-2267, RF 1964 යන වාහන සඳහා ඩීසල් ලීටර් 97.17 ක් ලබා ගැනීම (රු.430.00 බැගින්) | 41,783.00 |
| | **2022.08.08** | | | |
| 25 | ගෑස්ටෙක් එනර්ජි ලංකා | 25 | 2022.08.08 - ආදාහනාගාරය සඳහා 37 1/2 ගෑස් සිලින්ඩර් 05 ක් මිලදී ගැනීම (රු. 19043.00 x 5 = රු. 95215.00) | 95,215.00 |
| 26 | අර්ජුන කිරිඇල්ල | 26 | 2022 අගෝස්තු මස මහ සභාවට සංග්‍රහ සඳහා අත්තිකාරම් ලබා ගැනීම | 10,000.00 |
| 27 | අරුණ බුද්ධික ජිනදාස | 27 | AAJ-4210 ත්‍රීරෝද රථයේ ආදායම් බලපත්‍රය සඳහා අත්තිකාරම් ලබා ගැනීම | 1,250.00 |

| | | | | |
|---|---|---|---|---|
| 28 | මුදල් භාරකරු | 28 | 2022 ජූලි මස සභික ගමන් වියදම් | 75,000.00 |
| 29 | මුදල් භාරකරු | 29 | 2022 අගෝස්තු මස සභික දීමනා ගරු සභාපතිතුමා ඇතුළු 32 ක් සඳහා | 495,000.00 |
| | **2022.08.09** | | | |
| 30 | ලංකා විදුලිබල මණ්ඩලය | 30 | 2022 ජුනි මාසය සඳහා ආයතන 32 ක් වෙනුවෙන් විදුලි බිල්පත් ගෙවීම | 108,050.10 |
| 31 | මුදල් භාරකරු | 31 | 2022 ජූලි දෛනික වැටුප් හොරවල උපකාර්යාලය | 75,923.59 |
| 32 | මුදල් භාරකරු | 32 | 2022 ජූලි මස ව්‍යාපෘති වැටුප් - හොරවල උපකාර්යාලය | 199,366.92 |
| 33 | මුදල් භාරකරු | 33 | 2022 ජූලි මස දෛනික වැටුප් - වැලිපැන්න උපකාර්යාලය | 107,464.88 |
| 34 | මුදල් භාරකරු | 34 | 2022 ජූලි මස ව්‍යාපෘති වැටුප් - වැලිපැන්න උපකාර්යාලය | 72,608.94 |
| 35 | මුදල් භාරකරු | 35 | 2022 ජූලි මස දෛනික වැටුප් - මතුගම ප්‍රධාන කාර්යාලය | 218,446.30 |
| 36 | මුදල් භාරකරු | 36 | 2022 ජූලි මස විෂබීජහරණ හා කසල කළමනාකරණ වැඩසටහන වැටුප් | 194,444.28 |
| 37 | මුදල් භාරකරු | 37 | 2022 ජූලි මස ඩෙංගු මර්ධන වැඩසටහන වැටුප් | 253,349.52 |
| 38 | මුදල් භාරකරු | 38 | 2022 ජූලි මස ව්‍යාපෘති වැටුප් - මතුගම ප්‍රධාන කාර්යාලය | 345,649.00 |
| 39 | නන්දසේන ලියනගේ | 39 | 2022 ජූලි මස මහජන සම්බන්ධතා නිලධාරී දීමනා | 14,000.00 |
| 40 | මුදල් භාරකරු | 40 | එච්.ජී.එන්. තනුජා ඇතුළු 05 ක් සඳහා රාජකාරී දීමනා | 1,300.00 |
| 41 | මුදල් භාරකරු | 41 | 2022 අගෝස්තු මස වැටුප් අත්තිකාරම් හොරවල උපකාර්යාලය | 1,500.00 |
| 42 | මුදල් භාරකරු | 42 | 2022 අගෝස්තු මස වැටුප් අත්තිකාරම් මතුගම ප්‍රධාන කාර්යාලය | 14,600.00 |
| 43 | මුදල් භාරකරු | 43 | 2022 අගෝස්තු මස වැටුප් අත්තිකාරම් - වැලිපැන්න උපකාර්යාලය | 1,000.00 |
| | **2022.08.10** | | | |
| 44 | මුදල් භාරකරු | 45 | සංවර්ධන නිලධාරී ආර්.ඒ.ටී.ජී.එන්. රණවක මෙනවියගේ නොගෙවූ වැටුප් ගෙවීම - 2022 අප්‍රේල් | 46,790.00 |
| 45 | මුදල් භාරකරු | 46 | රසාදරී හංසිකා අභ්‍යාසලාභී පුහුණු දීමනා - 2022 අප්‍රේල්, මැයි | 11,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 46 | මුදල් භාරකරු | 47 | මෙරිල් මුණසිංහ ඇතුළු 08 ක් සඳහා සැලසුම් කමිටු දීමනා 2022 ජුනි/ ජූලි | 12,000.00 |
| 47 | දිරිය පියස සුභ සාධක සමිතිය | 48 | අඹගහකුඹුර පොදු මාර්ගය සංවර්ධනය කිරීම අවසාන ගෙවීම | 332,014.95 |
| | **2022.08.12** | | | |
| 48 | එවරස්ට් වේයිං මැෂින් කම්පැණි | 49 | කොම්පෝස්ට් අංගනයට 250kg බිම් තරාදියක් මිලදී ගැනීම | 58,000.00 |
| 49 | ගෑස්ටෙක් එනර්ජි ලංකා | 50 | 2022.08.12 - 37 1/2 ගෑස් සිලින්ඩර් (ලීටර්) 04 ක් මිලදී ගැනීම. (රු.18193.00 x 4 = 72772.00) | 72,772.00 |
| 50 | සී/ස මතුගම විවිධසේවා සමූපකාර සමිතිය | 51 | ගබඩාවට ඩීසල් ලීටර් 100 ක් මිලදි ගැනීම | 43,000.00 |
| | **2022.08.15** | | | |
| 51 | එස්.කේ. එන්ටර්ප්‍රයිසස් | 52 | මතුගම ඔරලෝසු කණුවට සවිකර ඇති ඔරලෝසුව සඳහා WS LED බල්බ් 08 ක් මිලදී ගැනීම | 3,560.00 |
| 52 | එක්සත් ප්‍රජාමණ්ඩලය ලෙව්වන්දුව | 53 | කනානවත්ත පාර සංවර්ධනය කිරීම 10% අතරුදවුම් ගෙවීම | 21,385.30 |
| 53 | පැරකුම් සුභ සාධක සමිතිය කොළැහැකඩ | 54 | පැණියමුල්ල පාර සංවර්ධනය කිරීම 10% අතරුදවුම් ගෙවීම | 51,826.45 |
| 54 | එක්සත් සුභ සාධක සමිතිය මැඩවුන්හේන පුස්සලමුල්ල | 55 | කිරිදිවැල්කැටිය පාර සංවර්ධනය කිරීම 10% අතරුදවුම් ගෙවීම - 01 අදියර | 49,915.19 |
| 55 | එක්සත් සුභ සාධක සමිතිය මැඩවුන්හේන පුස්සලමුල්ල | 56 | කිරිදිවැල්කැටිය පාර සංවර්ධනය කිරීම 10% අතරුදවුම් ගෙවීම - 02 අදියර | 49,867.75 |
| 56 | සමෘද්ධි සමිතිය - තල්ගස්ගොඩ | 57 | කුරුන්ද සුනාමි මාර්ගය සංවර්ධනය කිරීම 10% අතරුදවුම් ගෙවීම - 02 අදියර | 88,874.47 |
| 57 | එම්.ඩී. කාංචනා ජයමාලි | 58 | කායවර්ධන පුහුණුකරු දීමනා | 5,806.45 |
| 58 | ගෑස්ටෙක් එනර්ජි ලංකා | 59 | ආදාහනාගාරය සඳහා 37 1/2 ලිටෝ ගෑස් සිලින්ඩර් 06 ක් මිලදී ගැනීම (රු. 18193.00 x 6 = රු. 109158.00) | 109,158.00 |
| | **2022.08.16** | | | |
| 59 | ජයලත් එන්ටර්ප්‍රයිසස් | 60 | පොදු ගබඩාවට ඉන්ධන මිලදී ගැනීම ඩීසල් ලීටර් 200 x රු. 430 = රු. 86000.00 , පෙට්‍රල් ලීටර් 100 x රු. 450 = රු. 45000.00 , | 131,000.00 |
| | **2022.08.17** | | | |
| 60 | ශ්‍රී ලංකා ටෙලිකොම් | 62 | දුරකථන ජාලය සඳහා බිල්පත් ගෙවීම | 27,833.96 |
| 61 | අර්ජුන කිරිඇල්ල | 63 | ගබඩාවට පෙට්‍රල් ලීටර් 20 ක් මිලදී ගැනීම | 9,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 62 | අරුණ බුද්ධික ජිනදාස | 64 | ආදායම් බලපත්‍ර ලබා ගැනීම අත්තිකාරම් පියවීම | 1,250.00 |
| 63 | ආර්.එම්. සන්දනායක | 65 | ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී - 2022 ජූලි අතිකාල දීමනා | 12,016.55 |
| 64 | කේ.වී. අරුණ ශාන්ත | 66 | මුරකරු - 2022 ජූලි මස අතිකාල දීමනා | 7,703.20 |
| 65 | ජයන්ත ද සිල්වා | 67 | ආදාහනාගාර ක්‍රියාකරු - 2022 ජූලි මස අතිකාල දීමනා | 9,225.90 |
| 66 | නිරංග පුෂ්පකුමාර | 68 | ආදාහනාගාර ක්‍රියාකරු සහායක - 2022 ජූලි මස අතිකාල දීමනා | 2,599.83 |
| 67 | ඩිලාන් ගුණරත්න | 69 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජූලි මස අතිකාල දීමනා (මුර සේවය) | 8,088.26 |
| 68 | අනුරුද්ධ ඉන්ද්‍රජිත් | 70 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජූලි මස අතිකාල දීමනා ( විදුලි අංශය) | 5,969.98 |
| 69 | කේ.ඒ. ලසන්ත කුමාර | 71 | ව්‍යාපෘති කම්කරු - 2022 ජූලි මස අතිකාල දීමනා (ප්‍රධාන කාර්යාලය) | 6,280.22 |
| 70 | ටී.ඩී අජිත් කුමාර | 72 | ව්‍යාපෘති කම්කරු - 2022 ජූලි මස අතිකාල දීමනා (සෞඛ්‍ය අංශය) | 5,277.05 |
| 71 | ර්.එම්. නුවන් චතුරංග සෙනෙවිරත්න | 73 | මුරකරු - 2022 ජූලි මස අතිකාල දීමනා | 7,366.32 |
| 72 | සංජය එරික් ලසන්ත | 74 | මුරකරු - 2022 ජූලි මස අතිකාල දීමනා | 11,777.77 |
| 73 | එච්.ඩබ්.ඩී. නීල් ප්‍රසන්න | 75 | කළමනාකරණ සේවා නිලධාරී - 2022 ජූලි මස අතිකාල දීමනා | 822.71 |
| 74 | යූ.කේ.ඩී. සුමිත් | 76 | කාර්යාල කාර්ය සහායක - 2022 ජූලි මස අතිකාල දීමනා | 5,056.60 |
| 75 | උදාර සමරමාන්න | 77 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජූලි මස අතිකාල දීමනා | 866.61 |
| 76 | එම්.ඒ. සේනාරත්න | 78 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජූලි මස අතිකාල දීමනා (මුර සේවය) | 8,170.20 |
| 77 | ඒ.කේ. කරුණාලාල් ඇපා | 79 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජූලි මස අතිකාල දීමනා (මුර සේවය) | 11,479.50 |
| 78 | එන්.ඩී. අජිත් | 80 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජූලි මස අතිකාල දීමනා | 2,183.22 |
| 79 | ඒ. ජානක රුවන් දයාරත්න | 81 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජූලි මස අතිකාල දීමනා | 8,088.36 |
| 80 | ප්‍රගීත් ඉන්දික | 82 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජූලි මස අතිකාල දීමනා | 2,777.76 |
| 81 | චන්දන පුෂ්පකුමාර | 83 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජූලි මස අතිකාල දීමනා (මුර සේවය) | 5,777.40 |

| | | | | |
|---|---|---|---|---|
| 82 | සී.පී. මුණසිංහ | 84 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජූලි මස අතිකාල දීමනා (ප්‍රධාන කාර්යාලය - යතුරු රාජකාරි | 11,666.40 |
| 83 | ඊ.ඒ. කසුන් | 85 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජූලි මස අතිකාල දීමනා (මුර සේවය) | 11,222.40 |
| 84 | දීප්ති රංගජීව | 86 | මුරකරු - 2022 ජූලි මස අතිකාල දීමනා | 9,722.00 |
| 85 | ඩී.එල්. ජයතුංග | 87 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජූනි මස අතිකාල දීමනා | 3,094.74 |
| 86 | ඩී.එල්. ජයතුංග | 88 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජූලි මස අතිකාල දීමනා | 9,169.60 |
| 87 | එල්.ඒ. ගාමිණී | 89 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජූලි මස අතිකාල දීමනා (මුර සේවය) | 12,240.96 |
| 88 | ඩබ්.ඩී සුනිල් ශාන්ත | 90 | ආදායම් පරීක්ෂක - 2022 ජූලි මස වැඩ බැලීමේ දීමනා | 4,523.33 |
| 89 | කාර්යභාර නිලධාරී - හොරවල | 91 | 2022 ජූනි මස සංග්‍රහ වියදම් ප්‍රතිපූර්ණය | 1,000.00 |
| 90 | කාර්යභාර නිලධාරී - වැලිපැන්න | 92 | සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය | 3,000.00 |
| | **2022.08.22** | | | |
| 91 | අර්ජුන කිරිඇල්ල | 93 | 2022 අගෝස්තු මස මහ සභාව සංග්‍රහ වියදම් අත්තිකාරම පියවීම | 9,145.00 |
| 92 | මිහිඳු වන්නකුමාර | 94 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - 2022 ජූලි අතිකාල දීමනා | 3,674.52 |
| 93 | කා.භා.නි වැලිපැන්න | 95 | 2022 ජූලි සංග්‍රහ වියදම් ප්‍රතිපූර්ණය | 1,000.00 |
| 94 | කාර්යභාර නිලධාරී - හොරවල | 96 | සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය | 2,720.00 |
| 95 | පී.වී. සීතා රංජනි | 97 | කළමනාකරණ සේවා නිලධාරි - 2022 මැයි අතිකාල දීමනා | 871.52 |
| 96 | ඩි.එච්. ජයන්ත | 98 | සෞඛ්‍ය කම්කරු - කසළ එකතු කිරිම 2022 ජූලි අතිකාල දීමනා | 2,005.45 |
| 97 | සුසන්ත හෙට්ටිආරච්චි | 99 | සෞඛ්‍ය කම්කරු කසළ එකතු කිරිම 2022 ජූනි අතිකාල දීමනා | 5,423.58 |
| 98 | සුමිත් කුමාර අතුකෝරල | 100 | රියදුරු දෛනික කසළ එකතු කිරිම - 2022 ජූලි අතිකාල දීමනා | 1,706.39 |
| 99 | එස්.කේ. අතුකෝරල | 101 | රියදුරු - දෛනික කසළ එකතු කිරිම - 2022 ජූනි අතිකාල දීමනා | 4,670.12 |
| 100 | ටී.ඩී. අජිත් | 102 | සෞඛ්‍ය කම්කරු - 2022 ජූලි අතිකාල දීමනා | 2,005.45 |
| 101 | ඩී.එච්. ජයන්ත | 103 | සෞඛ්‍ය කම්කරු - කසළ එකතු කිරිම - 2022 ජූනි අතිකාල දීමනා | 5,277.50 |

| | | | | |
|---|---|---|---|---|
| 102 | යූ.ඒ. බුද්ධදාස | 104 | සෞඛ්‍ය කම්කරු - කොම්පෝස්ට් අංගනය මුර - 2022 ජුනි හා ජූලි අතිකාල දීමනා | 5,197.05 |
| 103 | රංජිත් වීරසිරි | 105 | සෞඛ්‍ය කම්කරු - කසළ එකතු කිරිම - 2022 ජුනි අතිකාල දීමනා | 7,194.28 |
| | **2022.08.22** | | | |
| 104 | ෆැමිලි එන්ටර්ප්‍රයිසස් | 109 | 37.5kg ගෑස් සිලින්ඩර් (15) සඳහා | 279,375.00 |
| | **2022.08.23** | | | |
| 105 | ජයලත් එන්ටර්ප්‍රයිසස් | 110 | පොදු ගබඩාවට ඩීසල් ලිටර් 400 ක් මිලදී ගැනිම (රු. 400.00 x රු. 430.00 = රු. 172,000.00) | 172,000.00 |
| | **2022.08.24** | | | |
| 106 | මුදල් භාරකරු | 111 | මුද්දර අග්‍රිමය ප්‍රතිපූර්ණය | 8,000.00 |
| 107 | ආර්.පී. වරුණ ඉෂාන්ත | 112 | සෞඛ්‍ය පරිපාලක - 2022 ජූලි නිවාඩු දින වැටුප් | 4,973.33 |
| 108 | පී.වී. කපිල | 113 | විදුලි අංශයට 1.044 වයර් රෝල් 03 මිලට ගැනිම | 24,600.00 |
| 109 | පී.වී. කපිල | 114 | මහජන පොළෙහි 07 කඩ කාමරය අලුත්වැඩියාව සඳහා MM10 කම්බි 4 ක් මිලදී ගැනීම | 8,200.00 |
| 110 | පී.වී. කපිල | 115 | විදුලි අංශයට 1.044 වයර් රෝල් 02 මිලට ගැනිම | 16,400.00 |
| 111 | එච්. රෝහණ | 116 | මාර්ග ආරක්ෂණ ඇප තැන්පත් ආපසු ගෙවීම | 50,000.00 |
| 112 | දමින්ද සංජීව පලිහවඩන | 117 | ක්‍රීඩාපිටිය ඇපතැන්පත් ආපසු ගෙවීම | 4,000.00 |
| 113 | ඉෂාර මධුසංඛ | 118 | ක්‍රීඩාපිටිය ඇපතැන්පත් ආපසු ගෙවීම | 3,000.00 |
| 114 | මතුගම ඒජන්සිස්(පුද්) සමා | 119 | ඉන්ධන බිල්පත් ගෙවීම - ඇමුණුම - 1 | 476,625.05 |
| 115 | ඉන්ෆෝබිට් ලංකා | 120 | පුස්තකාලය සඳහා UPS - 02, බැටරි 02 ක් මිලදී ගැනීම | 12,000.00 |
| 116 | ඉන්ෆෝබිට් ලංකා | 121 | මහ සභාවේ රෙකෝඩින් කටයුතු සඳහා පෙන් ඩ්‍රයිව් 01 ක් මිලදී ගැනීම | 2,100.00 |
| 117 | **ලංකා පිරවුම්හල - යටදොලවත්ත** | 122 | ඉන්ධන බිල්පත් ගෙවීම ඇමුණුම - 2 | 72,000.00 |
| 118 | **ලංකා පිරවුම්හල - යටදොලවත්ත** | 123 | ඉන්ධන බිල්පත් ගෙවීම ඇමුණුම - 3 | 181,965.00 |
| 119 | මෙට්‍රොපොලිටන් ටෙක්නොලොජි (පුද්) සමාගම | 124 | ඡායා පිටපත් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම - මතුගම මහජන පුස්තකාලය | 40,735.31 |
| | **2022.08.26** | | | |
| 120 | විතාන ඉන්ඩස්ට්‍රීස් | 125 | RB - 2267 ට්‍රැක්ටරයේ ට්‍රේලරය සෑදීම | 18,250.00 |

| | | | | |
|---|---|---|---|---|
| 121 | ඩී. සැම්සන් ඉන්ඩස්ට්‍රීස් | 126 | ශ්‍රවණාගාර ඇපතැන්පත් ආපසු ගෙවීම | 10,000.00 |
| 122 | පී.වී. කපිල | 127 | මීගම පුස්තකාලය කැඩී ඇති පේමන්ට් එක සෑදීම සඳහා සිමෙන්ති මිටි 10 ක් මිලදී ගැනීම | 32,000.00 |
| 123 | ලංකා විදුලිබල මණ්ඩලය | 128 | දිප්පිට පෙර පාසල - විදුලි බිල්පත් | 720.00 |
| 124 | එම්.එම්. ජයන්ත ගුණරත්න | 129 | අභ්‍යන්තර විගණන - පරීක්ෂාවට මුද්‍රාවක් සෑදීම | 3,200.00 |
| 125 | යූ.එල්.ටී.ඒ. ගුණසිංහ | 130 | 2022 ජූලි මස රාජකාරී ගමන් වියදම් | 700.00 |
| 126 | බී.ඩී. උපුල් නුවන් සංජීව | 131 | 2022 ජූලි මස රාජකාරී ගමන් වියදම් | 700.00 |
| 127 | අරුණ බුද්ධික ජිනදාස | 132 | 2022 ජූලි මස රාජකාරී ගමන් වියදම් | 800.00 |
| 128 | එම්.ඩී.ටී.පී. ද අල්විස් | 133 | මුද්දර අග්‍රිමය ප්‍රතිපූර්ණය | 1,350.00 |
| 129 | යූ.කේ.ඩී. සුමිත් | 134 | 2022 ජූලි මස රාජකාරී ගමන් වියදම් | 400.00 |
| 130 | යූ.කේ.ඩී. සුමිත් | 135 | 2022 අගෝස්තු මස රාජකාරී ගමන් වියදම් | 662.00 |
| | **2022.08.29** | | | |
| 131 | අරුණ බුද්ධික ජිනදාස | 136 | JG-4546 ට්‍රැක්ටරයේ ආදායම් බලපත්‍ර ලබා ගැනීම අත්තිකාරම් | 900.00 |
| | **2022.08.30** | | | |
| 132 | කේ.ටී.එන්. මෝටර්ස් | 137 | 53-4621 කැබ් රථයේ ඩික්ස් බ්‍රේක් සීල් සෙට් 01 මිලදී ගැනීම | 6,680.00 |
| 133 | සහකාර කළමණාකරු ඉංජිනේරු- අළුත්ගම ඩිපෝව | 138 | LL-7571 කෘ කැබ් රථයේ ක්ලච් පද්ධතිය සෑදීම ඉංජිනේරු වාර්තාව ලබා ගැනීම | 2,000.00 |
| 134 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 139 | ශ්‍රවණාගාරයට ජලය සැපයීම - බිල්පත් ගෙවීම 2022.06.15 - 2022.07.11 දක්වා | 1,549.15 |
| 135 | නාමල් හාඩ්වෙයාර් | 140 | ප්‍රධාන කාර්යාලයේ ජෙනරේටරය අළුත්වැඩියා කිරීමට AM15 වූ කෝන් වයර් මීටර් 15, AM15 ප්ලග් ටොප් එකක් ලබා ගැනීම | 4,375.00 |
| 136 | හයිටෙක් ෂෝ පවර් ඉංජිනියරින් | 141 | ප්‍රධාන කාර්යාලයේ ජෙනරේටරය අළුත්වැඩියාව සඳහා වැඩ කුලී ගෙවීම | 6,000.00 |
| 137 | දූලංක ඉන්ටර්නැෂනල් (ප්‍රයි) ලිමිටඩ් | 142 | ගෙවුණු ටයර් 11 ක් නැවත පිරවීම (825 x 16 = 1) (750 x 16 = 1) (650 x 16 = 1) (700 x 16 = 3) | 97,000.00 |
| 138 | චමින්ද ටයර් හවුස් | 143 | වාහන 4 ක් සඳහා පැච් දැමීම | 2,300.00 |
| 139 | රනික් මෝටර්ස් | 144 | 53 - 4621 කැබ් රථයේ ඉදිරිපස රෝද ගලවා ශුද්දකර බ්‍රේක් පෑඩ් අලුතින් දැමීම, බ්‍රේක් ඔයිල් දැමීම, බ්‍රේක් පෑඩ් සෙට් හා ෂවර් හෝස් දැමීම | 16,750.00 |
| 140 | සිතිජ ට්‍රේඩ් සෙන්ටර් | 145 | වැලිපැන්න උප කාර්යාලයට ඩස්බින් 05 ක් මිලදී ගැනීම | 1,375.00 |

| | | | | |
|---|---|---|---|---|
| 141 | චතුමි ඇඩ්වටයිසින් | 146 | පූජ්‍ය බොන්දුපිටියේ නාගතිස්ස හිමියන් වෙනුවෙන් ශෝක ප්‍රකාශ බැනර් 02 ක් මුද්‍රණය කිරීම | 7,200.00 |
| 142 | කල්‍යාණි ට්‍රේඩින් (පුද්) සමාගම | 147 | ගබඩාව සඳහා පෑන් 300 මිලදී ගැනීම | 3,600.00 |
| 143 | කල්‍යාණි ට්‍රේඩින් (පුද්) සමාගම | 148 | ගබඩාව සඳහා ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම | 77,000.00 |
| 144 | කල්‍යාණි ට්‍රේඩින් (පුද්) සමාගම | 149 | ගබඩාව සඳහා වර්ණ A4 පැකට් 02 ක් මිලදී ගැනීම | 7,350.00 |
| 145 | ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි | 150 | දුම්රිය බලපත්‍ර ගාස්තු ගෙවීම | 4,440.00 |
| 146 | එම්.ඩී. ලලිත් ප්‍රේමතිලක | 151 | ZA-0452 JCB යන්ත්‍රයේ ඩීසල් ෆිල්ටර් ෆෑන් ෆයිබර් රෙපෙයාර් කිට් සවි කිරීම | 3,800.00 |
| 147 | ජී.ඩී. මලිත් ඩිල්ෂාන් | 152 | 2022 ජුනි මස පුවත් පත් බිල් - වැලිපැන්න උප කාර්යාලය | 11,850.00 |
| 148 | ඒ.සී.එෆ්. සහීරා | 153 | 2022 මැයි මස මීගම පුස්තකාලය පුවත්පත් බිල්පත් | 8,980.00 |
| 149 | එච්.පී.කේ.බී.ඩී. ද අල්විස් | 154 | 2022 මැයි මස ගල්මත්ත පුස්තකාලය පුවත්පත් බිල්පත් | 13,684.00 |
| 150 | රහුමා ස්ටෝර්ස් | 155 | 2022 අප්‍රේල් - ජූලි දක්වා දෙමළ පුවත්පත් බිල්පත් | 5,820.00 |
| 151 | ඩී.සී. සුරේෂ් ලක්මාල් | 156 | 2022 මාර්තු - මැයි මතුගම පුස්තකාලය පුවත්පත් බිල්පත් | 47,400.00 |
| 152 | ගයාන් මධුරංග තෙවරප්පෙරුම | 157 | 2022 ජුනි මස යටදොල පුස්තකාලයේ පුවත්පත් බිල්පත් | 13,710.00 |
| 153 | ගයාන් මධුරංග තෙවරප්පෙරුම | 158 | 2023 ජුනි මස නවුත්තුඩුව පුස්තකාලයේ පුවත්පත් බිල්පත් | 11,060.00 |
| 154 | ගයාන් මධුරංග තෙවරප්පෙරුම | 159 | 2023 ජුනි මස හේනේගම පුස්තකාලයේ පුවත්පත් බිල්පත් | 11,060.00 |
| 155 | ඉන්ෆොබිට් ලංකා | 160 | මතුගම පුස්තකාලයේ පරිගණකය සඳහා UPS උපාංගයට බැටරියක් මිලදී ගැනීම | 6,000.00 |
| 156 | සෝෆාස්ට් (ප්‍රයිවට් ලිමිටඩ්) | 161 | QQ-1984 ත්‍රී රෝද රථය ස්පීඩෝ මීටරයේ ටොප් කවරය 01 | 5,280.00 |
| 157 | ගුණවර්ධන ගරාජ් | 162 | AAJ-4210 ත්‍රී රෝද රථය අලුත්වැඩියාව | 900.00 |
| 158 | එන්.එස්.ටී.එන්. විරාජිනී | 163 | සෞඛ්‍ය අංශයට විම් දියර (රු. 500 x 25 = රු. 12500.00) හා විම් පවුඩර් (රු. 285 x 50 = රු. 14250.00) මිලදී ගැනීම | 26,750.00 |
| 159 | ඩී.එම්.ඒ.අයි. කල්දේරා | 164 | අත් සේදුම් දියර් ලීටර් 4 කෑන් 5 ක් මිලදී ගැනීම | 8,500.00 |
| 160 | මතුගම ඒජන්සිස්(පුද්) සමා | 165 | ඉන්ධන බිල්පත් - ඇමුණුම - 4 | 277,935.91 |

| | | | | |
|---|---|---|---|---|
| 161 | මතුගම ඒජන්සිස්(පුද්) සමා | 166 | ඉන්ධන බිල්පත් - ඇමුණුම 5 | 464,764.68 |
| 162 | අර්ජුන කිරිඇල්ල | 167 | ගබඩාවට පෙට්‍රල් ලීටර් 35 ක් ලබා ගැනීමට අත්තිකාරම් (රු. 450 x35 = රු. 15750.00) | 15,750.00 |

6.1.1 යටතේ ගෙවීම් යෝජනා කරනවා.ඒ පිළිබඳ ව දැන ගන්න දෙයක් තියෙනවා නම් අහන්න.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
පිටු අංක 31,6.1.21 යටතේ රු.1 323 000.00ක් ඉසුරු ගොවි සංවිධානය වෙත ගෙවන්න දාලා තියෙනවා.මම අහන්නේ මෙම ගෙවීම්වල වගකීම සභාපතිතුමා භාර ගන්න වා ද?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඔව්.අදියර දෙකයි.එකක් අමාත්‍යාංශයේ ප්‍රතිපාදන.ඒක වැඩ කරන්න ප්‍රමාණවත් වුණේ නැහැ.බිම හදන එකට ප්‍රමාණවත් වුණේ නැහැ.ඒවාට තමයි සභා අරමුදලින් ඉතුරු ටික දැම්මේ පිට්ටනියේ වැඩ ඉවර කරන්න.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
එතකොට ක්‍රීඩා ඇමතිතුමා බුලත්සිංහලට ආවා දිවා රාත්‍රී වොලිබෝල් ක්‍රීඩාංගනය විවෘත කරන්න.ඔබතුමා ගියා ද ඒක විවෘත කරන එක බලන්න.
**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
නැහැ මම සහභාගි වුණේ නැහැ.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
එතකොට දොඩංගොඩ ක්‍රීඩාංගනය හදන්න ලක්ෂ 15යි.බණ්ඩාරගම ක්‍රීඩාංගනය හදන්න ලක්ෂ 15යි.ඔය බුලත්සිංහල හදන වොලිබෝල් ක්‍රීඩාංගනය දිවා රාත්‍රී එකක්.ලයිට් 13ක් දාලා තියෙනවා.දිවා රාත්‍රී වොලිබෝල් ක්‍රීඩාංගනය හදලා ඊට අමතර ව දිවා රාත්‍රී නෙට්බෝල් ක්‍රීඩාංගනයකුත් හදලා තියෙනවා.ඒක විවෘත කළේ ක්‍රීඩා ඇමතිතුමා.ලක්ෂ 21යි ගාණ.මම අහන්නේ මේ මතුගම දිවා රාත්‍රී නොවීත් මේ තරම් වියදමක් ගියේ කොහොම ද කියලා?මේ වගේ ව්‍යාපෘතියක් කළා ම ගෙවීම් පිළිබඳ ව බලනවා ද?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මේ ගෙවීම් කළුතර ඉංජිනේරුවරු ඇවිත් බලන්නැති.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
ඉංජිනේරුවරු ඇවිත් බැලුවාට ලක්ෂ 15ක් අනිත් සභාවල යනවා නම් ඒ ක්‍රීඩාංගන මීට අඩු මුදලින් ඊටත් වඩා හොඳට හදලා තියෙනවා නම් මේකට මෙපමණ මුදලක් වැය වීම පිළිබඳ ව අපට සැකයක් තියෙනවා.ඒක නිසා මෙම ගෙවීම්වලට ආර්.ඒ.ඩී.ලලිත් රණසිංහ වන මම පෞද්ගලික ව විරුද්ධ යි.මේකේ වගකීම සම්පූර්ණයෙන් ම එන්නේ තාක්ෂණ නිළධාරියාට.මම මේ පිළිබඳ ව පරීක්ෂණයක් ඉල්ලනවා.මේ වගේ වියදමක් මේ සභාවට විතරක් ගියේ කොහොමද කියන එකයි මට තියෙන ප්‍රශ්නය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මේ ගෙවීම පිළිබඳ ව මගේත් එකඟතාවයක් නැහැ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මේ ව්‍යාපෘතියේ ගෙවීම් පිළිබඳ ව තාක්ෂණ වාර්තා සැලකිල්ලට ගමු කොහොම ද ගෙවලා තියෙන්නේ කියලා.ගිය සභාවේ ඔය ප්‍රශ්නය ආවා ම,"ඔය සභාවේ කොහොම ද හැදුවේ?" කියලා මම දොඩංගොඩ සභාපතිතුමාගෙන් ඇහුවා.ඒක මෙපමණ උසට නැහැ කිව්වා.ලැබුණු රු.ලක්ෂ 15න් වැඩ ඉවර කරලා දැම්මා කිව්වා.මේකේ මුල් ඇස්තමේන්තුවෙන් ආපු ටික බලලා වැරදියට ගෙවීම් කරලා තියෙනවා නම්,වැඩියෙන් ගෙවීම් කරලා තියෙනවා නම්,එක ම විෂයට දෙපාරක් ගෙවීම් කරලා තියෙනවා නම් ඒවාට තාක්ෂණ නිළධාරීන් වගකියන්න ඕන.ඒ අය නිර්දේශ කරන එක අපි අත්සන් කරලා දෙනවා.ක්‍රීඩා අමාත්‍යාංශයේ පිරිස ඇවිත් මේක බලලා තියෙනවා.කළුතර තාක්ෂණ නිළධාරීන්ට මේ ගෙවීම් වාර්තා ඉදිරිපත් කරලා ඒ අය සැලකිල්ලට අරගෙන තමයි මේවා කරන්නේ.මම පෞද්ගලික ව මේකට වගකියන්නේ නැහැ.සභවෙන් තීරණයක් ගන්න මේක වෙනවා ද?ගෙවන්න සුදුසු නැතිනම් පරීක්ෂණයක් කරනවද කියලා.කැමති තීරණයක් අරගන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් ජයවර්ධන මහතා**
මේ පරීක්ෂණය අනිවාර්යයෙන් ම කරන්න මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කමිල් කුමාර මහතා**
මේක ඇත්තට ම අසාමාන්‍ය තත්වයක්.මොකද කළුතර දිස්ත්‍රික්කයේ අනෙක් සභාවල් ඊට වඩා අඩු මුදලට හදද්දී අපි මීට වඩා දෙගුණයක මුදලට යනවා කියන එක අපේ සභාව පිළිබඳ තියෙන විශ්වාසය පළුදු වීමක්.මොකද එක ම කාලයේ හදපු අනෙක් ක්‍රීඩාංගන ඊට වඩා අඩු මුදලට තියෙද්දී අපේ ක්‍රීඩාංගනය සඳහා මෙපමණ වැඩි මුදලක් වැය වුණේ කොහොමද කියන එක ගැටළුවක්.සභාපතිතුමාත් සමස්ත සභාවත් විශාල දෝශාරෝපණයකට ලක් වෙන්න තියෙන අවස්ථාවක් නිසා සභාපතිතුමා සහ සභාව නිර්දෝශ වෙන්න නම් මේ පරීක්ෂණය අනිවාර්යයෙන් ම කරන්න.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මම ඒකට එකඟ යි.

## <u>2023 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම පිළිබඳ යෝජනාව</u>

**6.1.2** ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2023 වර්ෂයට වරිපනම් බදු පනවා අය කිරීම පිළිබඳ යෝජනාවයි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මතුගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දියුණු යැයි ප්‍රකාශයට පත්කර ඇත්තාවූ ප්‍රදේශය ඇතුලත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2022 වර්ෂය සඳහා වූ තක්සේරුව 2023 වර්ෂය සඳහා තක්සේරුව ලෙස පිළිගත යුතු බවටත් එකී තක්සේරුව මත 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 (1) හා (2) උප වගන්තියෙන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපල ඉහත කී තක්සේරුවේ වාර්ෂික වටිනාකමින්,

1. වැලිපැන්න හා හොරවල උප කාර්යාල බල ප්‍රදේශවල පිහිටි දියුණු යැයි ප්‍රකාශයට පත්කර ඇති සෑම නිශ්චල දේපලක් මත සියයට හතර (4%) වරිපනම් බද්දක් ද,

2. මතුගම උප කාර්යාල බල ප්‍රදේශයේ දියුණු ප්‍රදේශ ලෙස නම් කර ඇති අංක 03 හි දැක්වෙන දේපල හැර සෑම නිශ්චල දේපලක් මත සියයට අට (8%) වරිපනම් බද්දක් ද,

3. මතුගම උප කාර්යාල බල ප්‍රදේශයේ පහත දැක්වෙන කොට්ඨාස වල වරිපනම් අංක ඇතුලත් දේපල මත සියයට හතර (4%) වරිපනම් බද්දක් ද

I. කොට්ඨාස අංක 1 පල්ලිගොඩ පාර වරිපනම් අංක 175/1 සිට 175/26 දක්වා

II. කොට්ඨාස අංක 2 මතුගම කන්ද දකුණු දොරටුව වරිපනම් අංක 7 සිට වරිපනම් අංක 35 දක්වා (වම) වරිපනම් අංක 24 සිට වරිපනම් අංක 60 දක්වා (දකුණ)
මතුගම කන්ද උතුරු දොරටුව වරිපනම් අංක 20

ගල්ලෙන පටුමග වරිපනම් අංක 15 සිට වරිපනම් අංක 15/4 දක්වාත්, වරිපනම් අංක 10 සිට 14/1 දක්වාත්,

පීල්ල පාර වරිපනම් අංක 38 සිට වරිපනම් අංක 174 දක්වාත්, වරිපනම් අංක 61 සිට 195 දක්වාත්, සාම කන්ද පාර වරිපනම් අංක 9 සිට වරිපනම් අංක 69 දක්වාත්,
වරිපනම් අංක 18 සිට වරිපනම් අංක 52 දක්වාත්,
හොරකඳමුල්ල පාර වරිපනම් අංක 87/7 සිට 87/11 දක්වාත් වරිපනම් අංක 120 සිට වරිපනම් අංක 120/59 දක්වාත්,

III. කොට්ඨාස අංක 03 පෙත්තකන්ද වරිපනම් අංක 43 සිට වරිපනම් අංක 141 දක්වාත් වරිපනම් අංක 32 සිට වරිපනම් අංක 134 දක්වාත්, වැලහැඩිහේන වරිපනම් අංක 23 සිට වරිපනම් අංක 75 දක්වාත්, වරිපනම් අංක 40 සිට වරිපනම් අංක 74/11 දක්වාත්,

IV. කොට්ඨාස අංක 05 මද්දෙගෙදර පාර වරිපනම් අංක 117/20 සිට වරිපනම් අංක 117/42 දක්වාත්,

V. කොට්ඨාස අංක 06 මද්දෙගෙදර පාර වරිපනම් අංක 116/36 සිට වරිපනම් අංක 116/69 දක්වාත්

පනවා අයකල යුතු බවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ගරු සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

තවද, 2023 වර්ෂයෙහි පහත උපලේඛණයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2023 වර්ෂයෙහි ජනවාරි 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක් ද , එකී උපලේඛණයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල ප්‍රාදේශීය සභා

අරමුදලට ගෙවනු ලබන්නේ නම් එම කාර්තුවට අදාළ මුදලින් සියයට පහක (5%) ක වට්ටමක් ද ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවටත් ගරු සභාවට යෝජනා කරන ලදී.

බදු මුදල් එක් එක් කාර්තුව අවසානයේදී නොගෙවනු ලබන අවස්ථාවකදී එම මුදල් අය කර ගැනීම පිණිස නිකුත් කරනු ලබන බලපත්‍රයක් යටතේ හිස් බිම් හා නිවාස ස්ථාන සම්බන්ධයෙන් අයවිය යුතු බද්දෙන් සියයට පහළවක (15%) අධි ගාස්තුවක් ද හිස් බිම් හා නිවාස ස්ථාන නොවන දේපල සම්බන්ධයෙන් අය විය යුතු බද්දෙන් සියයට විස්සක (20%) අධි ගාස්තුවක් ද අය කිරීමට යෝජනා කරන ලදී.

<u>**ඉහත කී උප ලේඛනය**</u>

| **I වන තීරුව කාර්තුව** | **II වන තීරුව ගෙවිය යුතු දිනය** | **III වනතීරුව 5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය** |
|---|---|---|
| පළමුවන කාර්තුව | මාර්තු 31 දිනට පෙර | ජනවාරි 31 |
| දෙවන කාර්තුව | ජුනි 30 දිනට පෙර | අප්‍රේල්30 |
| තුන්වන කාර්තුව | සැප්තැම්බර් 30 දිනට පෙර | ජූලි 31 |
| හතරවන කාර්තුව | දෙසැම්බර් 31 දිනට පෙර | ඔක්තෝම්බර් 31 |

<u>**2023 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම පිළිබඳ යෝජනාව**</u>

**6.1.3** ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2023 වර්ෂයට කර්මාන්ත බදු පනවා අය කිරීම පිළිබඳ යෝජනාවයි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (I) වන උප වගන්තිය හා 150 (2) උප වගන්තියෙන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වා ගෙන යනු ලබන මෙහි පහත උපලේඛණයෙහි I වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛණයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බව බවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ගරු සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

| I තීරුව | | II තීරුව | | |
|---|---|---|---|---|
| | | ස්ථානයේ වාර්ෂික වටිනාකම | | |
| අනු අංකය | කර්මාන්තය | රු. 750.00 නොඉක්මවන අවස්ථාවක | රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක | රු. 1500.00 ඉක්මවන අවස්ථාවක |
| 1 | ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 2 | ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 3 | අත්යන්ත්‍ර මගින් කර්මාන්තයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 4 | බීරළු කැටයම් වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 5 | වාහන බෝඩ් සෑදීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 6 | කොප්පරා සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 7 | මැණික් ගල් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 8 | විද්‍යුත් ලෝහ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 9 | ගඩොල් පිළිස්සීම හා මැටි භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 10 | තේ පෙට්ටි නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 11 | රබර් මුද්‍රා අංක තහඩු නාම පුවරු නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 12 | වැලි ගොඩ දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 13 | හඳුන්කූරු සුවඳ විලවුන් නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 14 | කපු නූල් සායම් පෙහවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 15 | ගමන් මලු නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 16 | නාම පුවරු හෝ ස්ටිකර් සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 17 | කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 18 | ඩයමන් රෝලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 19 | දුම් ගෙයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 20 | පාවහන් හෝ සම් ආශ්‍රිත නිෂ්පාදන ආයතනයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 21 | සැළුන් එකක් හෝ බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

| අනු අංකය | බද්ද අදාලවන ව්‍යාපාර |
|---|---|
| 1 | සිල්ලර බඩු කඩයක් පවත්වාගෙන යාම |
| 2 | රෙදිපිලි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 3 | කැබලි රෙදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 4 | සාප්පු බඩු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 5 | රබර් ඔට්ටපාළු මිලට ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 6 | ස්වර්ණාභරණ අලෙවි කිරීමේ ස්ථානයක් සඳහා |
| 7 | පොත් සාප්පුවක් පවත්වාගෙන යාම |
| 8 | මනාලියන් හැඩගැන්වීම් හා මංගල ඇඳුම් කුලියට දීම |
| 9 | බටහිර බෙහෙත් (ෆාමසියක්) පවත්වා ගෙන යාම |
| 10 | මෝටර් රථ අමතර කොටස් අලෙවි කිරීම |
| 11 | පාවහන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 12 | ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 13 | ග්‍රොසරියක් පවත්වාගෙන යාම |
| 14 | කුළුබඩු තොග වශයෙන් අලෙවි කරන ස්ථානයක් සඳහා |
| 15 | සෙල්ලම්බඩු හා විසිතුරු බඩු අලෙවි කිරීම |
| 16 | බුලත් පුවක් හා සිගරට් බීඩි කඩයක් පවත්වාගෙන යාම |
| 17 | මුදල් අය කර පුද්ගලික අධ්‍යාපන ආයතයක් හෝ පෙර පාසලක් පවත්වාගෙන යාම |
| 18 | දන්ත කාර්මික වැඩපලක් පවත්වාගෙන යාම |
| 19 | ලයිට් එන්ජින් විදුලි උපකරණ ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දීම |
| 20 | හිස් බෝතල් පරණ පත්තර පරණ යකඩ බඩු ගබඩා කිරීම මිලට ගැනීම |
| 21 | අලුත් හෝ පරණ යන්ත්‍ර සූත්‍ර අමතර කොටස් අලෙවි කිරීම |
| 22 | තොග වශයෙන් තේ කොල ගබඩා කිරීම හෝ අලෙවි කිරීම |
| 23 | ශීතකරන, මහන මැෂින් විදුලි උපකරණ අලෙවි කිරීම |
| 24 | පුවත් පත් අලෙවි කිරීම |
| 25 | ඇස් කණ්නාඩි අලෙවි කිරීම ගබඩා කිරීම |
| 26 | රේස් බුකියක් පවත්වාගෙන යාම |
| 27 | රේස් බයි රේස් ස්ථානයක් පවත්වාගෙන යාම |
| 28 | අවමංගල්‍ය භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 29 | කිරිපිටි ටින් කෑම විකිණීම හා ගබඩා කිරීම |
| 30 | පා පැදි හා අමතර කොටස් අලෙවි කිරීම |
| 31 | මල් පෝච්චි හෝ මැටි භාණ්ඩ අලෙවි කරන ස්ථානයක් සඳහා |
| 32 | යතුරු පැදි හා වාහන විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 33 | සිංහල බෙහෙත් බඩු අලෙවි කරන ස්ථානයක් සඳහා |
| 34 | නූල් බොත්තම් රේන්ද විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 35 | බටහිර බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම |
| 36 | ඡායාපිටපත් ගැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 37 | සිගරට් ගබඩා කිරීමේ හා අලෙවි කිරීම |
| 38 | ධාන්‍ය වර්ග කුළුබඩු තොග ගබඩාවක් පවත්වාගෙන යාම |
| 39 | මැසූ ඇඳුම් විකිණීමෙ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 40 | ගෝනි ගබඩා කිරීම හා මිලදී ගැනීම |
| 41 | දුම් කොළ ගබඩා කිරීම හා අලෙවි කිරීම |
| 42 | දේශීය ආනයන ද්‍රව්‍ය හෝ භාණ්ඩ ගබඩා කිරීම |
| 43 | මල් හෝ මල් පැළ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 44 | වී ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |

| | |
|---|---|
| 45 | සිමෙන්ති ගබඩා කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 46 | හම් හෝ රෙක්සින් ගබඩා කිරීම, අලෙවි කිරීම |
| 47 | මැටි භාණ්ඩ ගබඩා කිරීම හා අලෙවි කිරීම |
| 48 | තේ දළු එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 49 | රබර් කිරි එකතු කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 50 | සුවඳ විලවුන් විෂබීජ නාශක භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් සඳහා |
| 51 | දැව යකඩ හෝ තහඩු කටු කම්බි විකිණීමේ ස්ථානයක් සඳහා |
| 52 | ජල පොම්ප විදුලි උත්පාදන යන්ත්‍ර අලෙවි කිරීම |
| 53 | රෙකෝඩ් බාර් එකක් පවත්වාගෙන යාම |
| 54 | වීඩියෝ පට කුලියට දීම හා අලෙවි කිරීම සඳහා |
| 55 | රජයේ අනුමත මත්පැන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 56 | හාල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 57 | සංගීත භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 58 | ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම |
| 59 | විසිතුරු භාණ්ඩ කැටයම් භාණ්ඩ නිෂ්පාදනය හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 60 | රජයෙන් අනුමත මත්පැන් සමග උත්සව ශාලාවක් පවත්වාගෙන යාම |
| 61 | වෙළඳාම් කිරීම සඳහා කුමක් හෝ ද්‍රව්‍යයන් ප්‍රදර්ශනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 62 | ජංගම දුරකථන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 63 | පරිගණක පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 64 | සිවිල් ඉංජිනේරු කටයුතු කිරීම හා සැලසුම් ශිල්පීය සේවා ස්ථානයක් පවත්වා ගෙන යාම |
| 65 | කායවර්ධන ව්‍යායාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 66 | ගෘහ භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 67 | ඇළුමිනියම් ප්ලාස්ටික් භාණ්ඩ අලෙවි කිරීම |
| 68 | මූල්‍ය ආයතන හා බැංකුවක් පවත්වාගෙන යාම |
| 69 | රක්ෂණ කටයුතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 70 | රියදුරු පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 71 | කුමක් හෝ ද්‍රව්‍ය පැකට් කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 72 | උකස් ගැනීම හා බ්‍රෝකර් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 73 | තේ කුඩු අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 74 | පින්තූර රාමු කිරීම වීදුරු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 75 | විශේෂඥ වෛද්‍ය සේවා ස්ථානයක් පවත්වාගෙන යාම |
| 76 | දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම |
| 77 | බැටරි ඇසිඩ් ගබඩා කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 78 | දුරකථන කුළුණු හා සන්නිවේදන උපකරණ සවිකර පවත්වා ගෙන යාම |
| 79 | දුරකථන කුළුණු හැර සන්නිවේදන උපකරණ සවිකර පවත්වාගෙන යාම |
| 80 | විසිතුරු මසුන් ඇති කිරීම හා අලෙවි කරන ස්ථානයක් පවත්වා ගෙන යාම |
| 80 | ලොතරැයි අලෙවිකරණ ස්ථාන පවත්වා ගෙන යාම |
| 82 | වීථිවල සංචාරය කරමින් වෙළඳාම් කිරීම |
| 83 | ගොඩනැගිලි වැහිපීලි සකස් කරන ස්ථානයක් පවත්වා ගෙන යාම |
| 84 | වැලි ගබඩා කර විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම |
| 85 | ඉන්ධන තෙල් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම |
| 86 | ඉඩම් වෙන්දේසිකරුවන් ලියාපදිංචි කිරීම |

| | |
|---|---|
| 87 | නීතිඥ කාර්යාලයක් පවත්වා ගෙන යාම |
| 88 | බදු උපදේශන සේවා මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම |
| 89 | ඇලුමිනියම් පාටිෂන් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම |
| 90 | අවමංගල්‍ය සේවා මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම |
| 91 | ටයර් අලෙවි කරන ස්ථානයක් පවත්වා ගෙන යාම |
| 92 | බැටරි විකිණීමේ හා ආරෝපණය කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම |
| 93 | පොල් රා නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම |
| 94 | වාහන රෝද බැලන්ස් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම |
| 95 | මගී ප්‍රවාහනය හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් පවත්වා ගෙන යාම |
| 96 | මිනිස් බල සේවා හා සැපයීමේ සේවාවන් පවත්වා ගෙන යාම |
| 97 | බිම් ඇතුරුම්ගල් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම |
| 98 | එළවළු හෝ පළතුරු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම |
| 99 | මල් පැළ තවාන් පවත්වා ගෙන යාම හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම |
| 100 | මිනින්දෝරු සේවාවන් පවත්වා ගෙන යාම |
| 101 | කොන්ත්‍රාත්කරුවන් ලෙස කටයුතු කරන පුද්ගලයින් ලියාපදිංචි කිරීම |
| 102 | ආරක්ෂිත කැමරා සවි කිරීමේ ආයතනයක් පවත්වා ගෙන යාම |
| 103 | අන්තර්ජාල භාවිතයෙන් භාණ්ඩ අලෙවි කරන ස්ථානයක් පවත්වා ගෙන යාම |
| 104 | වාහන කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 105 | කාර් නිශ්පාදනය කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම |
| 106 | සුරතල් සතුන් ඇති කරන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 107 | අයිස්ක්‍රීම් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 108 | වාහන අමතර කොටස් අලෙවිකරන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 109 | ඉදිකිරීම් කර්මාන්තකරුවන්ගේ සේවය ලබාදෙන ස්ථානයක් පවත්වාගෙන යාම |

**<u>2023 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම පිළිබඳ යෝජනාව</u>**

**6.1.4** ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2023 වර්ෂයට ව්‍යාපාර බදු පනවා අය කිරීම පිළිබඳ යෝජනාවයි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(1) වගන්තිය යටතේ මතුගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ යම් ව්‍යාපාරයක් මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2023 වර්ෂයේදී පවත්වා ගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2023 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛණයෙහි I වන තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් ලෙස 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමට ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**ඉහත කී උපලේඛණය**

| I තීරුව | | II තීරුව |
|---|---|---|
| 2023 වර්ෂයේ ව්‍යාපාරයේ ආදායම | | රු. ශත |
| රු. 6000 නොඉක්මවන අවස්ථාවක | | කිසිවක් නොමැත. |
| රු. 6000 ඉක්මවන එහෙත් රු. 12000 නොඉක්මවන අවස්ථාවක | | රු. 90.00 |
| රු. 12000 ඉක්මවන නමුත් රු. 18750 නොඉක්මවන අවස්ථාවක | | රු. 180.00 |
| රු. 18750.00 ඉක්මවන නමුත් රු. 75000.00 නොඉක්මවන විට | | රු. 360.00 |
| රු. 75000.00 ඉක්මවන නමුත් රු. 150000.00 නොඉක්මවන විට | | රු. 1200.00 |
| රු. 150000.00 ඉක්මවන විට | | රු. 3000.00 |

**2023 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම පිළිබඳ යෝජනාව**

**6.1.5** ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2023 වර්ෂයට බලපත්‍ර ගාස්තු පනවා අය කිරීම පිළිබඳ යෝජනාවයි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය හා 149 වන වගන්තිය යටතේ මතුගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛණයෙහි I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2023 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛණයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමට ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

.

තවද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පළක් වන විටදී, ඊට අදාළ බලපත්‍ර ලබා දීමේදි එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2022 වර්ෂයේ ආදායමින් 1% ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2023 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් යෝජනා කරන ලදී.

## ඉහත කී උප ලේඛණය

| පළවන උප ලේඛනය - පීඩාකාරී ව්‍යාපාර | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | බලපත්‍රයේ ස්වභාවය | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750.00 ට නොවැඩි වන විට රු. ශත. | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750.00 ට වැඩි හා රු. 1500.00 ට අඩු වන විට රු. ශත. | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1500.00 ට වැඩි වන විට රු. ශත. |
| 1 | දියර පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |
| 2 | සම් පදම් කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 3 | සම් විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 4 | සත්ත්ව පාලනය (මස්,කිරි හෝ බිත්තර සඳහා) | 500.00 | 750.00 | 1000.00 |
| 5 | ඡායාරූප ශාලාවක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 6 | පශු වෛද්‍ය සායනයක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 7 | විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 8 | සත්ත්ව සායනයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 9 | කරවල ,ලුණුමාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150 ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 10 | පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 11 | දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 12 | සත්ත්ව ආහාර නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 13 | පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම් 200 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 14 | සබන් නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 15 | සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 16 | අළුත් හෝ පරණ ලෝහ ලෝහ ගබඩා කර තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 17 | ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරිමේ ස්ථානයක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 18 | ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබා ගැනිම | 500.00 | 750.00 | 1000.00 |
| 19 | වේවැල් භාණ්ඩ නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 20 | වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 21 | සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 22 | රසකැවිලි වර්ග නිපදවිම | 500.00 | 750.00 | 1000.00 |
| 23 | පොල් ලෙලි පෙහවීම. (හෝ පල් කිරිම) | 500.00 | 750.00 | 1000.00 |
| 24 | බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර) | 500.00 | 750.00 | 1000.00 |
| 25 | දත් බුරුසු නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 26 | රා එකතු කිරිම | 500.00 | 750.00 | 1000.00 |
| 27 | විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරිම | 500.00 | 750.00 | 1000.00 |
| 28 | යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | පැවැත්වීම | | | |
| 29 | පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 30 | සෝඩා නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 31 | සම් භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 32 | පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 33 | වී, මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාෂභෝග, කළුබඩු හෝ කිරි පිටි ඇඹරීම සඳහා ඇඹරුම් හලක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 34 | ඉටිපන්දම් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 35 | කපුරු නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 36 | ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 37 | රෙදි සෝදන නිල් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 38 | ලාකඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 39 | සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 40 | යෝගට් නිෂ්පාදන ආයතනයක් පවත්වා ගෙන යාම | | | |
| 41 | මස් සඳහා සතුන් මරණ ස්ථානයක් පවත්වා ගෙන යාම | | | |
| 42 | පාසැල් රටහුණු නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 43 | ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 44 | ටයර් නැවත පිරිවීම | 500.00 | 750.00 | 1000.00 |
| 45 | ටයර් ටියුබ් වොක්ලකනිස් කිරිමේ ස්ථානයක් පැවැත්විම | 500.00 | 750.00 | 1000.00 |
| 46 | සිමෙන්ති කිලෝ ග්‍රෑම් 1000 ට වැඩි ප්‍රමිණයක් ගබඩා කර තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 47 | සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බෙස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 48 | ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 49 | යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම | 500.00 | 750.00 | 1000.00 |
| 50 | පොහොර, හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 51 | යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 52 | ධාන්‍ය හෝ මාෂභෝග කිලෝ ග්‍රෑම් 250 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 53 | ගලි සේවාවන් කරන ආයතන පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 54 | බිම් මල් නිෂ්පාදනය කිරීම හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 55 | නූඩ්ල්ස් හා පපඩම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 56 | රබර් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 57 | තේ කොළ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 58 | ප්‍රවාහනයේදී මාර්ග ආරක්ෂිත ඇප අය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 59 | ශල්‍ය ගෝස් හා පුළුන් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 60 | ඔට්ටපාළු හා කොස් රබර් නිෂ්පාදනය කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 61 | කඩදාසි නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

| දෙවන උප ලේඛනය - අන්තරාදායක පීඩාකාරී ව්‍යාපාර | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | බලපත්‍රයේ ස්වභාවය | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. **750.00** ට නොවැඩි වන විට රු. ශත. | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. **750.00** ට වැඩි හා රු. **1500.00** ට අඩු වන විට රු. ශත. | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. **1500.00** ට වැඩි වන විටි රු. ශත. |
| 1 | තොග වශයෙන් විකිණීම සඳහා හාල් පිටි, ලුණු හෝ සීනි කිලෝග්‍රෑම් 750 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 2 | මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 3 | මුද්‍රණාලයක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 4 | කුකුළන් 100 ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 5 | එළුවන්, ඌරන් 10 ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 6 | ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 7 | දර ගබඩාවක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 8 | කළුගල් කැණීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් | 500.00 | 750.00 | 1000.00 |
| 9 | සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල් බීම බෝතල් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 10 | අයිස්ක්‍රීම් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 11 | පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 12 | ගිණි පෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 13 | කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 14 | පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 15 | ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 16 | යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම | 500.00 | 750.00 | 1000.00 |
| 17 | යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හල් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 18 | හිස් ගෝනි හෝ හිස් බෝතල්ගබඩා කර තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 19 | පා පැදි හෝ යතුරු පැදි අළුත්වැඩියා කිරීමේ වැඩපළක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 20 | පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩාකර තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 21 | විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 22 | ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම හෝ | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | නිපදවීම | | | |
| 23 | පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 24 | ශීතකළ මස් හෝ මාළු ගබඩාකර තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 25 | දැව ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |

| තෙවන උප ලේඛනය - පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර | | | | |
|---|---|---|---|---|
| **අනු අංකය** | **බලපත්‍රයේ ස්වභාවය** | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. **750.00** ට නොවැඩි වන විට රු. ශත. | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. **750.00** ට වැඩි හා රු. **1500.00** ට අඩු වන විට රු. ශත. | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. **1500.00** ට වැඩි වන විට රු. ශත. |
| 1 | රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එනසාල් හෝ කෙඳි කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 2 | ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම | 500.00 | 750.00 | 1000.00 |
| 3 | රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම | 500.00 | 750.00 | 1000.00 |
| 4 | විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 5 | හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම, සකස් කිරීම හෝ අලුහුණු ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 6 | බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 7 | මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 8 | මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 9 | වාත්තු මඩුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 10 | බෙලෙක් වැඩපලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 11 | ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ ස්ථෘනයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 12 | ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරිම | 500.00 | 750.00 | 1000.00 |
| 13 | වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 14 | ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 15 | කිලෝග්‍රෑම් 150 ට වැඩියෙන් තේ කුඩු ගබඩාකර තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 16 | වෑල්ඩින් සඳහා ස්ථානයක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 17 | ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩපළක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 18 | පැට්‍රෝල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් ඛණිජ තෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 19 | කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 20 | වායු සමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 21 | විදුලි කර්මාන්තවැඩපළක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අළුත්වැඩියා කිරීමේ වැඩපළක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 22 | කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 23 | බේකරියක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 24 | හෝටල් හා ලැගුම්හල් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 25 | භෝජන ශාලාවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 26 | මාළු විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 27 | මස් විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 28 | අවමංගල්‍ය සේවා සැපයීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

## 2023 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම පිළිබඳ යෝජනාව

**6.1.6** ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2023 වර්ෂයට අක්කර බදු ගාස්තු පනවා අය කිරීම පිළිබඳ යෝජනාවයි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (3) වන උප වගන්තියෙන් මතුගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටියා වූ ද ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූද එක් එක් ඉඩම් හෙක්ටයාරය මත පහත දක්වා ඇති අනුප්‍රමාණ නොඉක්මවන අක්කර බද්දක් 2023 වර්ෂයට පනවා අය කිරීමට ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

| **ඉඩම් ප්‍රමාණය** | **අනු ප්‍රමාණය වර්ෂයකට** |
|---|---|
| ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර පහක් හෝ ඊට වැඩි අවස්ථාවක | රු. 10.00 |

2023 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2023 වර්ෂයේ ජනවාරි මස 31 දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද එක් එක් කාර්තුවකට අදාල අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක්ද සභාව ලබා දිය යුතු බවටත් යෝජනා කරන ලදී.

## 2023 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම පිළිබඳ යෝජනාව

**6.1.7** ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2023 වර්ෂයට සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පනවා අය කිරීම පිළිබඳ යෝජනාවයි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (I) වැනි උප වගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක

(අ) ඒ ඉඩමෙහි ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, හෝ

(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක, හෝ

(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවල ඇත්ත වශයෙන් ම යටවී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ ඉඩම ඇති අනුපාතය 3:2 ට වඩා අඩු වන්නේ නම්,

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම මත 2023 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රග්ධන අගයෙන් 2% වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත එකී බද්ද 2023 වර්ෂයේ මාර්තු 31 වැනි දිනට පෙර මතුගම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

## <u>2023 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අය කිරීම පිළිබඳ යෝජනාව</u>

**6.1.8** ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2023 වර්ෂයට ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු පනවා අය කිරීම පිළිබඳ යෝජනාවයි.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126 VII(ඊ) වගන්තියෙන් සභාව වෙත පැවරී ඇති බලතල හා 1952 අංක 6 දරණ සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තියේ විධි විධාන අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අංක 1947/6 – 2015.12.28 දිනැති ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථාවෙන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා පහත දක්වා ඇති උප ලේඛනයේ ගාස්තු 2023 වර්ෂයට පනවා අය කළ යුතු බවට ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අවසර ලබා ගැනීම සඳහා ඉල්ලුම්පතක් සභාවට ඉදිරිපත් කළ යුතුය.

| | | |
|---|---|---|
| 01 | ඉල්ලුම් පතක ගාස්තුව | 200.00 |
| 02 | අනවසර ගාස්තුව (දිනකට) | 250.00 |

**උප ලේඛනය**

| අනු අංකය | පුවරුවේ ස්වභාවය | වර්ග මීටර් ප්‍රමාණය | ගාස්තුව | | |
|---|---|---|---|---|---|
| | | | මාස 03 ට අඩු | මාස 03 හෝ 06 අතර | වසරක් |
| 1 | කිසියම් බිත්තියක් හෝ තාප්පයක් ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | 1 ට අඩු | 250/- | 350/- | 500/- |
| | | 1ට වැඩි | 1 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200.00 බැගින් | | |
| 2 | රෙදි, ඩිජිටල් බැනර් සඳහා | 3 ට අඩු | 250/- | 350/- | 500/- |
| | | 3ට වැඩි | 3 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200.00 බැගින් | | |
| 3 | තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 1 ට අඩු | 500/- | 750/- | 1000/- |
| | | 1ට වැඩි | 1 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300.00 බැගින් | | |
| 4 | විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | 1 ට අඩු | 500/- | 750/- | 1000/- |
| | | 1ට වැඩි | 1 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300.00 බැගින් | | |
| 5 | ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | 1 ට අඩු | 250/- | 350/- | 500/- |
| | | 1ට වැඩි | 1 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300.00 බැගින් | | |
| 6 | ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | 1 ට අඩු | 250/- | 350/- | 500/- |
| | | 1ට වැඩි | 1 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200.00 බැගින් | | |
| 7 | විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 1 ට අඩු | 750/- | 850 | 1000/- |
| | | 1ට වැඩි | 1 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 500.00 බැගින් | | |

**2023 වර්ෂය සඳහා ත්‍රී රෝද රථ නවතා තැබීමේ ස්ථාන සඳහා ගාස්තු අය කිරීම පිළිබඳ යෝජනාව**

**6.1.9** ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2023 වර්ෂයට ත්‍රී රෝද රථ නවතා තැබීමේ ස්ථාන සඳහා ගාස්තු පනවා අය කිරීම පිළිබඳ යෝජනාවයි.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126 VII (ඌ) වගන්තියෙන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1952 අංක 6 දරණ සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තියේ විධි විධාන අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අංක 1947/6 – 2015.12.28 දිනැති ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථාවෙන් සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ත්‍රී රෝද රථ නැවතුම්පලවල නවතා තැබීම සඳහා පහත උප ලේඛනයේ සඳහන් ගාස්තු 2023 වර්ෂයට පනවා අය කල යුතු බවට ගරු සභාවට ගරු

සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සහා සම්මත විය.

**උප ලේඛනය**

| | | |
|---|---|---|
| 1 | ලියාපදිංචි කිරීමේ ගාස්තුව | 200.00 |
| 2 | වාර්ෂික නැවතුම් ගාස්තුව (එකවර ගෙවන විට) | 2000.00 |
| 3 | වාර්ෂික නැවතුම් ගාස්තුව මසකට (මාසිකව ගෙවන විට) | 200.00 |
| 4 | සමිතියක ලියාපදිංචි කළ රථගාල් සඳහා ගාස්තුව | 5000.00 |

**<u>2023 වර්ෂය සඳහා ආදාහනාගාර ගාස්තු අය කිරීම පිළිබඳ යෝජනාව</u>**

**6.1.10** ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2023 වර්ෂයට ආදාහනාගාරය සඳහා ගාස්තු පනවා අය කිරීම පිළිබඳ යෝජනාවයි.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 127 වගන්තිය යටතේ සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1952 අංක 6 දරණ සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තියේ විධි විධාන අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අංක 1947/6 – 2015.12.28 දිනැති ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථාවෙන් සභාව වෙත පැවරී බලතල ප්‍රකාරව මතුගම ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය සඳහා පහත උප ලේඛනයේ සඳහන් අවසර පත්‍ර ගාස්තු 2023 වර්ෂයට අය කළ යුතු බවත් ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සහා සම්මත විය.

| අනු අංකය | ආවරණ කලාපය | මුදල |
|---|---|---|
| 01 | මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල (එක් මෘත ශරීරයක් සඳහා) | 13,000.00 |
| 02 | මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත (එක් මෘත ශරීරයක් සඳහා) | 20,000.00 |

**<u>2023 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන සහතික, සපයනු ලබන සේවාවන් සහ වෙනත් ගාස්තු පැනවීම පිළිබඳ යෝජනාව</u>**

**6.1.11** ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2023 වර්ෂයට නිකුත් කරනු ලබන සහතික, සපයනු ලබන සේවාවන් සහ වෙනත් ගාස්තු පනවා අය කිරීම පිළිබඳ යෝජනාවයි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (XIV) වගන්තියෙන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1952 අංක 6 දරන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තියේ විධි විධාන අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අංක 1947/6-2015.12.28 දිනැති ගැසට් පත්‍රයේ පලකරනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථාවෙන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පහත උප ලේඛනයේ I තීරුවේ සඳහන් සහතිකයන් හෝ සේවාවන් සැපයීම සඳහා එම උප ලේඛනයේ II තීරුවේ ඒ ඒ සහතිකයන් හෝ සේවාවන් සැපයීම වෙනුවෙන් සඳහන් කර ඇති ගාස්තුව 2023 වර්ෂයට පනවා අය කළ යුතු බවත්, එකී සේවාව හෝ සහතිකය ලබා ගන්නා යම් තැනැත්තෙකු විසින් ඒ සේවාව හෝ සහතිකය ලබා ගැනීමට පෙර එම ගාස්තුව මතුගම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවත් ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සංශෝධනයන්ට යටත් ව සභා සම්මත විය.

ඒ අනුව පෞද්ගලික පුහුණුව සඳහා පාසල් දරුවන්ට පැයකට ගාස්තුව රුපියල් 100.00ක් වශයෙන් සංශෝධනය කරන ලදී.

| | I | II |
|---|---|---|
| 1 | **ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම** | |
| | ඉල්ලුම් පත්‍ර ගාස්තුව | 500.00 |
| | අනවසර ගාස්තුව (දිනකට) | 600.00 |
| 2 | **සංචාරක වෙළඳාම් කිරීම** | |
| | අවසර පත්‍ර ගාස්තුව | 1500.00 |
| 3 | **උද්ධෘත නිකුත් කිරීම** | |
| | වරිපනම් ලේඛනවල උද්ධෘතයක් ලබාදීම | |
| | පවත්නා වර්ෂයේ උද්ධෘතයක් ලබාදීම | 500.00 |
| | මුල් අවුරුදු 5 තුළ විස්තර ඇතුළත් උද්ධෘතයක් ලබාදීමට | 750.00 |
| | වරිපනම් දැන්වීමේ උද්ධෘතයක් ලබාදීම | 500.00 |
| | ඕනෑම ගොනුවක හෝ ලේඛනයක උද්ධෘතයක් ලබාදීමට | 250.00 |
| | නිවාස සැලසුම් උද්ධෘතයක් ලබාදීමට | 500.00 |
| 4 | **පෝරම නිකුත් කිරීම** | |
| | පෙර පාසල් අයදුම්පත්‍රයක් සඳහා | 500.00 |
| | පෙර පාසල් ඇතුලත් කිරීමේ ගාස්තු | |
| | එක් වර්ෂයක් සඳහා | 1500.00 |
| | වර්ෂ දෙක සඳහා | 2000.00 |
| | ගොඩනැගිලි අයදුම්පත්‍රයක් සඳහා - නේවාසික | 1000.00 |
| | - වාණිජ | 2000.00 |
| | ඉඩම් අනුබෙදුම් අයදුම්පත්‍රයක් සඳහා | 1000.00 |
| | වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීමේ අයදුම්පත්‍රයක් සඳහා | 1000.00 |
| | අනතුරුදායක ගස් ඉවත් කිරීමේ අයදුම්පත්‍රයක් සඳහා | 3000.00 |

| | | |
|---|---|---|
| 5 | **පුස්තකාල ගාස්තු** | |
| | පුස්තකාල සාමාජික ගාස්තු | 100.00 |
| | සාමාජිකත්වය අළුත් කිරීම | 50.00 |
| | අයදුම්පත් ගාස්තුව | 10.00 |
| | ඇප තැන්පතු ගාස්තුව (බල ප්‍රදේශයෙන් පිටත) පාසල් ළමුන් රජයේ නිලධාරීන් | 500.00 |
| | සේවා ගාස්තු (බල ප්‍රදේශයෙන් පිටත විශේෂ සාමාජික ගාස්තු) | 2000.00 |
| | විශේෂ සාමාජික ගාස්තු අළුත් කිරීම | 200.00 |
| | පුස්තකාල ප්‍රමාද ගාස්තු දිනකට ගාස්තු | 2.00 |

| | | | |
|---|---|---|---|
| 6 | **සහතික නිකුත් කිරීම** | ඉල්ලුම් පත්‍ර ගාස්තුව | සහතිකය සඳහා ගාස්තුව |
| | වීථි රේඛා සහතිකය | 250.00 | 1000.00 |
| | නොපවරා ගැනීමේ සහතිකය | 250.00 | 1000.00 |
| | දේපල හිමිකම් සහතිකය | 250.00 | 1000.00 |

**7 සභාව සතු භූමි කුලියට දීම**

| අනු අංකය | ක්‍රීඩාංගණයේ නම | ගාස්තුව | තැන්පත් මුදල | අතිරේක ගාස්තුව |
|---|---|---|---|---|
| 1 | **යටදොල වත්ත එල්.ජී. ලියනආරච්චි ක්‍රීඩාංගණය** | | | |
| අ | ක්‍රිකට් ක්‍රීඩාංගණය සඳහා දිනකට | | | |
| | බල ප්‍රදේශයේ අනුමත ක්‍රීඩා සමාජ සඳහා | 3000.00 | 3000.00 | |
| | පෞද්ගලික ආයතනවලට | 7500.00 | 4000.00 | |
| | රාජ්‍ය ආයතනවලට | 1500.00 | 2000.00 | |
| | පාසල් සඳහා | 500.00 | 1000.00 | |
| | පැති විකට්ටු සඳහා (දිනකට) | 250.00 | | |
| ආ | I බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය තරඟාවලි සඳහා දිනකට | 2500.00 | 2000.00 | |
| | II බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය තරඟාවලි සඳහා දිවා කාලය පැයකට | 500.00 | | |
| | III පෞද්ගලික පුහුණුව සඳහා පාසල් දරුවන්ට පැයකට | 250.00 | | |
| ඇ | රාත්‍රී සේවය ලබා ගැනීම සඳහා සාමාජිකයින් සඳහා ලියාපදිංචි ගාස්තුව (මාසික) | 1000.00 | - | |
| ඈ | වොලි බෝල් ක්‍රීඩාංගණය සඳහා (දිනකට) | 500.00 | 2500.00 | |
| ඉ | ශරීර සුවතා මධ්‍යස්ථානය සඳහා | | | |
| | ඇතුලත්වීමේ ගාස්තුව | 500.00 | | |
| | මාසික ගාස්තුව පිරිමි | 1000.00 | | |
| | ගැහැණු | 500.00 | | |
| 2 | **මතුගම මහජන ක්‍රීඩාංගණය** | | | |
| අ | ක්‍රීඩා තරඟ සඳහා | | | |
| | පාසල් | 500.00 | 3000.00 | |
| | ක්‍රීඩා සමාජ | 1000.00 | 2000.00 | |
| | පුහුණු කඳවුරු | 2000.00 | 2000.00 | |
| | පුහුණු කඳවුරු (රාජ්‍ය ආයතන) | 1000.00 | 2000.00 | |
| ආ | දේශපාලන රැස්වීම් සඳහා (දිනකට) | 7500.00 | 5000.00 | |
| ඇ | සංගීත සංදර්ශන සඳහා | | | |
| | රාජ්‍ය ආයතන | 5000.00 | 10000.00 | |
| | නොමිලේ පැවැත්වෙන (ටිකට් රහිත) | 10000.00 | 10000.00 | |

| | | | |
|---|---|---|---|
| | ඇ | සංගීත සංදර්ශන | | |
| | | රාජ්‍ය ආයතන (ටිකට් රහිත) | 10000.00 | 10000.00 |
| | | ගාස්තු අයකර (ටිකට් සහිත) | 15000.00 | 10000.00 |
| | ඉ | සැණකෙලි සඳහා දිනකට | | |
| | | රාජ්‍ය ආයතන | 5000.00 | 10000.00 |
| | | වෙනත් | 20000.00 | 20000.00 |
| **3** | | **ශ්‍රවණාගාරය** | | |
| | අ | නාට්‍ය සංගිත සංදර්ශන සඳහා හා, ප්‍රදර්ශන වැඩමුළු | 15000.00 | 3000.00 |
| | ආ | සේල් සඳහා | 25000.00 | 10000.00 |
| | ඇ | සම්මන්ත්‍රණ, දේශන (පුද්ගලික) | 10000.00 | 3000.00 |
| | ඈ | අධ්‍යාපන සම්මන්ත්‍රණ (විදුහල් සඳහා) | 5000.00 | 3000.00 |
| | ඉ | මංගල උත්සව සඳහා | 12000.00 | 3000.00 |
| | ඊ | දේශපාලන රැස්වීම් සඳහා | 10000.00 | 3000.00 |
| | උ | සහන මිල වැඩකරන දිනකට | 4000.00 | 3000.00 |
| | | නිවාඩු දිනකට | 5000.00 | 3000.00 |
| | | ශබ්ද විකාශණ යන්ත්‍ර | 5000.00 | |
| | | ශ්‍රවණාගාර මිදුල (වර්ග අඩියක ප්‍රමාණය දිනකට) | 10.00 | |
| | ඌ | පාසල් ළමුන් ප්‍රවාහනය කරනු ලබන වාහන නවතා | | |
| | එ | තැබීමේ ගාස්තු | | |
| | | පාසල් බස් රථ සඳහා | 500.00 | |
| | | පාසල් වෑන් රථ සඳහා | 300.00 | |
| **4** | | සුසාන භූමි සඳහා ගාස්තු (භූමදානයක් සඳහා) | 250.00 | |
| **5** | | බල ප්‍රදේශයේ ඉඩම් වෙන්දේසිකරුවන් ලියාපදිංචි කිරීම සඳහා එක් වර්ෂයක් සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තුව | 10000.00 | |

## 2023 වර්ෂය සඳහා වාහන හා සත්ත්ව බදු පිළිබඳ යෝජනාව

**6.1.12** ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2023 වර්ෂයට වාහන හා සත්ත්ව බදු පනවා අය කිරීම පිළිබඳ යෝජනාවයි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 හා 148 වන වගන්ති වලින් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2023 වර්ෂයේදී පහත උපලේඛනයෙහි I වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තකුම එහි II වන තීරුවේ සඳහන් අනුප්‍රමාණයක වාහන හා සත්ත්ව බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් එකී වාහන හා සත්ව බද්දට යටත් තැනැත්තකුම විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2023 වර්ෂය සඳහා වන මෙම බද්ද ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ ඒකඟතාවයෙන් ඒකමතික ව සහා සම්මත විය.

**උප ලේඛනය**

| | I වන තීරුව | II වන තීරුව |
|---|---|---|
| (i) | මෝටර් රථයක්, මෝටර් ලොරියක්, මෝටර් ට්‍රයිසිකලයක්, කරත්තයක්, බයිසිකලයක් හෝ ජින් රික්ෂෝවක්, නොවන සෑම වාහනයක් සඳහා | රු. 25.00 |
| (ii) | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා | |
| | (අ) වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් | රු. 18.00 |
| | (ආ) වෙළඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | රු. 04.00 |
| (iii) | සෑම කරත්තයක් සඳහා | රු. 20.00 |
| (iv) | සෑම අත්කරත්තයක් සඳහා | රු. 10.00 |
| (v) | සෑම රික්ෂෝවක් සඳහා | රු. 07.50 |
| (vi) | සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා | රු. 15.00 |
| (vii) | සෑම ඇතෙකුම සඳහා | රු. 50.00 |

(2) විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, විල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

<u>**2023 වර්ෂය සඳහා සංචාරක වෙළඳාම් කිරීම් සඳහා ගාස්තු අය කිරීම පිළිබඳ යෝජනාව**</u>

**6.1.13** ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2023 වර්ෂයට සංචාරක වෙළඳාම් කිරීම් සඳහා ගාස්තු පනවා අය කිරීම පිළිබඳ යෝජනාවයි.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126 (X) වගන්තියෙන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1952 අංක 6 දරණ සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තියේ විධි විධාන අනුව ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජන රජයේ අංක 1947/6 – 2015.12.28 දිනැති ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථාවෙන් සභාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල සංචාරක වෙළඳාම් කිරීම සඳහා අවසර පත්‍ර ගාස්තුව 2023 වර්ෂයට රු. 1500.00 ක් පනවා අය කළ යුතු බව ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**
මේ තක්සේරුව සභාවෙන් දාපු එකක්ද ?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඔව් සභාවෙන් දාලා තියෙන්නේ.තක්සේරු දෙපාර්තමේන්තුවට දාලා මූලිකව ගත්ත ඒවා අපි වාර්ෂිකව සාමාන්‍ය තත්ත්වයෙන් සලකලා කීයක් හරි වැඩි කරලා ආදායම් ලබාගැනීම සඳහා දානවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**
මේ ශ්‍රවණාගාරය බදු දීම වගේ ඒවා තව වැඩි කරත් කමක් නැහැ.අපි හිතමු දාලා තියෙන්නේ රුපියල් 25,000.00 කියලා.ඒක රුපියල් 50,000.00 වුණත් කමක් නැහැ.ඒක කෙනෙක්ගේ පුද්ගලික අවශ්‍යතාවයකට දෙන දෙයක්නේ.ඒ නිසා සාමාන්‍ය ඒවා අඩු කරලා ඒවා වැඩි කරාට කමක් නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
රුපියල් 25,000.00රුපියල් 50,000.00 කරනකොට ඒකේ පහසුකම් වැඩි කරලා අපේ සේවාවන් සපයලා වැඩි කරාට කමක් නැහැ.නැත්නම් මේක කවුරුවත් ගන්න එකක් නැහැ.රුපියල් 50,000.00 වෙද්දි ඊට වඩා හොඳ හෝල් එකක් ගත හැකි වෙන තැනකින්.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
බැඩ්මින්ටන් ක්‍රීඩාංගනය හා සම්බන්ධ ව ගමේ කට්ටියට සහනයක් කරන්න කතා කළා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා**
බැඩ්මින්ටන් ක්‍රීඩාංගනයේ පැය එකක් සෙල්ලම් කලත් රුපියල් 500.00ක් ගන්නවා.මේකට මීට වඩා සාධාරණයක් කළා නම් හොඳයි කියලා මම හිතනවා.මේක තනියම ඇවිත් සෙල්ලම් කරන්න බැනේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඔය ක්‍රීඩා සමාජවලට කියන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා**
නෑ පාසල් ළමුන් පුහුණු වෙනකොට ගාන අඩු කරන්න බැරිද?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඔව්,පාසල් ළමුන්ට අඩුවෙන්න ඕනේ.රුපියල් 250.00යි තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මේකයි සභාපතිතුමා, මේකේ තියෙනවා ගැටලුවක්.අපට පොඩ්ඩක් පැහැදිලි කරන්න ඔය රුපියල් 250.00 පැයකට ද? දවසකට ද?පැය භාගයකට ද?පැයකට එක්කෙනෙක්ගෙන් රුපියල් 250.00 කියන්නේ හතර දෙනෙක් සෙල්ලම් කලොත් රුපියල් 1,000.00ක් වෙනවා.සාමාන්‍ය කෙනෙක් පැය දෙකක් ඇවිත් සෙල්ලම් කලොත් රුපියල් 500.00 වෙනවා.මේ සෙල්ලම් කරන්නේ ජාත්‍යන්තර තරඟ වලට නෙමෙයි.ශරීර සුවතා සඳහා ඇවිත් සෙල්ලම් කරනවා.මේක

සහනයක් සපයලා සංශෝධනය වෙන්න ඕන.දැන් මේකට සාමාන්‍ය මිනිස්සු සෙල්ලම් කරන්න එන්නේ නෑ.ඉහළ පැළැන්තියේ කොටසකට විතරයි සෙල්ලම් කරන්න යන්න පුළුවන්.එදිනෙදා ශරීර සුවතාවය සඳහා යන පිරිසට මේකේ සෙල්ලම් කරන්න වෙන්නේ නෑ.දවස් දහයක් සෙල්ලම් කලොත් රුපියල් හතළිස් දාහක් වෙනවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඒ අයව විශේෂයෙන් හඳුනාගෙන මිළ අඩු කිරීමක් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ඒ අයව විශේෂයෙන් හඳුනාගෙන මිල අඩු කිරීමක් කරන්න කියලා ඉල්ලීමක් කළා.ඒකට කිසිම සහනයක් කළේ නැහැ.මේ මිනිසුන්ගේ ඒ ඉල්ලීමට පමණයි සවන් දෙන්න බැරි වුණේ.මේක මේ කොටසකට විතරයි බැඩ්මින්ටන් කෝඩ් එක තියෙන්නෙත්.සාමාන්‍ය මිනිසුන්ට මේකේ සෙල්ලම් කරන්න වෙන්නේ නැහැ.සහනයක් සපයන්න ඕන මිනිස්සුන්ට සහනයක් සපයන්නේ නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා**
මේ විදිහට කොපමණ කාලයක් වෙනවද දන්නේ නැහැ.මේ දෙන මුදලුත් ලැබෙනවා ද දන්නේ නැහැ.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
අපේ හාමුදුරුවෝ,දෙන මුදලුත් අතේ තියාගෙන ඉන්නවා කියලා කවුද කිව්වා නේද?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ඔව් මේකට උත්තරයක් දෙන්න කොහොමද කරන්න පුළුවන් කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා**
දැන් මේකේ කොපමණ ආදායමක් ලැබිලා ද?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ආදායමක් නැහැ,මේ ගාණ නිසා.මම දැනුවත්ව කවුරුවත් මේකේ සෙල්ලම් කරන්න එන්නේ නැහැ,මේ අධික වියදම නිසා.නිකන් සෙල්ලම් කරන්න දෙන පිරිස විතරයි මේකේ සෙල්ලම් කරන්නේ. මෙච්චර මුදලක් වියදම් කරලා කාටද සෙල්ලම් කරන්න පුළුවන්.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
එහෙනම් මේක අඩු කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඉන්න සමස්ත පිරිසට මේකේ සාධාරණ මුදලක් ගන්න.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
දැන් මේක ගැසට් එකට යන්න ඉස්සෙල්ලා අපි මේක සාකච්ඡා කරලා තීරණයක් ගමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
දැන් පැයකට රුපියල් 500.00 තියෙන්නෙ

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
නෑ.ඒ තරඟාවලියත් තියෙනවා නම් පැයට රුපියල් 500.00යි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මම ප්‍රායෝගිකව දන්න දේ කියන්නේ. උදේ හයට සෙල්ලම් කරන්න යන කොටසක් ඉන්නවා.ඒ අය පැයක් දුවනවා,ඉතිරි පැය ගිහින් සෙල්ලම් කරනවා.ඒ අයගෙනුත් පැයට රුපියල් 500.00ක් ගන්නවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඒ අයව හඳුනාගෙන අපි සභාවෙන් නිරීක්ෂණය කරමු.ඒ කරලා සාමාජිකත්වයක් දීලා ඒ අයගෙන් රුපියල් 100.00ක් හෝ රුපියල් 200.00ක් අය කරගමු. හොඳයි නේද එහෙම?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කාන්ත සිරිවර්ධන මහතා**
හරි පාසල් ළමුන්ට පැයට රුපියල් 100.00ක් කරමු. ලොකු අයට පැයට රුපියල් 200.00ක් එක්කෙනෙක්ගෙන් අය කරමු.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
දැන් එහෙම කසුන් මන්ත්‍රීතුමා කියලා සභාවෙන් ඇවිත් ඉල්ලීම් කරපු කෙනෙක් ඉන්නවා. ඒ අයට අපි දීලා තියෙනවා සෙල්ලම් කරන්න කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**
මේ එන බොහෝ අය ක්‍රීඩා කරන්න එන්නේ රාත්‍රී කාලයේ.අපේ සභාවේ නිලධාරීන් රාත්‍රී කාලයේ ඉන්නවා ද? නැහැනේ?මේ අයව හඳුනාගෙන මාසික ව එකවර අයකර ගැනීමේ ක්‍රමවේදයක් හැදුවානම් හරි.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඒ අයව හඳුනාගෙන සභාවේ ලියාපදිංචි කරලා කාඩ් එකක් වගේ යමක් දීලා මේක කරමු.

මීළඟට මේ සංචාරක වෙළෙඳාම සඳහා අය කරන එක පිළිබඳව සාකච්ඡා කරන්න ඕන.දැන් මාර්ග සංවර්ධන අධිකාරියෙන් පෙට්ටි කඩ විදිහට හදලා මාසිකව ස්ථාවර මුදලක් අරගෙන මග දෙපස ඉන්න අයට දෙන්න හදනවා.එතකොට ඒ අය ඒක ගෙව්වම ප්‍රාදේශීය සභාවට ආපහු ගෙවන්න එපා කියලා තියෙනවා. ප්‍රාදේශීය සභාවට ගෙවන එක වළක්වන්න බැහැ.අපි සංචාරක වෙළඳාම සහ අනෙකුත් පදික වෙළඳාම්වල ඉන්න වෙළෙන්දුන්ගෙන් දෛනික කුලියක් ගන්නවා.ඒගොල්ලො ළඟ බිල් තියාගත්තත් උසාවියට ගියොත් ඒ අයට සහනයක් දෙනවා, ජීවත් වෙන්න කරන වෙළඳාමක් නිසා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කාන්ත සිරිවර්ධන මහතා**
දැන් එතකොට ඒක මාර්ග සංවර්ධන අධිකාරියෙනුත් ගන්නවා ද?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඔව්.අපේ මුදල අපි ගන්න ඕනා.6.1.13 යටතේ මේ දාලා තියෙන්නේ ඒක.රුපියල් 1500.00 ක අවසර පත්‍ර ගාස්තුවක් දෙන්න ඕන වර්ෂයකට.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
මාර්ග සංවර්ධන එකේ අය ඒ මුදල ගන්න එක අපට ප්‍රශ්නයක් නැහැ.අපේ මුදල අපි ගන්න ඕනා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මේක මිනිසුන්ට ඔරොත්තු දෙන ගානක් ගන්න ඕන.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කමිල් කුමාර මහතා**

සමහරක් වෙලාවට නව වරිපනම් බදු පැනවීමේ දී නමක් නැතුව වරිපනම් කොළ එනවා.ඒක පිළිබඳ ව නිලධාරින්ව දැනුවත් කරන්න.ඒක ඒ මනුස්සයාට කරන ලොකු අසාධාරණයක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**

මේ වැත්තෑව ප්‍රදේශයේ වරිපනම් ගෙවපු ගෙදරකටම ආයෙත් ගිහිල්ලා තියෙනවා වරිපනම් එකතු කරන්න. එහෙම සාමාන්‍යයෙන් වැරදීමක් වෙන්න බෑනේ. මෙහේ ඒවා ලැයිස්තුගත වෙලා තියෙන්නෙ එපැයි.

**6.1.14** මතුගම ප්‍රාදේශීය සභාව මඟින් ආරම්භ කිරීමට යෝජිත කෝපිවත්ත සමනල උයන පෙර පාසල සහ තල්ගස්ගොඩ සිහිලැල්තැන්න පෙර පාසල සඳහා ව්‍යාපෘති යෝජනාව ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ගරු සභා අනුමැතියට ඉදිරිපත් කරන ලදී.

<u>තීරණය</u>

මතුගම ප්‍රාදේශීය සභාව මඟින් ආරම්භ කිරීමට යෝජිත කෝපිවත්ත සමනල උයන පෙර පාසල සහ තල්ගස්ගොඩ සිහිලැල්තැන්න පෙර පාසල සඳහා ව්‍යාපෘති යෝජනාව ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ගරු සභා අනුමැතියට ඉදිරිපත් කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ප්‍රියංකා දමයන්ති ගුණවර්ධන මහත්මිය**

පෙර පාසල් ගත්තොත් වලගෙදර කලාපය පිළිබඳ ව කතා කළොත් ගල්මත්ත සහ මීගම ස්ථාපනය කරලා තියෙනවා සභාව මගින් පාලනය වන පෙර පාසල් දෙකක්.අපේ කොට්ඨාශ වන ඉඳිගස්තුඩුව සහ බොන්දුපිටිය කොට්ඨාශ නියෝජනය වන පරිදි ඇත්තට ම සිහිලැල්තැන්න පෙර පාසල් ගොඩනැගිල්ල ලැබිලා තියෙනවා මගේ සහෝදරයා දන්න කියන ව්‍යාපාරිකයෙක් මාර්ගයෙන්.ඒ නිසා මම මේ යෝජනාව දාලා තියෙන්නේ 2018 ජුනි මාසයේ.අඩු ම ගානේ 2020 වර්ෂයේවත් මේක ක්‍රියාත්මක වුණා නම් දැන් මෙතනට අඩු පුටු ටිකක් සහ සෙල්ලම් කරන්න අවශ්‍ය වන උපකරණ ටිකක් තමයි.

දැන් මේ කාලේ කාල සීමාවේ දී මේක ක්‍රියාත්මක කරන්න වුණාම අපට විශාල පිරිවැයක් දරන්න වෙනවා.ඒ නිසා මම යෝජනා කරනවා අපි නාස්තිය අවම කර ගනිමින් තමයි මේ ගමන යන්න ඕන.ඉතින් රටේ අනාගතය තමයි මේ දරු පරපුර කියන්නේ.ගුණගරුක ළමයින් සංවර්ධනය තුළින් තමයි ළමයා සමාජයට මුහුණදෙන හොඳ පුරවැසියෙකු නිර්මාණය කිරීමේ අධ්‍යාපනයක මූලාරම්භය ලැබෙන්නේ.ඒ නිසා මේ ගොඩනැගිලි සඳහා පිරිවැයක් දරන්න ඕන නැති නිසා මේක හැකි ඉක්මනින් ක්‍රියාත්මක කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**

මතුගම ප්‍රදේශයේ බදු ගෙවන අයට තියෙන එකම පෙරපාසල තමයි මේ ප්‍රාදේශීය සභාවේ තියෙන පෙරපාසල. එතකොට මම අතුල මන්ත්‍රීතුමාලගේ ප්‍රදේශය බැලුවා.අපේ ප්‍රදේශය වන ඉද්දගොඩ එක පෙර පාසලක් තියෙනවා.මම පොරොන්දු වුණා ඔවුන්ට තැනක් හදලා ඒක ආරම්භ කරලා දෙනවා කියලා.මේ මුලු සභාවත් පොරොන්දු වුණා.ඒ කාලය තුළ බදු මුදල් ගෙවනවා කියලා තමයි සායනය හැදුවේ ඒ පෙරපාසලත් වැහිලා.

(මන්ත්‍රීවරුන්ගේ ඝෝෂාව නිසා අදහස් පැහැදිලි ව නොඇසේ. )

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

ඇත්තටම ඒක හරි.සභාවේ පෙර පාසලට ලොකු ඉල්ලුමක් තියෙනවා.ප්‍රදේශයේම අවශ්‍යතාවයත් තියෙනවා ඒක ඇත්ත

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා**

දැන් ඇත්තට ම සිහිලැල්තැන්න ගත්තාම ගොඩනැගිල්ලක් ඉදි කරලා තියෙනවා.ඒක ඇත්තටම සභාවේ ප්‍රතිපාදන නෙමේ,වෙනම පරිත්‍යාගයක් තියෙන්නේ.ඒ නිසා ඒකට අලුත්වැඩියා කිරීමක් කරන්න ඕන.මම කණගාටු වෙනවා අපට 2020 ට කලින්වත් මේ වැඩ කටයුතු ආරම්භ කර ගැනීමට නොහැකි වුණා.මොකද අපි ආණ්ඩු පක්ෂයේ ඉඳගෙනත් අපට ඒක කරගන්න බැරි වුණා.ඒ පිළිබඳව කණගාටු වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත කුමාර මහතා**

දරුවෙක් අධ්‍යාපනයේ මුල්ම ආරම්භයේ ම පෙර පාසලටයි යන්නේ.මම හිතන්නේ අද සමාජයේ දරුවන්ට සෙල්ලම් බඩුවක්වත් ගන්න බැරි තරම් ආර්ථික ගැටලු තියෙනවා.මේ වගේ වුණාට පස්සේ අපි පෙර පාසලට දරුවෙක් ඇතුළත් කරනවා.ඇතුලත් කලාට පස්සේ දරුවාගේ මනසට පාසල පිළිබඳ ව ආශාවක් දෙන්න ඕන.

ඒ ආසාව ඇති වෙන්න නම් මල් ටිකක් වවලා, ලස්සනට බුදු ගේ හදලා දරුවාගේ ආධ්‍යාත්මික පැත්ත සහ දරුවාගේ මනස ආකල්පවලින් ආලෝකමත් වන පරිසරයක් හදන්න ඕනා.එ නිසා මම දැක්කා අපේ පෙර පාසලේ පාටත් පිච්චිලා.දරුවන්ගේ සමහර ඩෙස් බංකුවලත් පාට නැහැ.මේවා පොඩ්ඩක් හොයලා බලලා අපි දෙන අදහස් ක්‍රියාවට නංවන්න ඕන.එතකොට මේ හැම පෙර පාසලක් ම ඇති කළා වගේම ඒවාට අවශ්‍ය සියලු ම පහසුකම් ටික සපුරලා තමයි මේ පෙර පාසල් හදන්න ඕන.එනිසා අපේ ප්‍රදේශයේ මේ තියන ගැටළුව විසඳා දෙන්න කියන එක මේ අවස්ථාවේ කාරුණික ව ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් ජයවර්ධන මහතා**

පෙර පාසල් හැදෙන එක හොඳයි.නමුත් අලුතින් පෙර පාසල් හැදෙන්න කලින් තියෙන පෙර පාසල්වල අවශ්‍ය පහසුකම් ටික සපුරන්න කියන එක ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.අපේ ප්‍රදේශයේ පෙර පාසල් ගත්තාම ඩෙස්,පුටු පවා නැහැ.ඒ නිසා කරුණාකරලා ඒ ටික සකසා දෙන්න කියලා ඉල්ලනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

ඇත්තටම පෙර පාසල් අලුතින් හැදෙන්න ඕන.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් ජයවර්ධන මහතා කිව්වා වගේ කොස්ගහකන්ද පෙරපාසලේ අඩුපාඩු කියන එක පටන් ගත්ත දවසේ දවසේ ඉඳන්ම ඉවරයක් නැහැ.මුලින්ම වැට ගහන්න ගියා.බොහොම අමාරුවෙන් තමයි දැනටත් ඔය තියෙන ටිකත් හදාගත්තේ.දැනටත් සින්ක් එකක් නැහැ.දරුවන්ට වතුර ටිකක් ගන්න ක්‍රමයක් නැහැ අඩුපාඩු කීපයක් ම තියෙනවා.අලුතින් කෝපිවත්තටයි හැම තැනට ම පෙර පාසල් හදන්න.නමුත් මේ හදලා තියෙන ඒවගේ තියෙන අඩුපාඩු මුලින්ම හදලා දෙන්න කියන ඉල්ලීම කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී චමිලානි රුවන්දි ත්‍රිමාන්න මහත්මිය**

පෙර පාසල් සම්බන්ධ යෝජනාව කතා කළොත් ඇත්තටම ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් ජයවර්ධන මහතා කිව්වා වගේම අලුතින් පෙර පාසල් ආරම්භ කිරීම හොඳයි.තඹරැටිය ප්‍රජා ප්‍රජා ශාලා භූමියට අයිති ප්‍රජා ශාලා ගොඩනැගිල්ල තමයි පෙරපාසල විදිහට අපේ සභාවෙන් අරන් තියෙන්නේ.ඒක ගමේ මිනිස්සුන්ට හදලා දුන්න ප්‍රජාශාලාව.ඒක අපි පෙර පාසල විදිහට පාවිච්චි කරනවා.ඒක නිසා මම දෙවන යෝජනාව විදිහට දැම්මා ගම්වාසීන්ට ඒ බිම් ප්‍රමාණයේ

ප්‍රජා ශාලාවක් ඉදි කරලා දෙන්න,එහෙම නැතිනම් අලුතෙන් පෙරපාසලක් ඉදි කරලා දෙන්න කියලා.ගරු සභාපතිතුමා ඒක නිසා මේ පිළිබඳව අවධානය යොමු කරන්න.තඹරටියේ ප්‍රදේශවාසීන් ලොකු චෝදනාවක් කරනවා මේකට.ඒ මිනිසුන්ට අයිති ප්‍රජා ප්‍රජාශාලාව තමයි අපි පෙර පාසල විදිහට භාවිත කරන්නේ.මේ වෙනකොට ඒ ගොඩනැගිල්ලත් දිරාපත් වෙලා වටේ ගහලා තියෙන දැල් ටික දිරාපත් වෙලා,ළමයින්ගේ ආරක්ෂාව නැතුව ගිහිල්ලා.අද වෙනකොට පෙරපාසලට ඒක භාවිත කරන්නත් බැහැ.අළුත්වැඩියා නොකර ප්‍රජා ශාලාවට භාවිත කරන්නත් බැහැ.එ නිසා මේ යෝජනාව නැවත වතාවක් මතක් කර සිටිනවා.තඹරටියට අලුතින් පෙර පාසලක් හදලා දෙන්න සහ තියෙන ගොඩනැගිල්ල අලුත්වැඩියා කරලා ප්‍රජා ශාලාව නැවත ගම්වාසීන්ට ලබා දෙන්න කියන ඉල්ලීම කරනවා.

**6.1.15** මතුගම ප්‍රාදේශීය සභාවේ මතුගම ආයුර්වේද සායනය මූලික කර ගනිමින් ආරම්භ කිරීමට යෝජිත ආයුර්වේද විශේෂ ප්‍රතිකාර මධ්‍යස්ථානය සඳහා ව්‍යාපෘති යෝජනාව ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ගරු සභා අනුමැතියට ඉදිරිපත් කරන ලදී.

<u>තීරණය</u>

මතුගම ප්‍රාදේශීය සභාවේ මතුගම ආයුර්වේද සායනය මූලික කර ගනිමින් ආරම්භ කිරීමට යෝජිත ආයුර්වේද විශේෂ ප්‍රතිකාර මධ්‍යස්ථානය සඳහා ව්‍යාපෘති යෝජනාව ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ගරු සභා අනුමැතියට ඉදිරිපත් කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**6.1.16** ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන - 2021 යටතේ ව්‍යාපෘති අංක LA/03/21/CC/396 ට අදාලව දූවවත්ත මාර්ගය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ අතරුදවුම් රහිතව ග්‍රාමීය මාර්ග අමාත්‍යාංශයෙන් රු.17,822,96.39 ඒවා ඇත.එම මුදල ලෙව්වන්දුව එක්සත් ප්‍රජා මණ්ඩලය වෙත ගෙවීමට ගරු සභා අනුමැතියට ඉදිරිපත් කරන ලදී.

<u>තීරණය</u>

ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන - 2021 යටතේ ව්‍යාපෘති අංක LA/03/21/CC/396 ට අදාලව දූවවත්ත මාර්ගය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ අතරුදවුම් රහිතව ග්‍රාමීය මාර්ග අමාත්‍යාංශයෙන් රු.17,822,96.39 ඒවා ඇත.එම මුදල ලෙව්වන්දුව එක්සත් ප්‍රජා මණ්ඩලය වෙත ගෙවීමට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ගරු සභා අනුමැතියට ඉදිරිපත් කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**6.1.17** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2264/18 හා 2022/01/27 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත ඇ කාණ්ඩයට අයත් පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු සංශෝධන ගරු මහා සභාවේ අනුමැතියට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

<u>තීරණය</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2264/18 හා 2022/01/27 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත ඇ කාණ්ඩයට අයත් පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු සංශෝධන ගරු මහා

සභාවේ අනුමැතියට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**6.1.18** මතුගම පොදු වෙළඳපොළ කඩ අංක 74 කඩ කාමරයේ වත්මන් බදුකරු වන ඊ.ඒ මොනිකා නිලන්ති මහත්මිය විසින් ඊ.ඒ ඉරෝෂිකා නිලන්ති යන අයට ලේඛණගත අයිතිය සංශෝධනය කර දෙන මෙන් ඉල්ලීමක් කර ඇත.ඒ අනුව ආදායම් පරීක්ෂක වාර්තාව හා අංක LGD/13/2016 (1) දරණ 2020.12.03 දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛ පරිදි මතුගම පොදු වෙළඳපොළ කඩ අංක 74 කඩ කාමරයෙහි ලේඛණගත අයිතිය ඊ.ඒ ඉරෝෂිකා නිලන්ති මහත්මියගේ නමට සංශෝධනය කිරීම සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් යෝජනා කරන ලදී.

<u>තීරණය</u>

මතුගම පොදු වෙළඳපොළ කඩ අංක 74 කඩ කාමරයේ වත්මන් බදුකරු වන ඊ.ඒ මොනිකා නිලන්ති මහත්මිය විසින් ඊ.ඒ ඉරෝෂිකා නිලන්ති යන අයට ලේඛණගත අයිතිය සංශෝධනය කර දෙන මෙන් ඉල්ලීමක් කර ඇත.ඒ අනුව ආදායම් පරීක්ෂක වාර්තාව හා අංක LGD/13/2016 (1) දරණ 2020.12.03 දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛ පරිදි මතුගම පොදු වෙළඳපොළ කඩ අංක 74 කඩ කාමරයෙහි ලේඛණගත අයිතිය ඊ.ඒ ඉරෝෂිකා නිලන්ති මහත්මියගේ නමට සංශෝධනය කිරීම සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**6.1.19** මතුගම පොදු වෙළඳපොළ කඩ අංක 56 කඩ කාමරයේ වත්මන් බදුකරු වන ඉන්ද්‍රවතී මල්ලිකාරච්චි මහත්මිය විසින් උළුවඩුගේ දීපාල් යන අයට ලේඛණගත අයිතිය සංශෝධනය කර දෙන මෙන් ඉල්ලීමක් කර ඇත.ඒ අනුව ආදායම් පරීක්ෂක වාර්තාව හා අංක LGD/13/2016 (1) දරණ 2020.12.03 දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛ පරිදි මතුගම පොදු වෙළඳපොළ කඩ අංක 56 කඩ කාමරයෙහි ලේඛණගත අයිතිය උළුවඩුගේ දීපාල් මහතාගේ නමට සංශෝධනය කිරීම සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ගරු සභාවට යෝජනා කරන ලදී.

<u>තීරණය</u>

මතුගම පොදු වෙළඳපොළ කඩ අංක 56 කඩ කාමරයේ වත්මන් බදුකරු වන ඉන්ද්‍රවතී මල්ලිකාරච්චි මහත්මිය විසින් උළුවඩුගේ දීපාල් යන අයට ලේඛණගත අයිතිය සංශෝධනය කර දෙන මෙන් ඉල්ලීමක් කර ඇත.ඒ අනුව ආදායම් පරීක්ෂක වාර්තාව හා අංක LGD/13/2016 (1) දරණ 2020.12.03 දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛ පරිදි මතුගම පොදු වෙළඳපොළ කඩ අංක 56 කඩ කාමරයෙහි ලේඛණගත අයිතිය උළුවඩුගේ දීපාල් මහතාගේ නමට සංශෝධනය කිරීම සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ගරු සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**6.1.20** ගල්මත්ත නයනසිරි ජයසිංහ වෙළඳ සංකීර්ණයෙහි අංක 14 කඩකාමරය වත්මන් බදුකරු වන වැලිතරගේ ප්‍රේමරත්න මහතා මිය ගොස් ඇති බැවින් ඔහුගේ උරුමක්කාරයන් වන වැලිතරගේ දිල්සිකා සෙව්වන්දි යන අයගේ නමින් බදු අයිතිය සංශෝධනය කර දෙන මෙන් ඉල්ලීමක් කර ඇත.ඇයගේ

සහෝදරිය වන වැලිතරගේ ආශිකා ලක්මාලි යන අයගේ විරෝධතාවයක් නොමැති බවට ලිඛිතව පවසා ඇති බැවින් ආදායම් පරීක්ෂක වාර්තාව හා අංක LGD/13/2016 (1) දරණ 2020.12.03 දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛ පරිදි ගල්මත්ත නයනසිරි ජයසිංහ වෙළඳ සංකීර්ණයෙහි අංක 14 කඩකාමරයෙහි ලේඛණගත අයිතිය වැලිතරගේ දිල්සිකා සෙව්වන්දි මියගේ නමට සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය මහ සභා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් යෝජනා කරන ලදී.

<u>තීරණය</u>

ගල්මත්ත නයනසිරි ජයසිංහ වෙළඳ සංකීර්ණයෙහි අංක 14 කඩකාමරය වත්මන් බදුකරු වන වැලිතරගේ ප්‍රේමරත්න මහතා මිය ගොස් ඇති බැවින් ඔහුගේ උරුමක්කාරයන් වන වැලිතරගේ දිල්සිකා සෙව්වන්දි යන අයගේ නමින් බදු අයිතිය සංශෝධනය කර දෙන මෙන් ඉල්ලීමක් කර ඇත.ඇයගේ සහෝදරිය වන වැලිතරගේ ආශිකා ලක්මාලි යන අයගේ විරෝධතාවයක් නොමැති බවට ලිඛිතව පවසා ඇති බැවින් ආදායම් පරීක්ෂක වාර්තාව හා අංක LGD/13/2016 (1) දරණ 2020.12.03 දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛ පරිදි ගල්මත්ත නයනසිරි ජයසිංහ වෙළඳ සංකීර්ණයෙහි අංක 14 කඩකාමරයෙහි ලේඛණගත අයිතිය වැලිතරගේ දිල්සිකා සෙව්වන්දි මියගේ නමට සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය මහ සභා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**

මේවාට කීයක් හරි අය කරනවද ?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

මාස 60 ක කුලිය අය කරනවා.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**

යෝජනා දාද්දි ඒකත් දාන්න.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

චක්‍රලේඛනය පරිදි කියලා දාලා තියෙන්නේ ඒකයි.

**6.1.21** ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන අමාත්‍යංශයේ ප්‍රතිපාදන යටතේ මතුගම ක්‍රීඩාංගනයේ වොලිබෝල් ක්‍රීඩා පිටිය සැකසීම වෙනුවෙන් ලැබී ඇති අවසාන ගෙවීම් මුදල වන රු.1323000.00ක් ඉසුරු ගොවි සංවිධානය,ඉද්දගොඩ වෙත ගෙවීමට ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් යෝජනා කරන ලදී.

<u>තීරණය</u>

ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන අමාත්‍යංශයේ ප්‍රතිපාදන යටතේ මතුගම ක්‍රීඩාංගනයේ වොලිබෝල් ක්‍රීඩා පිටිය සැකසීම වෙනුවෙන් ලැබී ඇති අවසාන ගෙවීම් මුදල වන රු.1323000.00ක් ඉසුරු ගොවි සංවිධානය,ඉද්දගොඩ වෙත ගෙවීමට ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව පිළිගත නොහැකි බව ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා විසින් පවසන ලදින් මේ සඳහා විධිමත් පරීක්ෂණයක් ඉල්ලා සිටින ලදී.

**6.1.22** මතුගම ශ්‍රවණාගාර භූමිය අසළ ළමා උද්‍යානයට යාබද ස්මාරක ඉදිකර ඇති ස්ථානයේ පස්දුන් රට රණවිරු අනුස්මරණ ස්මාරකයක් ඉදි කිරීමට සුදුසු බවට ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් යෝජනා කරන ලදී.

<u>තීරණය</u>

මතුගම ශ්‍රවණාගාර භූමිය අසළ ළමා උද්‍යානයට යාබද ස්මාරක ඉදිකර ඇති ස්ථානයේ පස්දුන් රට රණවිරු අනුස්මරණ ස්මාරකයක් ඉදි කිරීමට සුදුසු බවට ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**6.1.23** මතුගම ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ සෞඛ්‍ය අංශයේ සේවය කරන ඩී.ඥානසිරි මහතා 2022.12.01 දින සිට විශ්‍රාම යාමට නියමිත ය.ඔහු යටදොළවත්ත උප කාර්යාලයේ ආදේශක මාර්ග කම්කරු තනතුරක 1997.01.01 දින සිට සේවය කර ඇත. 1999.11.01 දින සිට ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත සෞඛ්‍ය කම්කරු පත්වීම ලබා ඇත.

ආදේශක සේවා කාලය තුළ ඔහුගේ වැටුපෙන් අයකරන ලද සේවක අර්ථ සාධක අරමුදලේ 60% ප්‍රතිශත මුදල වන රු.22488.99 ක මුදලක් 2002.09.23 වන දින ලදුපත් අංක 21356 මගින් සභාවේ තැන්පත් කර ඇත. මෙම මුදල ගිණුමෙන් ආපසු ලබාගෙන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යවා ආදේශක කාලය විශ්‍රාම වැටුප් සහිත සේවා කාලයට එකතු කර ගැනීමේ කටයුතු සඳහා රු.22488.99 ක මුදල ආපසු ලබා ගැනීමට සහා අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ගරු සභාවට යෝජනා කරන ලදී.

<u>තීරණය</u>

මතුගම ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ සෞඛ්‍ය අංශයේ සේවය කරන ඩී.ඥානසිරි මහතා 2022.12.01 දින සිට විශ්‍රාම යාමට නියමිත ය.ඔහු යටදොළවත්ත උප කාර්යාලයේ ආදේශක මාර්ග කම්කරු තනතුරක 1997.01.01 දින සිට සේවය කර ඇත. 1999.11.01 දින සිට ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත සෞඛ්‍ය කම්කරු පත්වීම ලබා ඇත.

ආදේශක සේවා කාලය තුළ ඔහුගේ වැටුපෙන් අයකරන ලද සේවක අර්ථ සාධක අරමුදලේ 60% ප්‍රතිශත මුදල වන රු.22488.99 ක මුදලක් 2002.09.23 වන දින ලදුපත් අංක 21356 මගින් සභාවේ තැන්පත් කර ඇත. මෙම මුදල ගිණුමෙන් ආපසු ලබාගෙන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යවා ආදේශක කාලය විශ්‍රාම වැටුප් සහිත සේවා කාලයට එකතු කර ගැනීමේ කටයුතු සඳහ රු.22488.99 ක මුදල ආපසු ලබා ගැනීමට සහා අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ගරු සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**6.1.24** 2022.08.09 දින පැවති මහ සභාවට ඉදිරිපත් කරන ලද පහත සඳහන් ගෙවීම් සභාවේ අනුමැතිය සඳහා ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

| වවුචර් අංකය | දිනය | ගෙවීම් ලබන්නාගේ නම | විස්තරය | මුදල | ශත |
|---|---|---|---|---|---|
| 03 | 2022.06.07 | ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන කිරීමේ සංස්ථාව | යෝජිත රථ වාහන නැවතුම් පොළ ඉඩමේ ඇළ මාර්ග කාණු පද්ධති සකස් කර ගැනීම සඳහා අදාළ සැලසුම් සකස් කිරීමට ක්ෂේත්‍ර පරීක්ෂණය වෙනුවෙන් අත්තිකාරම් ගෙවීම. | 500000 | 00 |
| 104 | 2022.06.22 | සෙනොක් ට්‍රේඩ් කම්බයින් | 2A-04621 JCB යන්ත්‍රය සේවා කිරීමට 2022.04.30 | 157588 | 20 |
| 105 | 2022.06.22 | සෙෂ් එයාර් ඔටෝ ඒ/සී | 53-4621 කැබ් රථයේ A/C පද්ධතිය සෑදීම. | 33700 | 00 |
| 110 | 2022.06.28 | සිරිජය කොන්ක්‍රීට් වර්ක්ස් | හියුම් බට 03ක් මිළට ගැනීම.<br>(කොස්වත්ත ගොඩ මාර්ගය හා සුදර්ශන මාවත සම්බන්ධ වන ස්ථානය සඳහා) | 16500 | 00 |
| 112 | 2022.06.29 | ටොයෝටා ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | PF-6914 කැබ් රථය සඳහා අමතර උපාංග යෙදීම හා පින්තාරු කිරීම.<br>2022.02.24 | 510726 | 85 |

2022.08.09 දින පැවති ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් මහ සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් ගෙවීම් එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

6.1.24 යටතේ ඉදිරිපත් කර ඇති ඔබතුමා ගෙවීම් කරලා තියෙන යෝජනාව සම්බන්ධයෙන් මේ සභාවේ මන්ත්‍රීවරු අවධානය යොමු කරන්න ඕන.මේ මන්ත්‍රීවරු එක්කෝ මේකට කැමති වෙන්න ඕන, නැතිනම් විරුද්ධ වෙන්න ඕන.අවස්ථා ගණනාවක දීම මේ සම්බන්ධයෙන් අපි විමසීම් කලා.

(මන්ත්‍රීවරුන්ගේ ඝෝෂාව හේතුවෙන් කතා කරන දේ පැහැදිලි ව ඇහෙන්නේ නැත.)

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
මේක ගෙවලා ඉවරයි මන්ත්‍රීතුමා.
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
ගෙවලා තියෙන්නේ සභාවේ විරුද්ධත්වය මත.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මේකට ඔබතුමා පරීක්ෂණයක් ඉල්ලුවා කියන එක අපි දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළා.ඊට තියෙන්නේ ටොයෝටා ලංකා එකට ගෙවපු රුපියල් 510726.85හි රුපියල් 10 000.00ක් වැඩි වෙලා තියෙනවා කියන එක.ඒක සඳහන් කරලා තියෙනවා.රුපියල් ලක්ෂ 500 000.00ක් ගෙවන්න පුළුවන්.රුපියල් 10 000.00ක් ගෙවන්න බෑ කියන එක මේ කියන්නේ.මේක පරණ බෆර් එක මාරු කරන එක කරලා තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
අපි මේකට විරුද්ධ වුණේ හේතුවක් මත.කැබ් රථය පින්තාරු කරන්න ලක්ෂ පහයි ගාණක් ගිහිල්ලා.මේ පිළිබඳ ව කලින් සභාව දැනුවත් කරන්න තිබුණා.මුලින් ආපු වැඩේ තිබුණේ ලක්ෂ 5යි ගාණ කැබ් රථය පින්තාරු කිරීම කියලා පමණ යි.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
නෑ ඒක තමයි අපි මේ දැන් සභාව දැනුවත් කරන්නේ.මේක කලින් සාකච්ඡා කළේ නැහැ.මේ අතිරික්ත න්‍යාය පත්‍රයේ තියෙන ටික සාකච්ඡා කරන්නේ.ඒක අනුමත වුණේ නෑ තාම.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
"කාගේ නිර්දේශය අරගෙන ද මේ කටයුත්ත කළේ?"ආදී වශයෙන් කරුණු රාශියක් මතු වුණා.

(මන්ත්‍රීවරුන්ගේ ඝෝෂාව නිසා අදහස් පැහැදිලි ව නොඇසේ.)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
මීට පෙර සභාවේ දී තිබුණේ තීන්ත පින්තාරු කිරීම සම්බන්ධයෙන් පමණයි.හැබැයි දැන් මේකට එකතු කරලා තියෙනවා තවත් කාරණා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
නෑ නෑ.මේ මුදල පන්ලක්ෂ දහදාහ වෙනස් වුණේ නෑ.මුල ඉඳලාම තියෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
නෑ.මේ මුදල හදාගන්න ඕන නිසා සීමාවට හරියන්න, සාධාරණීයකරණය කරන්න "අමතර උපාංග යෙදුවා"කියලා දාලා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා.**
නැහැ කම්පැනියෙන් මුලින් ආපු ඇස්තමේන්තුව මුල ඉඳලාම තියෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
මුලින් ආපු වැඩේ තිබුණේ තීන්ත ටික ගාපු එක විතරයි

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඒක ඒ වෙලාවේත් තිබුණා.බෆර් එකත් ඇතුළත්ව තමයි තිබුණේ.වෙනස් කිරීම් කරලා නැහැ.කෙටි අත්සන් තියෙනවා,කමිටුවේ සෑම ගෙවීම් වතාවකම.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා**
ගාණ නෙමෙයි.මුලින් තිබුණේ පින්තාරු කිරීම පමණයි.ඒ ගාණට හරියන්න අමතර උපාංග දාලා.

(මන්ත්‍රීවරුන්ගේ සෝෂාව නිසා අදහස් පැහැදිලි ව නොඇසේ.)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
නැහැ සභාව සම්මත කරනවා නම් මට ගැටළුවක් නැහැ.මම කරන්නේ පැහැදිලි කිරීමක්.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මම සභාව දැනුවත් කරන්නේ මේකට විරුද්ධ වෙන්න එපා.මේකේ වංචාවක් තියෙනවා නම් අපි ඒකට වගකියන්න ඕන.වංචාවක් නැනේ.

(මන්ත්‍රීවරුන්ගේ සෝෂාව නිසා අදහස් පැහැදිලි ව නොඇසේ.)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
සභාවේ ගෙවන්න එපා කියලා සම්මත කරලා තියෙද්දී ඇයි මේක ගෙව්වේ?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**
විරුද්ධ වුණත් ගෙවලා ඉවර කරලා තියෙන්නේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මුදල් කමිටුවකට යටත් කරලා ගෙව්වේ.මේක දැම්මේ ගෙවීම් අනුමත කරන්න.මේක අවබෝධ කරගෙන මේකේ ගැටලුවක් නැත්නම් කවුරුවත් විරුද්ධ වෙන්න එපා.ඊට පස්සේ ඉදිරියට පොඩි ගෙවීමක්වත් කරන්න බැරි වෙනවා.

(මන්ත්‍රීවරුන්ගේ සෝෂාව නිසා අදහස් පැහැදිලි ව නොඇසේ).

මීළඟට නැබඩ පාරේ අපි පවර ගත්ත ඉඩම පිළිබඳ ව කතා කරන්න තියෙනවා.මේ ඉඩම දැන් අපට අක්කර තුනක් ලැබිලා තියෙනවා.අක්කර දෙකක් ඉඩම් හිමියාට දීලා තියෙනවා.මේ ඉඩමට තමයි අපි ඉඩම් ගොඩකිරීමේ සංස්ථාවෙන් අවසරය  අරගෙන තියෙන්නේ.ඇළ කපලා ශුද්ද පවිත්‍ර කරන්න ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් අවසරය අරගෙන තියෙන්නේ.දැන් මේ වර්ෂය තුළ අපි මුදලක් වෙන්කරලා රථ වාහන වාහන නැවතුම්පොළේ ඇළ මාර්ග කාණු පද්ධති සකස් කර ගන්න තියෙනවා.

ඒ අදාළ සැලසුම් සකස් කිරීමට ක්ෂේත්‍ර පරීක්ෂණය වෙනුවෙන් අත්තිකාරම් ගෙවීම කරලා තියෙනවා. එතකොට මේකට අපි ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරලා තියෙනවා.ලක්ෂ 50ක් ඇස්තමේන්තුවේ තියෙනවා.මේකේ සයිට් එකේ වැඩ කරන්න ලක්ෂ විස්සක් යනවා.මේක දල ඇස්තමේන්තුවක්. විධිමත් ඇස්තමේන්තුවක් අපි අනුමත කරගන්න ඕන. අපි හදන ඇස්තමේන්තු කළුතර අනුමත වෙන්න ඕන.එතකොට විධිමත් ව මැනීම් කරන්න ලක්ෂ දහයක් දාලා තියෙනවා.පස පිළිබඳ පරීක්ෂණ කරන්න ලක්ෂ විස්සක් දාලා තියෙනවා.

එතකොට නැබඩ පාරේ මූලික ව සුවසෙවණට එහා පැත්තේ ටිකයි පැස්කුවල් මාවත පැත්තේ ටිකයි කිසිම ගැටලුවක් නැතුව ඔප්පු ලියලා තියෙනවා.අපට අනිත් ඉඩම් ටික තාම ලියන්න ආවේ නැහැ.ඒ අය එකඟ වෙලා තියෙනවා.අපි උත්සාහ කරනවා ඒ අයගේ ඉඩමක් ලෙස සංවර්ධනය කර ගන්න.ඉඩම් ගොඩකිරීමේ අමාත්‍යාංශයෙන් ඇවිත් කිව්වේ මේ ඉඩම් අපි සංවර්ධනය කර නොගත්තොත් ඒවා රක්ෂිත ප්‍රදේශය හැටියට ගැසට් කරනවා කියන එක.අපට අනිත් එහා තියෙන ඉඩම් ටික ලියලා තියෙන්නේ.

(මන්ත්‍රීවරුන්ගේ ඝෝෂාව නිසා අදහස් පැහැදිලි ව නොඇසේ )

අපි ගිවිසුම්ගත වෙලා තියෙනවා යම්කිසි කෙටි කාලයක් තුළ මේක ඉවරයක් කරන්න.අපිට තුනෙන් දෙකක පමණ ප්‍රමාණයකි නිකන් දුන්න නිසා අපි ඒ ඉඩම් හිමියන්ගේ තුනෙන් එකක පමණ ප්‍රමාණයක් ගොඩ කරලා දෙන්න ඕන.මේ ඉඩම් ටික එක තීරුවකින් දුන්නේ.

(මන්ත්‍රීවරුන්ගේ ඝෝෂාව නිසා අදහස් පැහැදිලි ව නොඇසේ )

ඒක කරන එක සාධාරණයි.ඒගොල්ලෝ ඉල්ලන්න ආවොත් මේ ඉඩම සභාවට නැති වෙනවා.ඒ නිසා මේකට ඉක්මනින් කටයුතු කරනවා.අපි මේ සභාව තුළ යෝජනාවක් අරගෙන තියෙනවා,මේ නගරයේ ඉන්න අවතැන් වුණු පේමන්ට් වෙළෙන්දෝ ටිකකට මේකේ ලැලි ගහලා කඩ ටිකක් හදන්න.නව වෙළඳපොළක් හදන්න මුලින්ම ඕනකම තියෙනවා.නැත්නම් මේකට මිනිස්සු යන්නේ නෑ.ඊට පස්සේ නාගරික සංවර්ධන අධිකාරිය පැත්තෙන් යෝජනාවක් එවලා තියෙනවා,මේකේ මැද පන්සලට එහා පැත්තෙන් හොඳ ආපනශාලාවකට වගේ වෙන් කරන්න කියන එක.ඊළඟට සතොස බිල්ඩින් එකක් අපි හදලා දුන්නොත් පාරිභෝගිකයන්ට හොඳයි.ඒවා මේ සැලසුමට නැහැ.

මේ ඉඩම සංවර්ධනය කරලා නව නගරයේ ඉන්න පදික වෙළඳුන්ට,ස්වයං රැකියා කරන අයට සහ සියලුම අයට ඔබතුමාලගේ නිර්දේශය යටතේ මේක ගන්න දෙන්නම්.ඒකයි අපේ මුල් සැලසුම.මේක ලක්ෂ 50ට දළ ඇස්තමේන්තුව තියෙන්නේ.විධිමත් ඇස්තමේන්තුවක් හදනවා.මේ පස් පුරවන ඒවා අපේ යන්ත්‍රසූත්‍ර යොදලා කරන්න පුළුවන්.මුළු ඉඩම ම ගොඩ කරන්න අපට බැරි වෙයි.මේකට සභාව පැත්තෙන් කළ යුතු දෙයක් තියෙනවා නම් කරන්නම්.මේකට මම හිතනවා ඔබතුමාලා විරුද්ධ වෙන එකක් නෑ කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**
අපි ගොඩ කරන්න හදන ස්ථානයේ අඩි තුනකට වැඩිය මම හිතන්නේ තියෙන්නේ වැලි.සම්පූර්ණම වැලි සහිත බිමක් ඔය තියෙන්නේ.මේක ගොඩ කරන්න කලින් ඒ වැලි ටික ඉවත් කර ගත්තොත් අපේ ඉදිකිරීම් සඳහා මේ වැලි ටික පාවිච්චියට ගන්න පුළුවන්.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
අපි ඒ සඳහා පරිසර අනුමැතියත් අරගෙන ඉල්ලීමක් කරන්නම්.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
ගැටලුව තමයි,ප්ලෑන් එක අඳින්නේ නැතුව අපිට මේක ඕන කියලා මේක ගොඩ කරලා අර අය බෑ කිව්වොත් ප්‍රශ්නයක්.එනිසා පළමුව ගිවිසුම් ගත විය යුතුයි.

ගිවිසුම් ගත වෙලා මේකේ සැලැස්මක් ඇඳලා ඒ අයට එන බිම් ප්‍රමාණය පෙන්වන්න. නැතිනම් අපි ගොඩ කළාම ඒ අය කිව්වොත් අපිට මේක ඕනේ කියලා,මේක නිකන් දෙන්න වෙනවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
කවුද ඉඩම් හිමියෝ ද?

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
ඔව්

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
නැහැ.ගොඩ කරන්න ඕන ටික ඒ අයට මායිම් කරලා සැලැස්මක් ඇඳලා තියෙනවා.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
මායිම් කරන ටිකේ සැලැස්මක් තාම ඇඳලා නැනේ?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
සැලැස්මක් ඇඳලා තියෙන්නේ.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
ඉතින් අපි කිසි කෙනෙක් දන්නේ නැනේ ප්ලෑන් එක ඇඳලද නැද්ද කියලා.මේක ඇඳලා අපට ඒ ටික කොපමණද ඒ අයට එන ටික කොපමණද කියලා පෙන්නන්න ඕනනේ.

(ප්ලෑන් එක පරීක්ෂා කිරීමෙන් අනතුරු ව සභාවේ සිටි සියලු මන්ත්‍රීවරුන්ට ඇසෙන පරිදි ඒ පිළිබඳ ව ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා පැහැදිලි කරන ලදී.මන්ත්‍රීවරුන්ගේ ඝෝෂාව නිසා ඒ පිළිබඳ ව අදහස් පැහැදිලි නැත.)

**6.1.25** නාගරික සංවර්ධන අධිකාරිය,කළුතර දිස්ත්‍රික් කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ(සැලසුම්)ගේ අංක 05/05/10/03/02/04/-Gen-2019 හා 2022.08.22 දිනැති ලිපිය මඟින්,නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජෙනරාල් විසින් නිකුත් කරන ලද අංක DDG/P2/PC/LA හා 2022 මැයි මස 26 වන දින ලිපියෙන් දන්වා ඇති පරිදි,ප්‍රාදේශීය සභා සඳහා සැලසුම් කමිටු දීමනාව රු.1500.00 සිට රු.2500.00ක් දක්වා පරාසයකින් වැඩි කර ඇති බැවින්,මෙම සැලසුම් කමිටු දීමනාව 2022 ඔක්තෝම්බර් මස සිට එක් සාමාජිකයෙකුට රු.2000.00ක් බැගින් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් මෙම යෝජනාව ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

**<u>තීරණය</u>**

නාගරික සංවර්ධන අධිකාරිය,කළුතර දිස්ත්‍රික් කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ(සැලසුම්)ගේ අංක 05/05/10/03/02/04/-Gen-2019 හා 2022.08.22 දිනැති ලිපිය මඟින්,නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජෙනරාල් විසින් නිකුත් කරන ලද අංක DDG/P2/PC/LA හා 2022 මැයි මස 26 වන දින ලිපියෙන් දන්වා ඇති පරිදි,ප්‍රාදේශීය සභා සඳහා සැලසුම් කමිටු දීමනාව රු.1500.00 සිට රු.2500.00ක් දක්වා පරාසයකින් වැඩි කර ඇති බැවින්,මෙම සැලසුම් කමිටු දීමනාව 2022 ඔක්තෝම්බර් මස සිට එක් සාමාජිකයෙකුට රු.2000.00ක් බැගින් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
නාගරික සංවර්ධන අධිකාරිය යටතේ නව යෝජනාවක් ඉදිරිපත් කරලා තියෙනවා ප්‍රාදේශීය සභා සැලසුම් කමිටු දීමනා වැඩි කිරීම සඳහා.ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයා හැටියට මම කියන්නේ මේ අවස්ථාවේ දී මෙවැනි වකවානුවක ගෙවීම් කරන එක වැරදියි.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඒකට විරුද්ධ වෙන්න අයිතිය තියෙනවා.

**ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
මේ පවතින වාතාවරණය යටතේ කාටහරි පුළුවන්නම් දීමනා අත්හරිනවා මිස,තවත් දීමනා වැඩි කරගන්නවාට ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රිවරයා හැටියට මම විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ඒ යෝජනාවට මගෙත් පෞද්ගලික විරෝධතාවයක් තියෙනවා.

ගිය සභාවාරයේ මම දැක්කා යෝජනාවට දාලා තිබුණා,භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ගාස්තු ගෙවලා තිබුණා රුපියල් ලක්ෂයකට වැඩිය.සභාවේ නිලධාරීන්මයි මේ යන්නේ.බොහෝ විට සභාවේ වාහනයකින්මයි යන්නේ.තවත් ගෙවන්න දානවා.ජනතාවගෙන් එකතු කරන මුදල්වලින් තමයි මේ නිලධාරීන්ට සල්ලි ගෙවන්නේ.සභාවේ වාහනයකම ගිහිල්ලා ගමන් ගාස්තු කියලා ආයේ දානවා.මේවා වැරදියි.මේවා නිවැරදි කරන්න ඕන.මේ නිලධාරීන් බස්වල හෝ තමන්ගේ පෞද්ගලික වාහනවල ගමන් කරනවා නම් කමක් නැහැ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
නැහැ.සභාව විරුද්ධ නම් මුකුත් ගෙවන්නේ නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
සභාව විරුද්ධ වන ඒවට තමයි ගෙව්වේ මෙපමණ කල්.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් ඇවිත් හවස 4.00න් පස්සේ මේ රාජකාරිය කරන්නේ.හවස 6.00 වෙනකම් ඉන්නවා.මේ නිලධාරීන් රාජකාරි වේලාවෙන් පස්සේ කරන දෙයක්.මේවා චක්‍රලේඛනවලින් මේ නිලධාරීන්ට ගෙවන්න තියෙන හිමිකම්.ඒවා ගෙවන්නේ නැතුව ඉන්න අපට පුළුවන්.අපට ප්‍රතික්ෂේප කරන්න පුළුවන්.එතකොට මේ සැලසුම් අනුමත කර ගන්න කල් යනවා.දැන් අපි උසාවියේ දඩ මුදල් ගන්න යනකොට අපි උසාවියට ගාණක් ගෙවනවා.ඊට පස්සේ අපේ නිලධාරීන් එහෙට යනවා.ඒගොල්ලෝ සියයට ගාණක් ඒ දීමනාවෙන් ගන්නවා.ඒවා නිලධාරීන් හදාගෙන තියෙන දේවල්.

(මන්ත්‍රීවරුන්ගේ සෝෂාව නිසා අදහස් පැහැදිලි ව නොඇසේ )

එහෙනම් මේ ගෙවීම අපි සංශෝධනය නොකර ඉන්නවා.

**6.1.26** දරුවන්ගේ මන්දපෝෂණය අවම කිරීමේ විශේෂ වැඩසටහන මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පෙර පාසල් දරුවන් සඳහා සතියකට දින දෙකක් කිරි වීදුරුවක් ලබා දීම සඳහා දළ වියදම් ඇස්තමේන්තුව සහා අනුමැතිය සඳහා ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

**<u>දරුවන්ගේ මන්දපෝෂණය අවම කිරීමේ විශේෂ වැඩසටහන</u>**

**<u>මතුගම ප්‍රාදේශීය සභාවේ පෙර පාසල් දරුවන් සඳහා සතියට දින 2ක් කිරි වීදුරුවක් ලබා දීම.</u>**

දළ වියදම් ඇස්තමේන්තුව

| අනු අංකය | කාරණය | සංඛ්‍යාව | වියදම (රු.) |
|---|---|---|---|
| 1 | මතුගම ප්‍රාදේශීය සභාව සතු පෙර පාසල් සංඛ්‍යාව | 12 | |
| 2 | පෙර පාසල්වල දරුවන් සංඛ්‍යාව | 425 | |
| 3 | එක් දරුවෙකු වෙනුවෙන් ලබා දෙන කිරි ප්‍රමාණය | 150ml | |
| 4 | දරුවන් 425 සඳහා අවශ්‍ය කිරි ප්‍රමාණය මිලි ලීටර් | 63750ml | |
| | 150ml X 425 | 63.75L | |
| 5 | කිරි ලීටර් 1ක් සඳහා වන වියදම | | 150.00 |
| 6 | කිරි ලීටර් 64ක් සඳහා වියදම රු.150.00 X 64 | | 9,600.00 |
| 7 | දිනකට වැයවන මුලු මුදල | | 9,600.00 |
| 8 | දින 17ක් සඳහා කිරි ලබා දීමට අවශ්‍ය වියදම රු.9,600.00 X 17 | | 163,200.00 |
| 9 | දිනකට අවශ්‍ය සීනි ප්‍රමාණය | 6Kg | |
| 10 | සීනි 6Kg සඳහා වියදම රු.300.00 X 6 | | 1,800.00 |
| 11 | දින 17කට අවශ්‍ය සීනි ප්‍රමාණය 6X17 | 102Kg | |
| 12 | සීනි 102Kg සඳහා වියදම රු.300.00 X 102 | | 30,600.00 |
| 13 | වෙනත් වියදම් | | 6,200.00 |
| | **මුලු වියදම** | | **<u>200,000.00</u>** |

<u>තීරණය</u>
දරුවන්ගේ මන්දපෝෂණය අවම කිරීමේ විශේෂ වැඩසටහන මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පෙර පාසල් දරුවන් සඳහා සතියකට දින දෙකක් කිරි වීදුරුවක් ලබා දීම සඳහා දළ වියදම් ඇස්තමේන්තුව සහ අනුමැතිය සඳහා ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද අතර එය එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**6.1.27** සභා අරමුදල් මඟින් සෑම ග්‍රාම සේවා වසමක් සඳහා ම සුභ සාධන කටයුතු වෙනුවෙන් ටෙන්ට් ආවරණ සහ ප්ලාස්ටික් පුටු සහ සුභ සාධන උපකරණ ලබා දීමට කටයුතු කළ යුතු බවට ගරු සභා අනුමැතියට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් යෝජනා කරන ලදී.

තීරණය
සභා අරමුදල් මඟින් සෑම ග්‍රාම සේවා වසමක් සඳහා ම සුභ සාධන කටයුතු වෙනුවෙන් ටෙන්ට් ආවරණ සහ ප්ලාස්ටික් පුටු සහ සුභ සාධන උපකරණ ලබා දීමට කටයුතු කළ යුතු බවට ගරු සභා අනුමැතියට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**6.1.28** 2022.10.05 දින පැවති කාර්මික සේවා කාරක සභාවේ සංක්ෂිප්ත වාර්තාව සභා අනුමැතියට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

**ප.ව.02.00ට මතුගම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ පැවති කාර්මික සේවා කාරක සභාවේ සංක්ෂිප්ත වාර්තාව**

**සහභාගීත්වය-ධූරධාරීන්**

1. මෙරිල් මුණසිංහ මහතා - ගරු සභාපති
2. සුජීව නිර්මාණ මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
3. ඒ.එච්.එම්.රම්සාන් මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
4. සුරේෂ් දර්ශන ජයසේකර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
5. මද්දුමගේ දොන් අතුල මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
6. කේ.ඩී. මිත්‍රානන්ද මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
7. නිමාලක සුරංග විමලසූරිය මහතා- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

**සහභාගීත්වය-නිලධාරීන්**

1. අයිරාංගනී තෙන්නකෝන් මිය - ලේකම්
2. සමින්ද කුමාර මහතා - වැඩ අධිකාරී
3. පාලිත කුලරත්න මහතා - අභ්‍යන්තර විගණන නිලධාරී
4. දුලානි සෙනෙවිරත්න මිය - සංවර්ධන නිලධාරී
5. අරුණ බුද්ධික මහතා - කළමනාකරණ සේවා නිලධාරී
6. ජීවන් චතුරංග මහතා - වැඩ ක්ෂේත්‍ර පරිපාලක

සාකච්ඡා කළ කරුණු

1. තණකොළ කපන මැෂින් අළුත්වැඩියා කිරීම නියෝජිත ආයතන වෙත ලබා දීමේ දී වැට් බදු ඇතුලත් ව වැඩි ඇස්තමේන්තුවක් ඉදිරිපත් වන බැවින් සහ වැඩි කාලයක් ගත වන බැවින් ස්ටීල් මැෂින් අළුත්වැඩියාව සුදුසුකම් ලත් ආයතනයකින් සිදු කිරීම සුදුසු බව නිර්දේශ කර එය මහ සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමටත් තීරණය කරන ලදී.මෙහි දී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා අදහස් දක්වමින් කියා සිටියේ අදාළ මැෂින් අංකනය කර වෙන වෙන ම ෆයිල් නඩත්තු කරන ලෙස යි.
ගරු සභාපති මෙරිල් මුණසිංහ මැතිතුමන් අදහස් දක්වමින් කියා සිටියේ එක් මැෂින් එකක් නිතර ම විෂය භාර නිලධාරියා භාරයේ රඳවා තබා ගෙන අළුත්වැඩියාවක් පැමිණි විට එය නිදහස් කරන

ලෙස යි.තව ද මැෂින්වල නඩත්තුව සම්බන්ධ ව සේවකයා දැනුවත් කළ යුතු බව ද ප්‍රකාශ කරන ලදී.

2. L J-9413 ටිපර් රථයේ රු.83250.00ක් වැය වන අළුත්වැඩියාව සාලිය මෝටර්ස් ආයතනයේ සිදු කිරීමට නිර්දේශ කරන ලදී.ඒ වගේ ම ඒ සඳහා වගකීම් කාලයක් ලබා ගන්නා ලෙස ද දන්වන ලදී.තව ද ටිපර් රථයේ පාපුවරු අළුත්වැඩියා කරන ලෙස ද ප්‍රකාශ කරන ලදී.

3. RB – 2267 කසළ ප්‍රවාහන ට්‍රැක්ටර් රථයේ එංජිම අළුත්වැඩියාව Browns ආයතනය මඟින් සිදු කිරීමටත් සුළු අළුත්වැඩියා කටයුතු ප්‍රාදේශීය ව සිදු කිරීමටත් තීරණය කරන ලදී.

4. JG -4546 කසළ ප්‍රවාහන ට්‍රැක්ටර් රථයේ අළුත්වැඩියා කටයුතු කඩිනමින් මිළ ගණන් කැඳවා ප්‍රාදේශීය ව සිදු කිරීමට නිර්දේශ කරන ලදී.

5. RF-1964 කසළ ප්‍රවාහන ට්‍රැක්ටර් රථයේ අළුත්වැඩියා කටයුතු Browns ආයතනය මඟින් සිදු කිරීමට නිර්දේශ කරන ලදී.වාහන අළුත්වැඩියාව සඳහා කම්පැනියට දීම සම්බන්ධ ව තමන් එකඟ නොවන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා සඳහන් කරන ලදී. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහොමඩ් හමීඩ් රම්සාන් මන්ත්‍රීතුමා අදහස් දැක් වූ අතර ඔහු කියා සිටියේ සුළු සුළු අළුත්වැඩියා වාර්තා වූ පසු ඒවා කඩිනමින් සිදු කිරීමට පියවර ගත යුතු බව යි.

6. භාණ්ඩ සමීක්ෂණයේ වෙන්දේසි කළ යුතු භාණ්ඩ නිරීක්ෂණය කරන ලද අතර අදාළ තක්සේරුව නිර්දේශ කරන ලදී.

7. LL 7571 කෘ කැබ් රථය ප්‍රාදේශීය ව මිළ ගණන් කැඳවා අළුත්වැඩියා කිරීමට නිර්දේශ කරන ලදී.

8. මාර්ග නඩත්තු කිරීම සඳහා අවශ්‍ය තාර,ගල් ආදී ද්‍රව්‍ය මිළ දී ගැනීමට කටයුතු කිරීමටත්,මෝටර් ග්‍රේඩරයක් යොදා ගෙන පාරවල් සංවර්ධනය කිරීමටත් නිර්දේශ කරන ලදී.

මෙහි දී

**03** සහ **05** අංක යටතේ RB-2267 සහ RF-1964 කසළ ප්‍රවාහන ට්‍රැක්ටර් රථ අළුත්වැඩියාව සඳහා නියෝජිත ආයතන වෙත ලබා දීමට කාර්මික කමිටුව නිර්දේශ කර තිබුණ ද මහ සභාවේ සාකච්ඡා කිරීමෙන් අනතුරු ව,

1. නියෝජිත ආයතන ඉදිරිපත් කරන ඇස්තමේන්තු සඳහා වැඩි පිරිවැයක් දැරීමට සිදු වන බැවින් ද,
2. සුළු අළුත්වැඩියා කටයුතු ප්‍රාදේශීය ව සිදු කරන බැවින් ද
   නියෝජිත ආයතන ලබා දෙන වගකීම් කාලයට වඩා වැඩි වගකීම් කාලයක් ලබා ගැනීමට යටත් ව ප්‍රාදේශීය ව සුදුසුකම් ලත් ආයතනයකින් අළුත්වැඩියාව සිදු කර ගැනීම සුදුසු බව තීරණය කරන ලද අතර එය සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සහා සම්මත විය.

අංක **01** යටතේ තණකොළ කපන මැෂින් අළුත්වැඩියා කිරීම නියෝජිත ආයතන වෙත ලබා දීමේ දී වැට් බදු ඇතුලත් ව වැඩි ඇස්තමේන්තුවක් ඉදිරිපත් වන බැවින් සහ වැඩි කාලයක් ගත වන බැවින් ස්ටීල් මැෂින් අළුත්වැඩියාව සුදුසුකම් ලත් ආයතනයකින් සිදු කිරීම සුදුසු බව නිර්දේශ කර එය මහ සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමටත් තීරණය කරන ලදී.එහි දී තණකොළ කපන මැෂින් අළුත්වැඩියා කිරීම සුදුසුකම් ලත් ආයතනයකින් සිදු කිරීම සුදුසු බව මහ සභාවේ දී තීරණය කරන ලද අතර එය සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

අංක **2** යටතේ L J-9413 ටිපර් රථයේ රු.83250.00ක් වැය වන අළුත්වැඩියාව සාලිය මෝටර්ස් ආයතනයේ සිදු කිරීමට නිර්දේශ කරන ලදී.ඒ වගේ ම ඒ සඳහා වගකීම් කාලයක් ලබා ගන්නා ලෙස ද දන්වන ලදී.තව ද ටිපර් රථයේ පාපුවරු අළුත්වැඩියා කරන ලෙස ද ප්‍රකාශ කරන ලදී. එය මහ සභාවේ දී සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

අංක **4** සහ අංක **7** යටතේ JG -4546 කසළ ප්‍රවාහන ට්‍රැක්ටර් රථයේ සහ LL 7571 කෘ කැබ් රථයේ අළුත්වැඩියා කටයුතු කඩිනමින් මිළ ගණන් කැඳවා ප්‍රාදේශීය ව සිදු කිරීමට නිර්දේශ කරන ලද අතර එය මහ සභාවේ දී සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

අංක **6** යටතේ භාණ්ඩ සමීක්ෂණයේ වෙන්දේසි කළ යුතු භාණ්ඩ නිරීක්ෂණය කරන ලද අතර අදාළ තක්සේරුව නිර්දේශ කරන ලදී.එය මහ සභාවේ දී සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

අංක **8**යටතේ මාර්ග නඩත්තු කිරීම සඳහා අවශ්‍ය තාර,ගල් ආදී ද්‍රව්‍ය මිළ දී ගැනීමට කටයුතු කිරීමටත්,මෝටර් ග්‍රේඩරයක් යොදා ගෙන පාරවල් සංවර්ධනය කිරීමටත් නිර්දේශ කරන ලදී.එය මහ සභාවේ දී සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**
අපේ ට්‍රැක්ටර් රථ දෙකක් අලුත්වැඩියා කටයුතු සඳහා නියෝජිත ආයතන වෙත ලබා දීමට කාර්මික සේවා කමිටුවේ දී සාකච්ඡා වුණා.එහිදී ඇත්තට ම මේ ප්‍රදේශයේ ඉන්න දක්ෂ පුද්ගලයින්ගෙන් කොටේෂන් අරගෙන ඒක කරන්න කියන ඉල්ලීම කරනවා.ඒ වෙලාවේ දී කාර්මික කමිටුව ඇතුලේ මේකට අදහස් දක්වන්න අවස්ථාවක් තිබුණේ නැහැ.මේක කතා නොකර ඉන්න එක නෙමෙයි කරන්න ඕනේ. ඇත්තටම මේ සභාවේ තියෙන මුදල් අනවශ්‍ය විදිහට කම්පැනිවලට ගෙවන එක නෙමේ අපි කරන්න ඕන.සුළු අලුත්වැඩියා කටයුතු පවා ප්‍රාදේශීයව සිදු කරනවානම් ඇයි මේක ප්‍රාදේශීය ව අලුත්වැඩියා කරන්න බැරි?

(මන්ත්‍රීවරුන්ගේ සෝෂාව නිසා අදහස් පැහැදිලි ව නොඇසේ )

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මේක යම්කිසි ප්‍රමාණයක වගකීමකට යටත්වයි කරන්න ඕන.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**
තණකොළ කපන මැෂින් සම්බන්ධ ව කතා කිරීමේදීත් මේ සභාවේ මෙපමණ කලක් තණකොළ කපන මැෂින් නඩත්තුව සිදු වුණේ නැහැ.මේ මැෂින් අංකනය කරලා වෙන වෙනම පවත්වාගෙන යන්න.අපේ මේ සභා කාලය තුළ දෙවතාවයි හෝ තුන්වතාවයි කාර්මික කමිටුව කැදෙව්වේ.මේ වගේ කමිටු කැඳවලා අනිත් අයගේ අදහස් අරගන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා**
තේරුම්ගන්න ඕන කමිටුවක් කැදෙව්වා ම කමිටුවට සාමාජිකයින් හතක් අටක් වගේ ඉන්නේ.සභාවක කමිටුවකින් ගන්න තීරණයක් සියයට සියයක්ම සාර්ථක වෙන්නේ නැහැ.නමුත් ඒ වෙලාවේ තියෙන ප්‍රශ්නත් එක්ක බලලා තීන්දු තීරණ ගන්න ඕන.ඇත්තටම කමිටුවේ කාටවත් කතා කරන්න බැරි තත්ත්වයක් තිබුණේ නැහැ.තම තමන්ගේ අදහස් ඉදිරිපත් කළා.මේගොල්ලෝ කම්පැනි දානවට විරුද්ධයි කිව්වා.අපි කම්පැනි දාන්න කිව්වා.ඒකට හේතුවක් තිබුණා.ඒක තමයි මේ යන්ත්‍ර සූත්‍ර තැන් තැන්වලට අරගෙන ගියාම ඒගොල්ලෝ ගාණක් ගන්නවා කියලා මේ සේවකයන්ට චෝදනා කරන්න පුළුවන්. කම්පැනියට දැම්මාට පස්සේ එහෙම වෙන්නේ නෑ.මේ වගේ අලුත්වැඩියා කිරීමක් බ්‍රවුන්ස් එකට දුන්නාම ලේසියි.වගකීමක් තියෙනවා.අනික කම්පැනි දැම්මම වගකීමත් වැඩියි.වගකීමක් තියෙනවා නම් ඕන තැනකට දෙන්න පුළුවන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කාන්ත සිරිවර්ධන මහතා**
ගරාජ් එකෙනුත් කම්පැනියෙන් දෙන වගකීම ම දෙනවා නම් ප්‍රශ්නයක් නැනේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
වාහන ගැන කතා කරපු නිසා කියන්නේ ජේ.සී.බී. එකේ ප්‍රශ්නයක් තියෙනවා.තව වැඩ වගයක් තිබුණ නිසා මට පොඩි කාලයක් ගියා එකේ වැඩේ ඉවර කරලා දෙන්න.ට්‍රාන්ස්මිෂන් පද්ධතිය හදලා ඒ වැඩ කරන්න "සෙනොක්" ආයතනයෙන් දස ලක්ෂ ගාණක් දාලා තිබුණා.මේකේ ලක්ෂ පහට අඩුයි.ඒ වෙලාවේ ලක්ෂ හතර හමාරක් වගේ බිල දාලා තිබුණේ.සෙනොක් එකට වඩා මාස තුනක්වත් අපට වොරන්ටි දෙන්න පුළුවන්.අනිත් සභාවලත් වාහනවල ගැටළු වුනොත් කම්පැනිවලට ම දාන්නේ නැහැ.සුදුසුකම්ලත් ආයතනවලින් ඒ වැඩ කර ගන්නවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
අනිත් සභාවල ප්‍රාදේශීය ආයතනවලට දෙන්නේ නැහැ ප්‍රශ්න නිසා.කම්පැනියටමයි දෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කාන්ත සිරිවර්ධන මහතා**
දැන් පරණ යෝජනාවලින් වැඩක් නැහැ.හොඳ ගැරේජ් එකක් බලලා ප්‍රාදේශීයව සුදුසුකම් ලත් ආයතනයකට මේක කරන්න බාර දෙන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා**
ඇත්තටම මේ තීරණයට මම ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම වාහන කම්පැනි යැව්වාම දෙගුණයක් වියදම් යනවා.සාකච්ඡා කරලා වියදම අඩුවෙන් කර ගන්න.ප්‍රාදේශීය ව සුදුසුකම් තියෙන පුද්ගලයින් ඕන තරම් ඉන්නවා.ඉතින් ඒ වගේ ආයතනයකට දීලා මේක අඩු මුදලින් කරගන්න පුළුවන්.

**6.2 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී සීතා ඩයස් ජයසිංහ මහත්මිය විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා -:**

6.2.1 මතුගම බල ප්‍රදේශයේ මහා මාර්ග සහ පොලීසිය, රෝහල, ප්‍රාදේශීය සභාව ඇතුළු සියළුම ආයතන භූමි භාගවල සුනඛයන්ගෙන් ඉමහත් කරදරයක් වී ඇති බව පෙනී යයි. මේ පිළිබඳව ගත හැකි පියවරවල් ගැනීම සඳහා සභාවේ සාකච්ඡා කොට තීරණයක් ලබා දීමට ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී සීතා ඩයස් ජයසිංහ මහත්මිය විසින් යෝජනා කරන ලදී.(ජලභීතිකා එන්නත් නොමැති බැවින් මහජනතාව අපහසුතාවයට පත්ව ඇත.)

<u>තීරණය</u>

මතුගම බල ප්‍රදේශයේ මහා මාර්ග සහ පොලීසිය, රෝහල, ප්‍රාදේශීය සභාව ඇතුළු සියළුම ආයතන භූමි භාගවල සුනඛයන්ගෙන් ඉමහත් කරදරයක් වී ඇති බව පෙනී යයි. මේ පිළිබඳව ගත හැකි පියවරවල් ගැනීම සඳහා සභාවේ සාකච්ඡා කොට තීරණයක් ලබා දීමට ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී සීතා ඩයස් ජයසිංහ මහත්මිය විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.(ජලභීතිකා එන්නත් නොමැති බැවින් මහජනතාව අපහසුතාවයට පත්ව ඇත.)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී සීතා ඩයස් ජයසිංහ මහත්මිය**

මම මේ යෝජනාව කිරීමට හේතුව ජලභීතිකා එන්නත රෝහල්වල නැති නිසා,මහජනතාව මේකෙන් පීඩාවට පත්වන නිසා මේ සඳහා මොනයම් හෝ විකල්පයක් ගෙන ආ යුතු යි.මේ පිළිබඳ ව කුමන හෝ පියවරක් ගත යුතුයි.එ නිසා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු දැනුවත් කරලා,ඒ හා සම්බන්ධ තවත් ආයතන තියෙනවා නම් ඒවාත් දැනුවත් කරලා මේ කටයුත්ත ඉටු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**

මේ මන්ත්‍රීතුමිය ගෙනාවේ හොඳ යෝජනාවක්.මේක සරලව විසඳන්න පුළුවන්.අපට මේ ප්‍රශ්නය කුමන ආකාරයෙන් ගෙනිච්චත් වැඩි ම කාලය අවුරුදු දෙකයි කරන්න වෙන්නේ.බල්ලෝ ටික සංරක්ෂණය කළාම අවුරුදු දෙකෙන් මේ ප්‍රශ්නය ඉවරයි.මේක කවුරුත් හිතුවේ නැති වුණාට ජලභීතිකා එන්නත සඳහා රජයෙන් විශාල වියදමක් දරනවා.ඒත් දැන් බෙහෙතුත් නැහැ.බෙහෙත් ගෙන්නන්නෙත් නැහැ.මේ යෝජනාව පිළිබඳව අපි සතුටු වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත කුමාර මහතා**

මතුගම ප්‍රාදේශීය සභාව ගත්තම සෞඛ්‍ය සම්බන්ධ ව අපට ඇත්තෙන්ම වගකීමක් තියෙනවා.හොඳ යෝජනාවක් ඔබතුමිය ඉදිරිපත් කරලා තියෙන්නේ.සමහර තැන්වලදි රෝහල්වල ඉන්නවා සුනඛයින් බයිසිකල්වල හැපිලා තුවාල වුණු,ආබාධ වලට ලක්වුණු පිරිස්.ඒ වගේම අයාලේ යන සුනඛයින් සෑම ස්ථානයකම ඉන්නවා.මම හිතන්නේ සුනඛයින්ට විදින්න තියෙන එන්නත තියෙනවා.මිනිසාට විදින එන්නතයි නැත්තේ.මේ බල්ලන්ට විදින එන්නත අඩු වෙලා නැහැ කියන එකයි මම මේකෙන් දැනගත්තේ.ඒ නිසා මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරු දැනුවත් කරලා මේ සඳහා තීරණයක් දෙන්න.මේ සභාවේ ගත්තත්,ගම් ප්‍රදේශවල ගත්තත් විශාල ලෙස සුනඛයින් සපා කනවා.මේක කාලෝචිත යෝජනාවක්. මේ සඳහා ක්‍රියාත්මක වන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහොමඩ් හමීඩ් රම්සාන් මහතා**

ගෙවල්වල ඇති කරන සුනඛයන්ට එන්නත ගැහුවත් පාරේ යන සුනඛයින්ට එන්නත ගහලා නැනේ.ඒ නිසයි මහජනතාවත් බිය විය යුත්තේ රෝහල්වල එන්නත නැති නිසා.හැම තැනකම මේ ප්‍රශ්නය තියෙනවා.ඒ නිසා මේක හොඳ යෝජනාවක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තුඩුගලගේ දොන් රෝහිත මහතා**

මේ වැඩසටහන මහජන සෞඛ්‍ය පරීක්ෂක කාර්යාලය යටතේ ක්‍රියාත්මක වෙනවා.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**

මේකේ ප්‍රධානම හේතුව මේ බෙහෙත විදින්න නම් සුනඛයෝ සපා කාපු පස් දෙනෙක් එකතු වෙන්න ඕන.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

පසුගිය මාසයේ දී මතුගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන් මේ සුනඛයින් ව ශල්‍යකර්මයකට ලක් කළා.නිවේදනයක් ගියා. අපෙන් තමයි පහසුකම් ටික දුන්නේ.සුනඛයින් විශාල ප්‍රමාණයකට වඳ සැත්කම කළා.ඒ වගේම සුනඛ එන්නතත් කළා.තවදුරටත් ඕන නම් සුනඛ එන්නත කරන්න,දැනුවත් කරන්න කිව්වා.

අගලවත්ත සහ මතුගම බල ප්‍රදේශ දෙකේම ලක්ෂ 20 ක ප්‍රතිපාදන යටතේ ශල්‍යකර්ම කරලා තියෙනවා.අපි මේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට ඒ අවශ්‍ය පහසුකම් ටික නිතරම ලබා දෙනවා.අපේ වගකීම ඩීසල් භූමිතෙල්,වාහන ආදී සියල්ල ලබා දී තියෙනවා.

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ වෛද්‍යතුමිය සහ ප්‍රධාන සෞඛ්‍ය පරීක්ෂකතුමා ඒ කටයුතු අපිත් එක්ක හොඳට කරනවා.ඒකේ අඩුපාඩු තියෙනවා නම් අපි සාකච්ඡා කරලා ඒ අයට දැනුම් දෙමු.අපේ ගම්වල සුනඛයින් සඳහා අපි විශේෂ වැඩපිළිවෙලක් ගන්නම්.මොකද සුනඛයින් ව මරණයට පත් කරන්න බැහැ.ඒක අපි අනුමත කරන එකක් නෙමෙයි. අපි ඒ අවශ්‍ය කටයුතු කරමු.

## 6.3 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජය එරංග කරවිට මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා -:

6.3.1 පවතින ආර්ථික අපහසුතාව නිසාවෙන් මතුගම ප්‍රාදේශීය බලප්‍රෙද්ශයට අයත් සියලුම ආගමික ස්ථාන සඳහා සූර්ය විදුලි බල්බ එක බැගින් ලබා දීමට සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් යෝජනා කරන ලදී.

6.3.2 හොරවල මංසන්දියේ තබා ඇති තහඩු බැරලය ඉවත් කොට ඒ සඳහා සුදුසු ස්ථිර මාර්ග ස්තම්බකයක් ඉදිකිරීම සඳහා ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් යෝජනා කරන ලදී.

6.3.3 මෙවර ජාතික ක්‍රීඩා උළෙලේදී හොඳම ක්‍රීඩකයා බවත් බත් වූ ඉසුරු බාන්ස් කෞෂල්‍යා ශිෂ්‍යාව ඇගයීමට ලක් කිරීමට ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් යෝජනා කරන ලදී.

<u>තීරණය</u>

6.3.1 පවතින ආර්ථික අපහසුතාව නිසාවෙන් මතුගම ප්‍රාදේශීය බලප්‍රෙද්ශයට අයත් සියලුම ආගමික ස්ථාන සඳහා සූර්ය විදුලි බල්බ එක බැගින් ලබා දීමට සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

6.3.2 හොරවල මංසන්දියේ තබා ඇති තහඩු බැරලය ඉවත් කොට ඒ සඳහා සුදුසු ස්ථිර මාර්ග ස්තම්බකයක් ඉදිකිරීම සඳහා ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

6.3.3 මෙවර ජාතික ක්‍රිඩා උළෙලේදී හොඳම ක්‍රිඩකයා බවත් බත් වූ ඉසුරු බාන්ස් කෞෂල්‍යා ශිෂ්‍යාව ඇගයිමට ලක් කිරිමට ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**

6.3.1 මම මේ යෝජනාව දැම්මෙ සති දෙකකට කලින්.දැන් රජය විසින් තීන්දුවක් අරගෙන තියෙනවා,ආගමික ස්ථාන සඳහා විදුලිය සඳහා අය කිරීමේ දී සියයට පනහක සහනයක් කරන්න.මේක ප්‍රධානව ම දැම්මේ සමහර පන්සල් තියෙනවා දායකයින් ප්‍රමාණය අඩුයි.ආර්ථික අපහසුතාවයන් තියෙන පන්සල් තියෙනවා.මම පෞද්ගලිකව දන්න කාරණයක් තියෙනවා, සමහර පන්සල්වලට දානය සපයා දෙන්න අපහසු දායකයෝ ඉන්නවා.මම සොයා බැලුවා,වැලිපැන්න ප්‍රදේශයේ මුස්ලිම් පල්ලි අටත් තියෙනවා.පල්ලි අට සඳහා ප්‍රදේශයේ ඉන්න ව්‍යාපාරිකයන් සම්බන්ධ කරගෙන අපට මේක කරන්න පුලුවන් වෙයි.

ඒ වගේම මේ බල ප්‍රදේශයේ පන්සල් පනස් හතක් තියෙනවා.ඒ පන්සල් 57ට ම මේ දේ කරන්න පුළුවන් නම් ලොකු දෙයක්. සූර්ය කෝෂ සහිත විදුලි බල්බයක් දල්වන්න කිව්වාම මම කියන්නේ බෝධි පූජා පවත්වන කොට විදුලිය විසන්ධි වීම් වෙනවා මේ දවස්වල.එතකොට බෝධි පූජා පැවැත්වීමේ ප්‍රායෝගික ප්‍රශ්නයක් මතු වෙනවා.මගේ අදහස අපේ පන්සල් සඳහා බෝධිය ආසන්නයේ බල්බයක් දල්වන්න.මම සාමාන්‍ය මිළ ගණන් සොයා බැලුවා.රුපියල් 14 000.00ට වගේ ප්‍රමාණවත් එලියක් තියෙන සූර්ය කෝෂයක් මිළදී ගන්න පුළුවන්.මේ ගැන ගරු සභාව අවධානය යොමු කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

6.3.2 යෝජනාව සම්බන්ධයෙන් අදහස් දක්වද්දී හොරවල- මතුගම මාර්ගය කියන්නේ ප්‍රධාන මාර්ගයක්.පස්දුන් කෝරළේ අගනගරය වන මතුගම සිට නෙලුව ප්‍රදේශයට,දකුණු පළාතට ලේසියෙන් ම ගමන් කරන්න පුළුවන් මාර්ගය වන්නේ හොරවල මංසන්ධිය හරහා යි.හොරවල මංසන්ධියේ තබා තිබෙන තහඩු බැරලයට වඩා මම හිතන්නේ වඩා සුදුසුයි ස්ථම්භකයක් ඉදිකිරීම.අපට මේ සඳහා මුදල් වැය කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ.මාර්ග සංවර්ධන අධිකාරියට මේ යෝජනාව ඉදිරිපත් කරලා ඒ අවශ්‍ය කටයුතු කර ගැනීමට හැකියාව පවතිනවා.එහි දී හොරවල මංසන්ධියේ සිට ඒ ඒ ප්‍රදේශවලට තියෙන දුර ප්‍රමාණයන් සනිටුහන් කරලා මේක කරන එක ඒ මාර්ගයේ ගමන් කරන අයටත් පහසුවක් වෙයි.

(මන්ත්‍රීවරුන්ගේ සෝෂාව නිසා අදහස් පැහැදිලි ව නොඇසේ )

6.3.3.යෝජනාව සම්බන්ධ ව අදහස් දැක්වීමේ දී මතුගම ආනන්ද ශාස්ත්‍රාලයේ මේ ශිෂ්‍යයා.මෙතන මතුගම ආනන්ද ශාස්ත්‍රාලයේ ආදි ශිෂ්‍යයන් කිහිප දෙනෙක්ම ඉන්න නිසාත්, මතුගම නගරයට ජාතික ක්‍රීඩා උලෙළකදී ජාතික ක්‍රීඩකයෙක් බිහිවන්නේ ප්‍රථම වතාවට.මම මේ පිළිබඳ ව සභාපතිතුමා සමඟත් කතා කළා.විදුහල්පති සහ ඒ ක්‍රීඩා භාර නිලධාරීතුමිය සමඟත් කතා කළා.මේ ක්‍රීඩකයා හොඳ ආර්ථික මට්ටමක ජීවත්වන තරුණයෙක් නෙමෙයි.ඔහුගේ සහජ හැකියාවන් සහ ආත්මීය විශ්වාසය මත තමයි මේ ගමන යන්නේ.මේ සඳහා යම්කිසි ඇගයීමකට මේ තරුණයාව ලක් කරලා අපේ යම්කිසි ව්‍යාපාරිකයෙක් හෝ ඒ තරුණයාට අවශ්‍ය කරන අනුග්‍රහයක් ලබා දෙන්න ඒ සඳහා කැපවෙන්න.ඒක අපේ සභාවටත් ගෞරවයක්,අභිමානයක්. මතුගම ප්‍රදේශය අපි හඳනවා නම් මේ මානව සම්පත් අපටත් ගෞරවයක්.ඒ සඳහා දිරි ගැන්වීම කරන්න මම මේ ගරු සභාවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**

අවසාන වශයෙන් ගෙනා යෝජනාව ගේන්න පෙර මමත් කතා කළා.ඇත්ත වශයෙන් ම අපි මතුගම මහජන ක්‍රීඩා පිටියේ ඒ දරුවා වෙනුවෙන් උත්සවයක් සංවිධානය කරලා මතුගම ප්‍රාදේශීය සභාව වශයෙන් අපට කරන්න පුළුවන් උපරිම දේ කරන එක වටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා**

මතුගම ඉතිහාසයේ පළමු වතාවට මෙවැනි ක්‍රීඩකයෙක් බිහිවුණා.මේක ලොකු ගෞරවයක්.ඒ වෙනුවෙන් අපේ සභාවේ කරන්න පුළුවන් උපරිමය කරන්න කියලා ඉල්ලා සිටිනවා.ඒ වගේම පාන්තිය මහා විද්‍යාලයේ ශිෂ්‍යාවක් මැරතන් තරඟයේ ප්‍රථම ස්ථානය ලබාගෙන තියෙනවා.ඒ වගේ මේ අපේ ප්‍රදේශවලට ගෞරවයක් ගේන්න පුළුවන් දක්ෂ ක්‍රීඩකයින් ඉන්නවා.මේ සඳහා ඒ ක්‍රීඩකයන්ට පමණක් නෙමෙයි,ඉදිරියේ දී ක්‍රීඩාව නගා සිටුවීම සඳහා ප්‍රාදේශීය සභාවෙන් වැඩ පිළිවෙලකුත් සාකච්ඡා කරලා පොදු වැඩපිළිවෙළක් සකසන්න කියලත් මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පුෂ්පා නන්දනී මහත්මිය**

ආදි ශිෂ්‍ය සංගමයෙන් ඒ දරුවාට ගොඩක් සහයෝගය දක්වලා තියෙනවා.ඒ වගේම ඒ දරුවා ප්‍රදේශවාසීන්ගේ ගෞරවයටත් පාත්‍ර වෙලා තියෙනවා.ඇත්තටම හරිම සතුටුයි.ඒ වගේම පාන්තිය විද්‍යාලයේ "පේෂිකා"කියන ශිෂ්‍යාව මේ වෙනකොට උසස් පෙළ හදාරමින් සිටිනවා. ඒ දරුවාත් නෙස්ටමෝල්ට් මගින් පැවැත්වූ මැරතන් ධාවන තරඟයකින් ප්‍රථම ස්ථානය ලබා ගත්තා.ඇත්තටම ඒ දරුවත් ආර්ථික අපහසුතා මධ්‍යයේ ජීවත් වෙන්නේ.මම හිතන්නේ කවුරු හරි කෙනෙක් හෝ ආයතනයක් මැදිහත් කර ගෙන ඒ දරුවාටත් අනුග්‍රාහක දායකත්වයක් ලබා දෙන්න කටයුතු කරනවා නම් ඒක වටිනවා.මම ඉල්ලීමක් කරනවා ඒ දරුවා පිළිබඳවත් සොයා බලා හැකි සහයෝගයක් ලබා දෙන්න කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**

6.3.3 යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වීමේ දී මතක් කර සිටිනවා මීට පෙර අපි ඒ ආකාරයෙන් ජයග්‍රහණයක් ලබා ගත් ධාවන ශූරයෙක් මේ සභාවට ගෙනැවිත් ඔහුගේ එම ජයග්‍රහණය පිළිබඳව ලොකු ඇගයීමක් කළා.ඒ නිසා මම ඉල්ලා සිටිනවා ඒ ක්‍රීඩකයාව මේ ස්ථානයට ගෙන්නලා ඒ කළ ජයග්‍රහණයට ගෞරවයක් වශයෙන් සම්මානයක්, උපකාරයක් කරමු කියලා.

ඒ වගේම 6.3.1 යෝජනාවත් හොඳ යෝජනාවක්.ප්‍රාදේශීය සභාව මගින් මම දැක්කා පන්සල් අසළට වැඩි ආලෝකයක් සහිත එල්. ඊ.ඩී බල්බ් තුනක් සහිත බල්බ් එකක් සවි කරලා දීලා තියෙනවා.මම නම් හිතන්නේ ඒ වගේ දැනටමත් මේ සභාවේ ඉන්න මන්ත්‍රීවරු ලොකු කැපකිරීමක් කරලා තියෙන්නේ.මොකද තමන්ගේ කොට්ටාශයේ විහාරස්ථාන ඉදිරිපිට ඒ කටයුත්ත සිදු කරලා තියෙනවා.හැබැයි මහා සංඝයා හැටියට අපිත් යම් කැපකිරීමක් කරන්න ඕන.මොකද අහිංසක ජනතාව දුක් විදින කොට මහා සංඝරත්නය හැටියට අපටත් මේක දැනෙන්න ඕන කියන එකයි මගේ මතය වෙන්නේ.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරව්ට මන්ත්‍රීතුමා මේ යෝජනාව ගෙනාවේ සද්භාවයෙන්, බෞද්ධයෙක් හැටියට. මේක හොඳ යෝජනාවක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී චමිලානි රුවන්දි ත්‍රිමාන්න මහත්මිය**

ඉතාම හොඳ යෝජනාවක්.අද වෙනකොට මතුගම නගරය වෙනත් විදිහකට අපරාධ රැල්ලක් පැතිරිලා යන මොහොතක මම හිතන්නේ මේ වගේ දරුවන් ලබන ජයග්‍රහණ අගය කරලා අපිට පුළුවන් නම් ලොකු උත්සවයක් තියලා ඒ ජයග්‍රහණයට වටිනාකමක් දෙන්,මේ අනෙක් පාසල් දරුවන්ටත් යම් උත්තේජනයක්.එනිසා  මම හිතන්නේ මේක ගොඩක් හොඳ යෝජනාවක්.එ නිසා විශේෂයෙන් මේ සම්බන්ධයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතාට ස්තුතිවන්ත වෙනවා.ඒ වගේම ඉතා කඩිනමින් මේ සඳහා වැඩපිළිවෙළක් සූදානම් කරන මෙන් සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කමිල් කුමාර මහතා**

මගේ කොට්ඨාශයේ දරුවෙක්.වසර ගණනාවක් තිස්සේ ක්‍රීඩා තරඟ රැසකට සහභාගි වෙලා,ජයග්‍රහණ රැසක් ලබා දීලා ලංකාවේ මලල ක්‍රීඩා ක්ෂේත්‍රයේ මෙවර දක්ෂතම ක්‍රීඩකයා ලෙස කිරුළු පැළඳුවා.මේ පිළිබඳ ව මතුගම ආනන්ද ශාස්ත්‍රාලයේ ශිෂ්‍යයෙක් සහ මතුගම ප්‍රදේශයේ පුරවැසියෙක් හැටියට මේ දරුවා පිළිබඳව ලොකු ආඩම්බරයක් තියෙනවා.මේ දරුවාට අපේ ප්‍රාදේශීය සභාවෙන් ලැබෙන්න ඕන ගෞරවය ලබා දෙන්න කියන ඉල්ලීම කරනවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

අපි ඒකට අවශ්‍ය කටයුතු ටික කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිශාන්ත කුලතුංග මහතා**

මේ යෝජනාව සම්බන්ධයෙන් මතුගම ප්‍රාදේශීය සභාව හැටියට ලොකු ආඩම්බරයක් තියෙනවා.අද වෙනකොට මතුගම පාන්තිය විද්‍යාලයේත් දක්ෂ  දරුවෙක් ඉන්නවා.ඒ වගේම මගේ ගමේත් අලුත්ගම්ගොඩ කනිෂ්ඨ විද්‍යාලයේ දරුවන් 50යි ඉන්නේ.අවුරුදු 16න් පහළ සමස්ත ලංකා දෙවන ස්ථානය දිනපු දරුවෙක් ඉන්නවා.පෙරේදා තිබුන  නෙස්ටමෝල්ට් එකෙන් පවත්වපු තරගයෙන් මේ දරුවා දෙවැනි ස්ථානය දිනලා තියෙනවා. ඇත්තටම මේ වගේ අපේ මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් පාසල්වල දක්ෂතම ශිෂ්‍යයන් හඳුනාගෙන මතුගම ප්‍රාදේශීය සභාව හැටියට අපට යම් ආකාරයක අත්වැලක් ඒ දරුවන්ට දෙන්න පුළුවන් නම් ඒක වටිනවා.ඒ සඳහා ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා ජාතික මට්ටමේ ජයග්‍රහණ ලබා ගත් දරුවන් ලේඛනගත කර ගෙන එයට සභාවෙන් යම්කිසි උපකාරයක් කරන්න පුලුවන් නම් වටිනවා.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**

මේ යෝජනාව ඉතා වටිනා යෝජනාවක්.අපි මේ පිළිබඳ ව බොහෝ අදහස් ප්‍රකාශ කළා.කතා කරන එක නෙමෙයි වැදගත් වෙන්නේ මොකක් හරි කරන එක.මේ මතුගම තියෙන ව්‍යාපාර ආයතන සම්බන්ධ කරගෙන අවශ්‍ය අනුග්‍රාහක  දායකත්වයක් ලබා දෙන්න කටයුතු කරන්න ඕන.මම ඉල්ලා සිටිනවා සභාපතිතුමාගෙන් මේ දරුවාට අවශ්‍ය අනුග්‍රහක දායකත්වයක් අරගෙන දෙන්න."මහේන්ද්‍රා සමාගමෙන්"මේ ඉල්ලීම කරමු.ලබන සභාවේ දී මේ ඇගයීම කරමු කියන ඉල්ලීම කරනවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

උප සභාපතිතුමාගේ අදහස හොඳයි.අපි ඔය ආයතන සියල්ල සම්බන්ධ කරගෙන මතුගම කොට්ඨාශයේ  ජාතික මට්ටමට නොගියත් පළාත් මට්ටමට හෝ ගිහින් ජයග්‍රහණ ලබාගත්

දරුවන්ගේ ලැයිස්තුව එකතු කරගෙන ක්‍රමවත් වැඩපිළිවෙළක් සකසමු.මේ සඳහා ඔබතුමාලාගේ මැදිහත්වීම ලබාගෙන කමිටුවක් හෝ සකසාගෙන ඒක කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතාගේ යෝජනාව ඉතා වැදගත්.ඒ දරුවාගේ අනාගතය වෙනුවෙන් සුභාශිංෂනය පලකරනවා.එවැනි දක්ෂතා දක්වන දරුවන්ට දේශපාලන අධිකාරියත්,සභාවත් සහයෝගය දිය යුතු යි. අපි මේ ක්‍රීඩා උළෙල මගින් ඇත්තටම නව ක්‍රීඩකයන් හඳුනාගෙන කටයුතු කළ යුතු යි.ඊට අවශ්‍ය අනුග්‍රාහකත්වය ලබාදෙන වැඩපිළිවෙළ සකසන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත කුමාර මහතා**
අපේ කලාපවල ක්‍රීඩා සමාජ ගණනාවක් තිබුණා.අපේ ක්‍රීඩා සමාජවලින් බිහිවුණ දක්ෂ දරුවන් රැසක් ඉන්නවා.මේ ප්‍රදේශවල ඉන්න ඒ ක්‍රීඩා කරන දරුවන් මුළු ශ්‍රී ලංකාවම වෙනුවෙන් තමයි තරඟ කරලා දිනන්නේ. ඇතැම් විට දරුවන්ට ක්‍රීඩා කරන්න අවශ්‍ය ක්‍රීඩා පිටි පවා නැහැ.මේ දක්ෂතා තියෙන දරුවන්ට අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ ටිකක්වත් ලබාදෙන්න.මේ දරුවන්ගේ අනාගතය සාර්ථක කරගෙන ජාත්‍යන්තර මට්ටමේ තරඟ ජයග්‍රහණය කිරීමට අවශ්‍ය අනුග්‍රාහකත්වයක් මැදිහත්වෙලා ලබාදෙන මෙන් ඉල්ලීම කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී නිලූකා දර්ශනී මහත්මිය**
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතාගේ මේ යෝජනාව ඉතා වටිනවා.මොකද අපේ ප්‍රදේශවලත් ක්‍රීඩා කරන දක්ෂ දරුවන් බොහෝ ප්‍රමාණයක් ඉන්නවා.එනිසා හැම කොට්ඨාශයකම මේ දරුවා වගේ දක්ෂ දරුවන් හඳුනාගෙන ඒ සියලුම දරුවන්ට අවශ්‍ය සහයෝගය ලබා දීලා ඔවුන්ට ශක්තියක් වෙන්න කියන ඉල්ලීම කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**
මගේ යෝජනාව පිළිබඳ ව සියලු මන්ත්‍රීවරු එකඟතාවය පළ කරලා අදහස් ප්‍රකාශ කිරීම පිළිබඳ ව ස්තුතිය ප්‍රකාශ කරනවා.උප සභාපතිතුමා ගෙනාපු අදහස හොඳයි.මේ ක්‍රීඩකයාගේ හැකියාව තිබුණට මේ ක්‍රීඩකයාව දීර්ඝ කාලීනව නඩත්තු කිරීමේ අවශ්‍යතාවයක් මතුවෙලා තියෙනවා.ඔහුට ඒ ක්‍රීඩා කිරීමට අවශ්‍ය ශක්තිය ලබා ගැනීමට විටමින් වර්ග ආදිය ලබා ගැනීමේ අවශ්‍යතාවය තියෙනවා.මේ සඳහා මතුගම ප්‍රාදේශීය සභාව වශයෙන් කරන්න පුළුවන් දෙයක් තියෙනවා නම් ඒ දේ කරමු.

## 6.4 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා -:

6.4.1 සභාව සතු මාර්ග නඩත්තු කිරිම සඳහා නිසි වැඩ පිළිවෙක් සකස් කරන මෙන් ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා විසින් යෝජනා කරන ලදී.

6.4.2 සභාව තුළ සභාපතිතුමාගේ ඍජු මැදිහත්විම මත නිසි පාලනයක් ඇති කළයුතු බවට ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා විසින් යෝජනා කරන ලදී.

<u>තීරණය</u>

6.4.1 සභාව සතු මාර්ග නඩත්තු කිරිම සඳහා නිසි වැඩ පිළිවෙක් සකස් කරන මෙන් ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා

මන්ත්‍රිනී සීතා ඩයස් ජයසිංහ මහත්මිය විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

6.4.2 සභාව තුළ සභාපතිතුමාගේ සෘජු මැදිහත්වීම මත නිසි පාලනයක් ඇති කළයුතු බවට ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී සීතා ඩයස් ජයසිංහ මහත්මිය විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**6.4 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා**

6.4.1 යෝජනාවේ දී දැන් මේ මාර්ග විශාල වශයෙන් වළවල් හැදිලා.එනිසා මේ කාලයේ ගිහින් තාර දාලා ඒ වළවල් හදන වැඩපිළිවෙළක් සකස් කරන්න ඕන.අලුතෙන් පාරවල් සකස් කරන වැඩපිළිවෙලවල් මේ කාලයේ බොහොම අඩු යි.ඒ නිසා මේවා අපට තව අවුරුදු ගණනාවක් තියෙන්න කරගෙන යන්න පුළුවන් ලෙස හදන්න ඕන.නැතිනම් ඒ වළවල් විශාල වෙලා පාරේ ගමන් කරන්න බැරි තත්ත්වයට එනවා.ඒකෙන් මේ සභාව දෝෂාරෝපණයට ලක්වෙන්න පුළුවන් නිසා මේ පිළිබඳ ව අපි හොඳ වැඩපිළිවෙළක් හදලා මේ මාර්ග යම්කිසි ක්‍රමානුකූල ක්‍රමවේදයකට පිළිසකර කරන්න ඕන.ඒ වගේ ම ගොඩක් පාරවල තණකොළ කපන වැඩේවත් නිසි පරිදි සිදු නො වන නිසා විශාල වශයෙන් පාරවල් වැහෙන තරමට පත්වෙලා තියෙනවා.ඒ නිසා විදුලි බල්බ හයි කරනවා වගේ ම මේකත් ක්‍රවේදයකට කරගෙන යන්න කියලා මම යෝජනා කරනවා.

2 වන යෝජනාව වශයෙන් පසුගිය කාලයේ මේ සභාවේ සේවකයින් සහ සභාපතිතුමාගේ බොහෝ ප්‍රශ්න ඇති වුණා.අපට තව කෙටි කාලයයි තියෙන්නේ.එනිසා ඇත්තෙන්ම මේ කෙටි කාලය තුළ අපි එකමුතු ව යම්කිසි තියෙන ප්‍රශ්න හඳුනාගෙන සහයෝගයෙන් නිවැරදි දේ කරලා මේ සභාවේ තියෙන නරක නාමය නැති කරගෙන සමාජයට වැඩක් කරන්න පුළුවන් සභාවක් කරමු කියලා කියලා මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. සිරිසේන මහතා**

මාර්ග නඩත්තු කිරීමේ යෝජනාව නිසා මම කියන්නේ මාර්ග නඩත්තු කිරීමට සේවකයින් යෙදවීම පිළිබඳ ව ඇත්තට ම ගැටලුවක් තියෙනවා.මොකද මේ සේවකයන් උදෑසන ඒ ප්‍රදේශවලට යාමේදී විශාල ගැටළුවක් තියෙනවා.සමහර වෙලාවට පෙරවරු 10.00ට - පෙ.ව.11.00ට සමහර සේවකයන් සේවා සඳහා යන්නේ.ඒක නිසා ඒ පිළිබඳව නිසි කළමනාකරණයක් තියෙන්න ඕන.වැඩ පරිපාලනය පිළිබඳ ව පොඩි ගැටලුවක් දැනට මතුවෙලා තියනවා.එ නිසා මම ඔබතුමාගෙන් පොඩි ඉල්ලීමක් කරනවා,සේවකයින් වැඩ කරන්නේ නැ කියලා කතාවක් නැහැ.මගේ ප්‍රදේශයේ ගිය සතියේ වැඩක් කළා.ඒ ගිය සේවකයන් පැමිණි මොහොතේ සිට ම තමන්ගේ වැඩේ හරියට කරනවා.නමුත් මේ සේවකයෝ මෙතනින් යන වෙලාවයි වැරැද්ද.එ නිසා වැඩ කරන්න වෙලාවත් මදි.ඒ වැඩ කටයුතු අධික්ෂණය කරලා ඒ පිළිබඳ ව සොයා බලලා නියමිත වේලාවට එම සේවකයන් සේවයේ යොදවන මෙන් ඉල්ලා සිටිනවා.මාර්ග නඩත්තුව,විදුලි නඩත්තුව සහ කසළ බැහැර කිරීම යන ත්‍රිත්වය ම හරියාකාරව සිදු කිරීමට පරිපාලන නිලධාරීන් දැනුවත් කරලා ඒ වැඩ පිළිවෙළ නිසි අයුරින් ඉටු කිරීමට කටයුතු කිරීම තුළ තමයි අපේ වලදායිතාවයත් තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**

මේ දිනවල සියලු ම විහාරස්ථානවල කඨින පින්කම් තියෙනවා.ඉතින් අපේ මාර්ග පද්ධතිය එළිපෙහෙළි කිරීම පිළිබඳ ව ගැටලු තියෙනවා.අපි මේ සභාවට එන්න කලින් මංමාවත්

එළිපෙහෙළි කරලා,කාණු කපලා, ශුද්ධ පවිත්‍ර කරලා නිසි වැඩපිළිවෙළක් තිබුණා.මම දැන් කලකින් ඒ වැඩ පිළිබඳ දැක්කේ නැහැ.ඒ වැඩ කොටස ඉටු කිරීමට වැඩ පරීක්ෂකවරු විසින් සභාවේ සේවකයින් කොටසක් යෙදෙව්වා.නමුත් මේක ඇත්තටම කළ යුතු වැඩපිළිවෙලක්.මොකද සමහර ප්‍රදේශවල මාර්ගවල ඇත්තටම තණකොළ වැවිලා,පාරේ ගමන් කරන්න බැහැ. වාහනයක් ආවත් අයිනට වෙන්න බැහැ.ඇත්තටම මාර්ග පද්ධතිය ගත්තහම පාරේ වළවල් හැදිලා, වල්බිහිවෙලා.අපේ ප්‍රදේශය තුළ මාර්ග සංවර්ධන අධිකාරිය සහ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය යන ආයතන දෙකටම අයිති මාර්ග තියෙනවා. සභාවේ සේවකයින් ගිහින් ඒ මාර්ග කිසිම නඩත්තුවක් කරන්නේ නැහැ.ලේකම්තුමිය විශේෂයෙන් මේ ආයතන දෙක දැනුවත් කරන්න.විශේෂයෙන්ම නවුත්තුඩුවට යන පයාගල-අලුත්ගම්ගොඩ මාර්ගයේ ගමන් කිරීමට පවා අපහසු යි.ඒක පළාත්බද ,මාර්ග සංවර්ධන අධිකාරියට අයිති මාර්ගයක්.මේ මාර්ගයේ දෙපස කාණු ගොඩවෙලා.එ නිසා මේ පිළිබඳ ව සොයා බලා විශේෂයෙන් ම ලිඛිත ව මේ පිළිබඳ ව දැනුම් දීම කරන මෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී තුසිතා ප්‍රියංගනී මහත්මිය**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතාගේ 6.4.1 යෝජනාව සම්බන්ධ ව කතා කරන්නේ.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා කිව්වා වගේ අපේ ප්‍රදේශවලට මේ සේවකයෝ එනකොට දවල් වෙනවා.එතකොට වැඩ කරන්න ලැබෙන්නේ කෙටි වෙලාවක්.ඒ වගේ ම එක දවසයි එන්නෙත්.ඒ දිනටවත් ඒ අයගේ ශ්‍රමය නිසි පරිදි යොදා ගැනීමට ඒ අයව උදේ 8:30 වෙනකොටවත් අපේ ප්‍රදේශවලට එවන්න පුළුවන් නම් ඒ වැඩ ටික වෙලාවට කරගන්න පුළුවන්.

(මන්ත්‍රීවරුන්ගේ ඝෝෂාව නිසා අදහස් පැහැදිලි ව නොඇසේ )

ඒ වගේ ම මම එදා කිව්ව "ඉදිගස්තුඩුව" මාර්ගයේ පැත්තක් අද වෙනකොට එළිපෙහෙළි කරලා තියෙනවා.නමුත් අර තියෙන වේල්ල කොටසේ පැත්තක් එළි කරලා නැහැ.ඒකත් ඒ මාර්ගයේ ම කොටසක්.ඒ වේල්ල දෙපස විශාල ලෙස ගස් වැවිලා.ඒ ටිකත් ශුද්ධ පවිත්‍ර කරලා විදුලි බල්බ ටිකත් සම්පූර්ණ නැහැ,ඒ ටිකත් යොදලා මේ කටයුතු ඉටු කර දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත කුමාර මහතා**

6.4.1.යෝජනාව සම්බන්ධ ව කතා කිරීමේ දී මේ මන්ත්‍රීතුමිය කතා කළා අපේ ගම් පළාතේ මාර්ග පිළිබඳ ව.ඉදිගස්තුඩුව පාරේ ඒ වේල්ලේ බාගයක් ම දැන් එළිපෙහෙළි කර තිබුණා.ඒ වගේම කිහිප දෙනෙක් ම දැන් කිව්වා මේ දිනවල විහාරස්ථානවල කඨින උත්සව තියෙන නිසා මේ මාර්ගය එළිපෙහෙළි කිරීම මේ දිනවල ඉතා වැදගත් වෙනවා.ඒ වගේ ම මාර්ග නඩත්තුව සඳහා වැඩපිළිවෙළක් සකසන්න.ඔබතුමා ඒ සම්බන්ධ ව කටයුතු කළ නිසා ඒක බොහොම හොඳ දෙයක්.හොඳ දෙයක් කළොත් ඇත්තෙන්ම අපි මේ සභාවේ හොඳයි කියනවා.වැරද්දක් දැක්කොත් අපි මේක නිවැරදි කරන්නේ නෑ.එ නිසා බොහෝ දෙනා කතා කළේ 6.4.1යෝජනාව සම්බන්ධයෙනුයි.6.4.2 යෝජනාව පිළිබඳවත් අපි කතා කරන්න ඕන.සභාව තුළ සභාපතිතුමාගේ මැදිහත් වීම මත නිසි පරිපාලනයක් ඇති කර යුතු යි.සමහරක් අවස්ථාවලදී අපි දැක්කා අපි යෝජනාවක් දැම්මට පස්සේ ඒක ක්‍රියාත්මක කරද්දී අපිට ඒ පිළිබඳ ව නොදන්වා සිටියා.සමහර වෙලාවට අපේ ප්‍රදේශවල දෙයක් වෙනවා නම් ඔබතුමා ඇවිත් ඒක කරලා යනවා,ඒ කොට්ඨාෂයේ මන්ත්‍රීවරයා දන්නෙත් නැහැ.එවැනි දේවල් කරන එක හොඳ නැහැ.අපේ ප්‍රදේශවල ගත්තත් මහජනතාවගේ දේවල් ඉෂ්ට කරලා දෙන්න කියලා ආවට පස්සේ අපි ඒ ප්‍රදේශවල ඇවිදින නිසා මිනිසුන්ගේ අවශ්‍යතා දන්නවා.එ නිසා මේ මන්ත්‍රීවරු සමග එකතුවෙලා ඔබතුමා කටයුතු කරන්න.දැන් තව ඉතා ම කෙටි කාලයයි අපට

තියෙන්නේ.මේ න්‍යාය පත්‍රයට අනුව කටයුතු කරන්නේ නැතිනම් මම හිතන්නේ මේ සභාව තියෙන්න ඕන නෑ.මේක විසුරුවා හරින එක හොඳයි.මොකද ඒකට හේතුව අපේ මහජනතාවට කරන්න දෙයක් මෙතන ඉතුරුවෙලා නැතිනම් අපි මෙතන ඉන්න එකේ තේරුමක් නැහැ. සභාපතිතුමා ඉල්ලා අස් වෙන්න ඕන කියන එක මම දැනුත් කියනවා.ඒ වගේම ලේකම්තුමියත් ඉල්ලා අස් වෙන්න ඕන.මට ඒ දෙපළ සමඟ ම පෞද්ගලික තරහක් නැහැ.මම කියන්නේ තවදුරටත් මේ සභාවේ පාලනය නිසි පරිදි කරගෙන යන්න බැරි නම් මේ සභාව කරගෙන යන්න බැහැ.ඒ නිසා ඉල්ලා සිටිනවා ඉදිරියටවත් සභාවේ සභාපතිවරයා සහ මන්ත්‍රීවරු එකට එකතුව කටයුතු කළ යුතුයි.මම හිතනවා සභාපතිතුමාගේ ක්‍රියාකලාපය නිසා තමයි අපි අසරණ වෙලා තියෙන්නේ.මම ස්වාධීන වෙන්න ප්‍රධාන හේතුවත් ඒක.අපි ඇමතිවරු පස්සේ යන්නේ නැහැ.මහජනතාවට සේවය කරන්න මන්ත්‍රී ධූර අවශ්‍යාත් නැහැ.එ නිසා මේ සභාව විසුරුවාහරින එක මීට වඩා හොඳයි කියන එක මම කියනවා.

**6.5 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය සමිතවංශ හිමි විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා -:**

6.5.1 මතුගම නාරවිල මද්දෙගෙර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් කන්දහේන ගම්වාසින් දැනට පොදු කටයුතු සඳහා පරිහරණය කරන කන්දහේන ප්‍රජා ශාලා ගොඩනැගිල්ල සහිත අක්කර 1ක ඉඩම් ප්‍රමාණය මතුගම ප්‍රාදේශීය සභාවට පවරාගෙන එම කොටස පොදු කටයුතු හා ක්‍රීඩා පිටියක් ලෙස පවත්වාගෙන යාමට සුදුසු බවට ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි විසින් යෝජනා කරන ලදී.

6.5.2 මතුගම ප්‍රාදේශීය සභාවට අයත් සාරානන්ද මාවත ප්‍රධාන මාර්ගය වර්තමානය වන විට පසුගිය කාල සීමාව තුළ ජලනල එලීමේ ව්‍යාපෘතිය හේතු කොටගෙන විශාල වලවල් කිපයක් සෑදි ඇති බැවින් ඒ සඳහා අවධානය යොමු කර හැකි ඉක්මණික් තාර මිශ්‍ර කෝලාස් දමා සංවර්ධනය කර දෙන මෙන් ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි විසින් යෝජනා කරන ලදී.

6.5.3 වර්තමානය වන විට මතුගම ප්‍රාදේශීය සභාවේ වැඩ බලන ලේකම්වරිය ලෙස වැඩ කටයුතු සිදුකරන අයිරාංගනි තෙන්නකෝන් මහත්මිය ඉදිරියටත් මතුගම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරිය ලෙස කටයුතු සිදු කිරිම සුදුසු බවට ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි විසින් යෝජනා කරන ලදී.

<u>තීරණය</u>

6.5.1 මතුගම නාරවිල මද්දෙගෙර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් කන්දහේන ගම්වාසින් දැනට පොදු කටයුතු සඳහා පරිහරණය කරන කන්දහේන ප්‍රජා ශාලා ගොඩනැගිල්ල සහිත අක්කර 1ක ඉඩම් ප්‍රමාණය මතුගම ප්‍රාදේශීය සභාවට පවරාගෙන එම කොටස පොදු කටයුතු හා ක්‍රීඩා පිටියක් ලෙස පවත්වාගෙන යාමට සුදුසු බවට ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

6.5.2 මතුගම ප්‍රාදේශීය සභාවට අයත් සාරානන්ද මාවත ප්‍රධාන මාර්ගය වර්තමානය වන විට පසුගිය කාල සීමාව තුළ ජලනල එලීමේ ව්‍යාපෘතිය හේතු කොටගෙන විශාල වලවල් කිපයක් සෑදි ඇති බැවින් ඒ සඳහා අවධානය යොමු කර හැකි ඉක්මණික් තාර මිශ්‍ර කෝලාස් දමා සංවර්ධනය කර දෙන මෙන් ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි විසින් කරන

ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

6.5.3 වර්තමානය වන විට මතුගම ප්‍රාදේශීය සභාවේ වැඩ බලන ලේකම්වරිය ලෙස වැඩ කටයුතු සිදුකරන අයිරාංගනි තෙන්නකෝන් මහත්මිය ඉදිරියටත් මතුගම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරිය ලෙස කටයුතු සිදු කිරිම සුදුසු බවට ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජා නාරවිල සමිතවංශ හිමි විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා විසින් ස්ථිර කරන ලදින් සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජා නාරවිල සමිතවංශ හිමි**

6.5.1 යෝජනාවේදී මම හිතන්නේ මතුගම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට මද්දේගෙදර වතුයායේ අක්කර පන්සියයකට වඩා විශාල භූමි ප්‍රමාණයක් තියෙනවා.විශේෂයෙන් පසුගිය කාලසීමාව තුළ මේ මද්දේගෙදර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයිති ඉඩම් පිටස්තර පිරිසක් විසින් අක්කර 5-20ක් පමණ අරගෙන තියෙන නිසා ගමේ මිනිස්සුන්ට මේ ඉඩම් ටික අහිමි වෙලා යනවා.අපි උත්සාහයක යෙදුනා ගමේ මිනිසුන්ට මේ ඉඩම් ටික ලබාදෙන්න.සභාපතිතුමාටත් මේ පිළිබඳ ගම්වාසීන් ලිඛිත ඉල්ලීමක් කරලා තියෙනවා.ඒ වගේම සංවර්ධන කමිටු සභාපතිවරයා හැටියට ඒ මන්ත්‍රීතුමාවත් මේ පිළිබඳ ගම්වාසීන් දැනුවත් කරලා තියෙනවා.දැනට ප්‍රජා ශාලා භූමිය මද්දේගෙදර විහාරස්ථානය පිටුපස තියෙනවා.ඒ භූමියේ අක්කරයක ප්‍රමාණය තමයි කන්දහේන ජනතාව ඒ අයගේ පොදු කටයුතු සඳහා ඉල්ලන්නේ.එ නිසා මම ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා හැකි ඉක්මනින් මේ සඳහා මැදිහත් වෙලා අක්කරයක ප්‍රමාණය අරගෙන ඒ ප්‍රදේශයේ ජනතාවගේ පොදු කටයුතු සඳහා සභාව යටතේ,සභාවේ බලතල ඇතිව තියෙන පොදු ඉඩමක් ලෙස පවත්වාගෙන යැමට අවශ්‍ය කරන කටයුතු සලසා දෙන්න කියලා.

6.5.2 යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වීමේ දී "සාරානන්ද මාවත"ප්‍රධාන මාර්ගය පොඩි පාරක්.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කමිල් කුමාර මන්ත්‍රීතුමාගේ සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී රුවන්දි ත්‍රිමාන්න මහත්මියගේත්,මගේත් කොට්ඨාශවලට අයිති මාර්ගයක්.ඇත්තටම මේක සභාවේ වරදක් ලෙස මම දකින්නේ නැහැ.පසුගිය කාලයේ ජල නළ එලීම නිසා දෙපාරක් තුන් පාරක් හාරලා,මේ පාරවල් ටික විනාශ වෙලා ගියා.ඒ වුණත් අන්තිමේ දී ප්‍රාදේශීය සභාවට අයිති පාරක් නිසා සභාවට තමයි දෝෂාරෝපණය එන්නේ.එ නිසා මේ මාර්ගය විශාල පිරිසක් ගමන් කරන ප්‍රධාන මාර්ගයක්.දැන් මේකේ වළවල් හැරිලා ගමන් කිරීමට නොහැකි තත්ත්වයේ තියෙන්නේ.එ නිසා පාන්තිය හන්දියේ සිට බෝපිටිය පාසල අසල දක්වා මාර්ගයේ වළවල් හැරිලා කැඩිලා තියෙන තැන් හදලා ආරක්ෂා කරලා දෙන්න.මේ තියෙන තත්ත්වය මත අපට නැවත අලුතින් පාරක් කාපට් කර ගන්න හැකියාවක් නැහැ.ඒ නිසා තියෙන ටික ආරක්ෂා කරගන්න දැන්ම මැදිහත් වුණොත් හැකියාව තියෙනවා.ඒ සඳහා අවධානය යොමු කරන්න.

6.5.3 යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන්ගේ විවිධ අදහස් තියෙන්න පුළුවන්.ඒක ගැටළුවක් නැහැ. ප්‍රජාතන්ත්‍රවාදී රටක් හැටියට ඕනෑම කෙනෙකුට අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව තියෙනවා.මම හිතන්නේ මේකට මන්ත්‍රීවරු අදහස් දක්වයි.මතුගම ප්‍රාදේශීය සභාවේ දැනට වැඩ බලන ලේකම්වරිය හැටියට කටයුතු කරන අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය තවදුරටත් මේ සභාවේ ලේකම්වරිය හැටියට වැඩ කටයුතු සිදු කරන්න ඕන කියන එකයි මගේ අදහස වෙන්නේ.අඩුපාඩුකම් තියෙන්න පුළුවන්.නමුත් මේ ලේකම්තුමිය පමණක් නෙමෙයි පෙර සිටිය ලේකම්වරුන්ගේත් වැරදි අඩුපාඩු ඕනෑ තරම් තිබුණා.ඒ නිසා සර්ව සම්පූර්ණ

මිනිස්සු නැහැ.අඩුපාඩුකම් සිද්ධ වෙනවා.අපි සතුටු වෙනවා පසුගිය කාලයේ මන්ත්‍රීවරු එකතුවෙලා මේ සභාවේ තිබුණු යම් යම් දුර්වලකම් හඳාගත්තා.දූෂණ වංචා හඳුනාගත්තා.ඒවා හඳුනාගෙන වැඩ කටයුතු සිදු කළා.මම හිතන්නේ එහි ප්‍රතිඵල හැටියට මේ වෙනකොට දැඩිව චෝදනාවලට ලක් වුණු ආර්.අයි.මහතාත් මේ වන විට එම ධුරයෙන් මාරු කරන්න වැඩ කටයුතු කරලා තියෙනවා.මෙකේ වගකීම් ලේකම්තුමිය මත ම පටවන්න බැහැ.මේ යම් යම් රාජකාරි විවිධ අයට පවරලා තියෙනවා.අන්තිමේ දී ලේකම්තුමිය තමයි එහි වගකීම දැරිය යුත්තේ. තමන්ට පවන රාජකාරි සිදු කිරීමට සියලුම නිලධාරීන් බැඳිලා ඉන්නවා.ඒ නිසා වර්තමානය වන විට මේ මන්ත්‍රීවරුන්,සභාවේ නිලධාරීන්,සේවකයෝ භේදභින්න වී තිබෙනවා. මේවා නැති කරලා අපි හැමෝගෙම අරමුණ වෙන්න ඕන මිනිස්සුන්ට වැඩ කරන එකයි.ඒ ගමනට වෛරක්කාරයෝ හදාගෙන යන්න බැහැ.ඒ නිසා වැරදි දේ තිබෙනවා නම් නිවැරදි කරගෙන ඉදිරියට යමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී සීතා ඩයස් ජයසිංහ මහත්මිය**
ඔබවහන්සේ කියන දේවලින් එක දෙයක් මම අනුමත කරනවා.දැනට මේ සභාව තුළ යම් යම් ගැටලුකාරී තත්ත්වයන් පැන නැගිලා තියෙනවා. මම මේ විස්තර ටික හොයලා ආර්.අයි.මහත්තයා ගැන කියපු ටික එදා නීතියට නැගුවා නම්,එදා තීරණයක් ගත්තා නම් අද මෙතුමියට ඔය තත්වයට මුහුණ පාන්න වෙන්නේ නැහැ.එදා නොගත්ත තීරණයි අද විඳින්න වෙලා තියෙන්නේ.මට හරිම වේදනාවයි ඒ කතාව ගැන.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ ස්වාමීන් වහන්සේගේ යෝජනා අතරින් කන්දහේන ප්‍රදේශයේ ඉඩම් සම්බන්ධයෙන් ඉදිරිපත් කළ අදහස් සම්බන්ධයෙන් ප්‍රජා ශාලාවක් ඉදිකිරීම සඳහා ඉඩමක් වෙන් කර දෙන මෙන් කරපු යෝජනාවට අපේ එකඟතාවය පළ කරන බව මේ වෙලාවේ දී ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයා හැටියට මම ප්‍රකාශ කරනවා.ස්වාමීන් වහන්සේ කිව්වා වගේ කන්දහේන ප්‍රදේශයේ ඉඩම් මංකොල්ලය පිළිබඳ ව මම මීට පෙර මේ සභාව දැනුවත් කළා.කන්දහේන ප්‍රදේශයේ මේ ඉඩම් මහා පරිමාණයෙන් දේශපාලන බලවතුන් ඇවිත් ඇල්ලුවා.කන්දහේන පන්සලේ හාමුදුරුවෝ අවස්ථා ගණනාවක දී ම මේ පිළිබඳ ව හෙළිදරව් කළා.ඒ සඳහා ගත්ත තීරණයක් නැහැ.පිටස්තර දේශපාලන බලපුළුවන්කාරකම් තියෙන අය මේ ඉඩම් ටික ගත්තේ.අවසාන වශයෙන් ප්‍රජා ශාලාවට හෝ ඒ ඉඩම ඉතුරු කරගන්න අපි උත්සාහයක් දරන එක වටිනවා.මේ යෝජනාව සඳහා අපි එකඟ වන බව මේ මොහොතේ ප්‍රකාශ කරනවා.

උන්වහන්සේගේ අනෙක් යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වීමේ දී මේ සභාවේ අපේ ලේකම්තුමිය තවදුරටත් රැඳී ඉන්න ඕනේ කියලයි මමත් කියන්නේ.මමත් රජයේ සේවකයෙක් වශයෙන් රජයේ සේවකයින් අතින් අඩුපාඩුකම් සිදුවෙනවා.වැරදි සිදුවෙනවා,නොසලකා හැරීම් සිදු වෙනවා,ඒ වගකීම අපි දන්නවා.හාමුදුරුවෝ කිව්වා වගේ මේ නිලධාරියා අඩුපාඩුකම් හින්දා ම මෙතනින් ඉවත් කරන්න ඕනෙද කියන ප්‍රශ්නය මතු වෙනවා.මීට වඩා නිලධාරියා අවංක ව විධිමත් ව කටයුතු කරලා තමන්ගේ වැඩ කොටස නිසි ආකාරව ඉෂ්ට කරන්න කටයුතු කරන්න ඕන.මොකද,මේක ප්‍රාදේශීය සභාව.මේක පුංචි ම දේශපාලන අධිකාරිය.මේක පාලනය වෙන්නේ ජනතා ඡන්දයෙන් පත්වූ මන්ත්‍රීවරුන්ගෙන්.මෙකේ ඉන්න ඉහළම තැනැත්තා සභාපතිතුමා.එතුමා මහජන ඡන්දයෙන් පත් වූ කෙනෙක්.සභාපතිවරයා හැටියට හෙට වෙන කෙනෙක් පත් වෙන්නත් පුළුවන්.එනිසා සභාපති පුටුවේ වාඩිවෙලා ඉන්නකොට සභාව පාලනය කරන්න අවැසි නීති රීති,චක්‍රලේඛන ආදිය පිළිබඳ ව දැනුමක් අවශ්‍යයි.කතා කරන මටත් බෑ එක තැනක වාඩිවෙලා වෙලා හරියට මේක කරන්න.මේ නිලධාරීන්ට ආයතනවල වගකිවයුතු

නිලධාරීන් වශයෙන් වගකීමක් තියෙනවා.මොන අඩු පාඩුකම් අපේ අතින් සිදු වුණත් විශේෂයෙන් සලකා බලලා නිවැරදි ලෙස කටයුතු කරන්න ඕන.ඒකත් ඒ නිලධාරීන්ගෙන් කෙරෙන්නේ නැතිනම් ඒක ගැටලුවක්.

එ නිසා ස්වාමීන් වහන්සේ කිව්වා වගේ අපට නිලධාරීන් මාරු කරන එක නෙමේ මේ වෙලාවේ කරගන්න ඕන, ඉන්න නිලධාරියාව හදාගන්න එක.මොකද, එහෙම නොවුනොත් නිලධාරීන්ගෙන් වෙන අඩුපාඩුවලටත් අපෙන් බැනුම් අහන්නේ සභාපතිතුමා.මේ සභාවේ දී එතුමා තමයි අපේ වගකිවයුතු ඉහළ ම නිලධාරියා.මතුගම ජනතාවගේ ඉහළ ම වගකීම දෙවුර මත පැට වෙලා තියෙන්නේ එතුමාගේ.එනිසා මේ නිලධාරීන් කරන වැරදි අඩුපාඩු සියල්ල අවසානයේ එන්නේ සභාපතිතුමාට.මේ නිලධාරීන්ගේ දෝෂ අඩුපාඩුකම් නිසා සභාපතිතුමා සහ අපි අතරත් මතභේද ඇති වෙලා තියෙනවා.මේ නිලධාරිනිය ඉන්න ඕන.හැබැයි මේ නිලධාරිනියගේ අඩුපාඩුකම් හදාගන්න ඕන.මේ නිලධාරීන්ගේ දෝෂ නිසා තවදුරටත් සභාපතිතුමා සහ අපි අතර ගැටුමක් ඇති වෙන්න ඉඩ තියන්න එපා.අපි කියන්නේ නෑ ලේකම්තුමිය මාරු කරලා,සභාපතිතුමා මාරු කරලා එක්කෙනෙක්ගේ පිට මේ වුණ අඩුපාඩුකම්වල වරද පටවන්න කියලා.එක්කෙනෙක් විතරක් මේවාට වග කියන්න ඕන නෑ.එක්කෙනෙක් අයින් කරලා මේ තනතුරට තවත් කෙනෙක් ආවම එයා හැම විටම නිවැරදි දේම කරයි කියලා අපි හිතන්නේ කොහොම ද? ඒ එන නිලධාරියා අතිනුත් දවසක වැරදි වෙන්න පුළුවන්. එතකොට අපි ගන්න ක්‍රියා මාර්ගය මොකක් ද? ඒ නිසා මේ අපි ඉන්න අවසාන කාල සීමාවේ දැන් අපි කරන්න ඕන තනතුරු ටික රැකගෙන, අපි අතර විරසක අමනාපකම් තියෙනවා නම් ඒවා දුරු කරලා අඩුපාඩුකම් වුණා නම් ඒ දෝෂ හදාගෙන ඉදිරියට යන එකයි.එ නිසා අප අතර සමගිය රැක ගනිමු කියන ඉල්ලීම කරන අතර ම ස්වාමීන් වහන්සේ ගෙනා සියලුම යෝජනා සම්බන්ධයෙන් මම එකඟ වන බව ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

අපේ ස්වාමීන් වහන්සේ ගෙනා 6.5.3 යෝජනාව යටතේ ඒ කතා කරපු යම් යම් කාරණා සමග එකඟතාවකට එන්න පුලුවන් වුණත් අපේ හාමුදුරුවනේ,මේක පුහුණු පාසලක් නෙමෙයි.මම දිගින් දිගටම මේ සභාවේ කතා කළේ සුදුසුකම් තියෙන තැන්වලට සුදුසුකම් තියෙන අය එන්න ඕන කියන තැනයි මම හිටියේ.මේ තනතුරුවලට ඒ ඒ පුද්ගලයන් පත් කරලා තියෙන්නේ ඒ ඒ තනතුරුවලට තියෙන සුදුසුකම් එක්ක බලලා,ඒ ඒ විභාග සමත් වූ පුද්ගලයන්ව යි.ඒ නිසා සුදුසුකම් තියෙන කෙනෙක් මෙ තැනට පත් වුණාම ඒ තියෙන ප්‍රශ්න අඩු වෙනවා.අනික රජයේ සේවකයෙක් වශයෙන් ගත්තාම මේක ජනතා බදු මුදල්වලින් යැපෙන, ජනතාවට සේවයක් කරන්න තියෙන සභාවක්.අපි මේ එකතු කරන්නේ මිනිස්සුන්ගේ සල්ලි.මේ මිනිස්සුන්ට සේවයක් සපයන්න බැරි නිසා තමයි මේ ප්‍රශ්න ඇතිවෙලා තියෙන්නේ.මේ ආයතනයේ ආර්.අයි. මහත්තයාව මාරු කරන්න කිව්වා ම ඒ නිලධාරියා මාරුවීමේ ලියුම භාරගන්නේ නැහැ.එතකොට මේකේ ක්ෂේත්‍ර කම්කරුවෙක් මාරු කරගන්න ලියුම දුන්නා.ඒක ඔහු බාර ගත්තේ නැහැ.මේ පරිපාලනයේ නුසුදුසු බව නිසාමයි මේ තැනට පත්වෙලා තියෙන්නේ.ආයතනයේ පහළ ම තලයේ ඉන්න සේවකයෙක් ආයතනයෙන් වෙනත් ආයතනයකට මාරු කරගන්න බැරි නම් ඒ සභාපති ධූරයෙන් හෝ ලේකම් ධූරයෙන් වැඩක් තියෙනවා ද?අපි අහන්නේ ඒකයි.මේක ඉදිරියට ගෙනියන්න මේ සභාපතිතුමාටයි ලේකම්තුමියටයි පුළුවන් ද කියන එකයි ප්‍රශ්නය. සභාවකින් කරන්න තියෙන දේවලින් බොහෝ ප්‍රමාණයක් අද වෙනකොට මග හැරිලා.ඒවා කරන්න අවශ්‍ය දැනුමයි නැත්තේ.ලේකම්තුමිය එක්ක අපේ තරහක් නෑ.මේ ලේකම්තුමිය වෙන ආයතනයකට ගියත් රජයේ සේවකයෙක් හැටියට වැඩ කරන්න පුළුවන්.නමුත් සුදුසුකම් නැති නිලධාරියෙක් මේකේ පරිපාලනය භාර ගත්තාම මේකේ අක්‍රමිකතා වැඩි වෙනවා.

අපි දිගින් දිගටම පෙන්නුවේ මේ අක්‍රමිකතා යි.අදටත් ගත්ත තීරණයක් තියෙනවා ද?සභාවේ මන්ත්‍රීවරයෙක් ප්‍රශ්නයක් ඇහුවම මේ සභාවේ ඉන්න නිලධාරීන් කවුරුවත් ඒක දන්නේ නැහැ.මන්ත්‍රීවරු ඕන මේ ප්‍රශ්න හැම එකම හොය හොයා කියන්න.මේ වගේ වගකීම ගන්න තියෙන්නේ අපිට ද? ලේකම් කෙනෙක්ගේ වගකීමක් තියෙනවා.පරිපාලනයට සුදුසුකම් තියෙන ලේකම් කෙනෙක් ගේන්න හැදුවේ ඒකයි.එතනින් එහාට ගිහින් ලේකම්තුමිය සුදුසුයි කියලා හිතනවා නම්, අපට ප්‍රශ්නයක් නැහැ, තියාගන්න.නමුත් මේ මන්ත්‍රීවරුන් හැල්ලුවට ලක් නොවන විදියට වැඩ කරන්න එපා කියන ඉල්ලීම කරනවා.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**

කෙසේ වෙතත් අපට ලේකම්තුමිය සමග ගැටළුවක් නැහැ.මේ ඉන්න අනිත් මන්ත්‍රීවරු තම තමන්ගේ අදහස් ප්‍රකාශ කරාට ඒ අයටත් ලේකම්තුමිය සමග ප්‍රශ්නයක් නැහැ.මේ වැඩපිළිවෙළ ගැන ලේකම්තුමිය හොඳ වැඩියි.ඇත්තට ම ඕන එකක් කිව්වොත් අත්සන් කරනවා.මේක ලේකම්තුමියට මම දෙන අවවාදයක්,උපදෙසක්.ඒ නිසා ලේකම්තුමිය අද සිට මේ නීත්‍යානුකූලව කෙරෙන දේකට මිස අත්සන් කරන්න එපා.මේ හාමුදුරුවෝ ලේකම්තුමියට බොහොම හිතවත්.ඒ නිසා ගෙනාව මේ යෝජනාවට මමත් මනාප යි.අපේත් පෞද්ගලික තරහක් නැහැ.මේ ඉන්න සභාපතිතුමා සමගත් අපේ කිසිම තරහක් නැහැ.මේ නිලධාරීන් කරන වැඩවලට තමයි අපි තරහ ගන්නේ.ඒ නිසා මේ සියල්ල කියන පලියට කරන්න යන්න එපා.අලුත් නිලධාරීන් කරන වැඩ පිළිබඳ ව ටිකත් අවධානයෙන් ඉන්න.නැතිනම් මේ වැරදිවලට ඔබතුමියත් හවුල් වෙනවා. නීත්‍යානුකූල පනත අනුව ඔබතුමියට බලය තියෙනවා,එහෙම නීත්‍යානුකූල දේට පමණක් අත්සන් කරන්න.අපි වැඩක් කිව්වොත් ඒ වැඩේ ඔබතුමිය බොහොම සාධාරණව ඉෂ්ඨ කරනවා.ඒ නිසා වෙන්න ඇති හාමුදුරුවෝ මේ යෝජනාව ගේන්න ඇත්තේත්.ඉතින් මේ ලේකම්තුමියට අපි ඉන්න කාලය තුළ ඉන්න ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී චමිලානි රුවන්දි ත්‍රිමාන්න මහත්මිය**

අපේ ස්වාමීන් වහන්සේ ඉදිරිපත් කරපු 6.5.1 යෝජනාව සම්බන්ධයෙන් පොඩි අදහසක් ඉදිරිපත් කරන්න ඕන.මමත් නියෝජනය කරන බෝපිටියේ සාරානන්ද මාවත,බෝපිටිය පාසල අසල ඉඳන් පාන්තිය හන්දියට වෙනකම් ම ජල නළ යෙදීම නිසා විශාල වශයෙන් වළවල් හැදිලා විනාශ වෙලා තියෙනවා.මම මේ සභාපතිතුමා,ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයට විශේෂ ස්තුතියක් කරන්න ඕන.පසුගිය දවසක අපි ඉල්ලීමක් කළා නාරවිල බෝපිටිය අසල පාලම් ඇන්ද කැඩිලා විශාල හානියක් වෙලා තියෙනවා.ඒක කඩිනමින් පිළිසකර කරන්න කියලා.මේ වෙනකොට වැඩ කටයුතු ආරම්භ කරලා තියෙනවා.ඒ පිළිබඳව ගෞරවනීය ස්තුතිය මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.ඒ වගේම මේ සාරානන්ද මාවත දෙපස කැලෑව එළිපෙහෙළි කරලා දැනට පස් ටිකක් හෝ දාලා තාවකාලිකව හරි මේ මාර්ගය පිළිසකර කරලා දෙන්න කියන ඉල්ලීම කරනවා.

6.5.3 යෝජනාව ඔස්සේ අපටත් ලේකම්තුමියගෙන් ඉල්ලීමක් කරන්න තියෙන්නේ,දිගින් දිගට ම පසුගිය කාලයේදී සභාපතිතුමාට සහ ලේකම්තුමියට චෝදනා එල්ල වුණේ ඔබතුමන්ලා නිලධාරීන් රකින්න ගිහිල්ලා සභාවේ තීන්දු තීරණ ගන්න කොට තිබුණු අක්‍රමිකතාවය මත තමයි.ක්ෂේත්‍ර කම්කරුවෙක්ගේ ස්ථාන මාරුවක් කරන්නවත් පුළුවන් කමක් නැහැ.මේ වගේ ගැටළු මීට පස්සේ නොවෙන්න කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනවා.තීන්දු තීරණ ගන්නකොට බයවෙන්න එපා.ඔබතුමියට ඒ අවශ්‍ය බලතල තියෙනවා.ඒ බලතල අනුව නිසි පරිදි තීන්දු තීරණ ගන්න.එතකොට මේ ප්‍රශ්න බොහෝ දුරට නිරාකරණය වෙලා යාවි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**

මේ 6.5.3 යෝජනාව ඇත්තට ම මම දකින්නේ මේ සභාව හෑල්ලුවට ලක් කරන්න දාපු යෝජනාවක්.මොකද පසුගිය සභා වාර ගණනාවක් පුරාවට අපි මේ සභාවේ කතා කළා,සැලසුම් හැදුවා,කමිටු පත් කළා.ඊට පස්සේ මේ වංචා දූෂණ නවත්වන්න කතා කළා.ඇත්තට ම අපි මේ මතු වුණ ගැටළුවලට විසඳුම් සෙවීම සඳහා කමිටු පත් කරගෙන ඒ මගින් වාර්තා ඉදිරිපත් කළා.ඒ හැම අවස්ථාවකදී ම වැරදිකාරයෝ වුණ දෙපළක් හිටියා.මේ සභාපතිතුමාට සහ ලේකම්තුමියට අපි වැරැද්ද පැටෙව්වා.අපි විමර්ශන නිලධාරීන් ගෙනත් මේක කතා කළා. අද මේ සභාවේ පහළ ඉන්න සේවකයෙක්ගේ ස්ථාන මාරු කරලා ඇති. නමුත් මේක නෙවෙයි විය යුත්තේ.ඔබතුමියගේ අඩුපාඩු හදාගෙන ඉදිරියට යන්න කියලා ලේකම්තුමියට හැදෙන්න මන්ත්‍රීවරු උපදෙස් දෙනවා.නමුත් පහල ඉන්න සේවකයන්ට එහෙම උපදෙස් දෙන්න කවුරුත් නැහැ.ඒ ක්‍රමවේදය වැරදියි.අපි මෙතන කතා කරන්නේ ලේකම්තුමිය සමඟ පෞද්ගලික ගැටළුවක් විසදා ගන්න නෙමෙයි. ඔබතුමියගේ පරිපාලනයේ සහ අධීක්ෂණයේ තියෙන අඩුපාඩුවක් පිළිබඳව කතා කරන්නේ.ඒ අඩුපාඩු නිසා මේ සභාව අයාලයේ යන තත්ත්වයට පත්වෙලා තියෙන්නේ.

තමන්ගේ වැරදි පෙන්වා දෙන කොට ඒක හදාගන්න.සභාවෙන් එපිට මහජනතාව විසින් පත්කළ නියෝජිතයෝ ලෙස තමයි මේ තිස් හතර දෙනෙක් ඇවිත් කරුණු ප්‍රකාශ කරන්නේ.ඒ වගේ ම පසුගිය කාලය පුරාවට ම මේ තිස් හතර දෙනාම තමන්ගේ හෘද සාක්ෂියට එකඟ ව කරුණු ප්‍රකාශ කළා.මේ සභාවේ අවස්ථා ගණනාවකදී ම වංචා දූෂණ ආදිය සිදු වූ නිසා විමර්ශන නිලධාරීන් කැඳවලා අවශ්‍ය පරීක්ෂණ කළා.මේ ලේකම්තුමියගේ අධීක්ෂණ කටයුතු ආදියේ ගැටළු පවතින්න ඇති.ඒ චෝදනාවලින් නිදහස් වීමට අපි කිව්වට බැහැ.පළාත් පාලන කොමසාරිස්වරිය, විමර්ශන නිලධාරීන් ඒ පිළිබඳ පරීක්ෂණ කරාවි.අපට ඒකට කරන්න දෙයක් නැහැ.අපි කිව්වට එහෙම කරන්නත් බැහැ.අපි මේ වැරදි පෙන්වා දුන්නට නීත්‍යානුකූල පැත්තට ගියේ නැහැ, ලේකම්තුමියට ස්ථාන මාරුවීම් කරන්න ගියේ නැහැ.අපි හිතුවේ මේ අඩුපාඩු හදා ගනියි කියලයි.දිගටම මේ කටයුත්ත නම් වෙන්නේ ඒක මතුගම ජනතාවට කරන ලොකු අසාධාරණයක්.අපි මේ මතුගම හදලා යන්නේ. අපිට අපේ යුතුකම නොකර ජනතාවට බොරු කරන්න බැහැ.තම තමන්ගේ වැරදි හඳුනාගෙන වෙනස් වෙන්න ඕන.එහෙම නොවී දිගටම මේ කටයුත්ත නම් කරගෙන යන්නේ නිදහසට කරුණු දෙන්න බැහැ.පෙර හිටිය ලේකම්තුමා ඉවත් කරලා මෙතුමිය ලේකම් තනතුරට ගේන්න දේශපාලන හස්තයක් බලපෑවා.ඒ නිසා එතුමියට නිදහස් වෙන්න බැහැ මේ දේශපාලන හස්තයෙන්.එතුමිය අනිවාර්යෙන් සභාපතිතුමා කරන ඒ වැඩසටහන ක්‍රියාත්මක කළ යුතු වෙනවා.දැන් මේ අනෙක් නිලධාරීන් කළ වැරදි ලේකම්තුමියගේ කර මත තමයි පැට වෙන්නේ.පෞද්ගලික ගැටළු අපේ අතර නැහැ.නමුත් මෙතුමියගේ පරිපාලන ගැටලු දිගටම තිබුණා.කමිටු වාර්තා බැලුවාම ඇස් පියාගෙන ඉන්න බැහැ.මොකද අපි කැමති නැහැ රජයේ නිලධාරියෙක් අපහසුතාවට පත් වෙනවාට.ඒ නිසා තමන්ගේ රාජකාරිය නිවැරදිව කරන්න ඕන.මේ ආයතනය තුළ තමන් රාජ්‍ය නිලධාරියෙක් වශයෙන් නායකත්වය දෙනවා නම් පහළ ඉන්න සේවකයින් තමන්ගේ අණසකට අරගෙන ඒ වගකීම් නිසි අයුරින් ඉටු කරලා ඒ යුතුකම කරන්න ඕන.මේ යෝජනාව සම්බන්ධයෙන් මම මගේ පෞද්ගලික විරෝධතාවය ප්‍රකාශ කරනවා,මොකද කමිටුවක වාර්තාවක් ඉදිරිපත් කරපු මට බැහැ හෘදසාක්ෂියට එකඟව ඊට සහය දෙන්න.ඒ වගේම අවශ්‍ය නම් ඒ වෙනුවෙන් අදහස් ප්‍රකාශ කිරීමටත් කැමති බව ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත කුමාර මහතා**

ස්වාමීන් වහන්සේගේ 6.5.3 යෝජනාව සම්බන්ධයෙන් අදහස් දක්වන්නේ.හාමුදුරුවන්ගේ හිත උණු වන කෙනෙක්.ඒ බව මම ඉස්සර ඉඳන් ම දන්නවා. ධර්මය පැත්තෙන් ගත්තොත් ඒක

හරි.නමුත් හාමුදුරුවෝ මීට පෙර වතා ගණනාවක් කිව්වා,යම් යම් අවස්ථාවල ලේකම්තුමිය ද ඇතුළු ව නිලධාරීන් සභාපතිතුමාට තියෙන ගෞරවය නොපෙන්වන බව.ඊට පසු ව අවුරුද්ද ලබලා ඒ උත්සවය වෙලාවෙදි නිලධාරීන් සභාපතිතුමාට කතා කරන්න දුන්නේ අන්තිමට.ඒ වගේ ම කොම්පෝස්ට් අංගනය පිළිබඳ ව සොයන්න කමිටුවක් දැම්මා.ඒ කමිටු දැම්මේ ඇයි?මේ මන්ත්‍රීවරු ඒ කමිටුවලට සහභාගී වෙලා තමන්ගේ කාලය වැය කරලා ඒ කමිටු වාර්තා බොහොම කැපවීමෙන් සකස් කරලා මෙවැනි වැරදි අඩුපාඩු සිදු වූ බව සොයා ගත්තා.අපට අවශ්‍ය කරන්නේ මේක.දැන් මේ රටේ දේශපාලනඥයින් සහ ජනතාව අතර දැඩි අර්බුදයක් පැන නැගිලා තියෙන්නේ.එතකොට මේ කළමනාකාරිත්වයේ වැරදි අඩුපාඩු නිසා තමයි මිනිසුන් අද අපට බනින,ගහන තත්ත්වයට පත්වුණේ.අපේ ගෙවල් දොරවල් විනාශ කරන තත්ත්වයට පත්වුණේ.එදා නිලධාරීන් මන්ත්‍රීවරයාටයි වැරැද්ද පැටව්වේ.මම කතා කරන්නේ මගේ ප්‍රදේශය පිළිබඳ ව.අපි ආවේ මහජනතාවට සේවය කරන්න.දැන් අවුරුදු හතරහමාරක් ම අපි හිටියා.දැන් අලුතින් නිලධාරීන් හදන්න,වැරදි නිවැරදි කර කර ඉන්න කාලයක් නැහැ.ඒ නිසා මේක හැදෙන්නේ නැහැ.හාමුදුරුවන්ගේ යෝජනාව අනුව අපි මෙතුමිය තියා ගත්තොත් ඒ වරද්ද පෙන්වන්න කෙනෙක් නැහැ.මේ සභාවේ කිසිදු වැඩපිළිවෙළක් සාර්ථක නැහැ.සභාපතිවරයාත්, ලේකම්තුමියත් සාර්ථක නැති බව මගේ පෞද්ගලික මතය යි.මේ අයගේ පරිපාලන දුර්වලතා නිසා තමයි මෙහෙම වුණේ.ඉතින් තවදුරටත් මේ අයව තියා ගැනීම සුදුසු ද?අපි කියන්නේ ඒකයි.ඉදිරි පරිපාලන කටයුතු ටිකක් මේ විදියටම තමයි යන්නේ.එ නිසා ලේකම්තුමිය හදාගෙන අපි යා යුතු නැහැ.එතුමියට පුළුවන් තවත් තැනකට ගිහින් වැඩ කරන්න.මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට වැඩක් කරන්න පුළුවන් ලේකම්තුමෙක් හෝ ලේකම්තුමියක්,හොඳ සභාපතිවරයවරයෙක් පත් කරන්න ඕන කියන එකයි මගේ මතය වෙන්නේ.ජනතාවට ඉදිරි මාස කිහිපය වත් සේවයක්,සාධාරණයක් ඉටු කිරීම සඳහා මේ ලේකම්තුමිය ඉවත් විය යුතුමයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී තුසිතා ප්‍රියංගනී මහත්මිය**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත කුමාර මහතා කිව්වා වගේ අපේ ප්‍රදේශයේත් පෙර පාසල්වල උත්සව තිබුණා.ඒ වේලාවේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත කුමාර මහතා,මම සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී නිලූකා දර්ශනී මහත්මියත් මේ කොට්ඨාශ නියෝජනය කරනවා.නමුත් අපි තුන්දෙනාටම ඒ උත්සවයට සහභාගී වෙන්න ඒ පිළිබඳ ව දැනුවත් කලේ නැහැ.අපි ඒ පිළිබඳ ව සමාජ මාධ්‍යවලිනුයි දැක්කේ. මම ගල්මත්ත කාර්යාලයට දුරකථන ඇමතුමක් අරගෙනත් ඇහුවා,අපි මන්ත්‍රීවරු තිදෙනාම නැතුව ඇයි එහෙම කළේ කියලා.නමුත් ඒවාට උත්තර නැහැ.ඇත්තට ම ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත කුමාර මහතාගේ කතාවට මම ගරු කරනවා.ඒක අනුමතත් කරනවා.ගම්වල මෙහෙම කරන කොට අපි හැල්ලුවට ලක්වෙනවා.එ නිසා ලේකම්තුමිය ඒවා ගැන වැඩි අවධානයක් යොමු කරන්න ඕන.අපි ඉන්න කාලසීමාවේ හෝ මේ ගරුත්වය ආරක්ෂා කරගෙන ඉන්න අපට අවකාශය හදලා දෙන්න ඕන.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා**

6.5.3 යෝජනාව සම්බන්ධ ව අදහස් දක්වද්දී මුලින් ම මේ යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධව මම ස්වාමීන් වහන්සේට ස්තුතිවන්ත වෙනවා.මේක ගොඩක් කතා කරන්න තියෙන යෝජනාවක්.මම දකින විදිහට සභාපතිතුමා සහ ලේකම්තුමිය යන දෙදෙනාම අසාර්ථක යි.මේකේ අපිට කාරණා කිහිපයක් ම කතා කරන්න පුළුවන්.කොම්පෝස්ට් අංගනය සම්බන්ධ ව කතා කළා.මේ සභාව මේ තත්ත්වයට එනකන් බොහෝ වැරදි ප්‍රමාණයක් සිදුවෙලා තියෙනවා.ලේකම්තුමිය සම්බන්ධ ව ගත්තාම කොම්පෝස්ට් අංගනය සම්බන්ධ ව එදා ඉඳලා කිසිම වාර්තාවක් නැහැ.එහි වැරැද්ද ලේකම්තුමිය මතට ආවා.මේක දේශපාලනික

ආයතනයක්.එතකොට සභාපතිවරයාට මේ සියලු දෙනාම යට යි.අපි ලේකම්තුමියට මේ සභාව පරිපාලනය කරන්න දීලා බලාගෙන ඉන්නවා නම් අපි මන්ත්‍රීවරු 34 මෙතනට එන්න ඕන නැහැ.

අපි හැමෝටම වගකීමක් තියෙනවා.සභාපතිවරයාටත් ලොකු වගකීමක් තියෙනවා.ඒ වගේම විශාල බලයක් තියෙනවා.එතකොට විශාල බලතල තියෙන සභාපතිවරයෙක් මේ ඉන්නේ.ලේකම් තනතුර මේ සභාපතිතුමාට යටත්.එතකොට තීන්දු තීරණ ගැනීමේ දී ලේකම් මේ දේශපාලනයට යටත්වයි තීන්දු තීරණ ගන්න වෙන්නේ.ලේකම් කෙනෙක් මාරු කරනවද තියාගන්නවද කියන දේ සභාපතිතුමාට තීරණය කරන්න පුළුවන්.එවැනි වටපිටාවක මේ සභාවේ වංචා දූෂණ හොරකම් සියල්ල ගත්තොත් ඒ පිළිබඳ ව සභාපතිතුමා හෝ ලේකම්තුමිය යන දෙදෙනාම දන්නේ නැහැ.ඒ වගේම මේ කිසිම සේවකයෙක් මේ තනතුරුවලට ගරුත්වයක් දක්වන්නේ නැහැ.එ වැනි වටපිටාවක මේ සභාව තියෙන්නේ.එතකොට ලේකම්තුමිය මාරු කරලා මේ සභාව හදාගන්න පුලුවන් ද කියන එක අපට ප්‍රශ්නයක්.ලේකම්තුමිය පමණක් නෙවේ මේ සභාවේ ඉන්න සියයට අනුවක් පමණ නිලධාරීන්ගේ ස්ථාන මාරු කරන්න වෙනවා එහෙනම්.මම මේ ලේකම්තුමියගේ වැරදි නිවැරදි කරන්න හදනවා නෙමෙයි.මේ දෙදෙනා ම වැරදියි කියලා මම කලින්ම කිව්වේ ඒකයි.

ආයතනයක ප්‍රධානියෙක් වුණාට පස්සේ මම දැනගන්න ඕන මේක පාලනය කරන්නේ කොහොමද කියලා.මේ නිලධාරීන් තමන්ගේ වගකීම ඉෂ්ට කරන්නේ නැතිනම් ඔවුන්ට දඬුවම් දෙන්න ඕන.අඩු ගාණේ ඉදිරියටවත් මේ සිදු වූ වැරැදි ටික නවත්තලා මේ සභාව හදන්න ඕන.ඒ නිසා මේ යෝජනාවට මම එකඟයි.මේ නිසා සභාපතිතුමාගෙන් සහ ලේකම්තුමියගෙන් මම ඉල්ලා සිටිනවා සෘජු තීන්දු තීරණ ගන්න කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා**
6.5.2 ස්වාමින්වහන්සේ ඉදිරිපත් කළ යෝජනාව අපේ ප්‍රදේශයට අදාළ යි.මේ මාර්ග ගත්තොත් ගොඩක් තැන්වල මල් ඉන්දලා, යන්න එන්නවත් බැහැ.වාහනයක් යන්න එන්න පුළුවන් විදිහට මේ පාර නිසි පරිදි පිළිසකර කරලා දුන්නොත් විශාල ඉඩ ප්‍රමාණයක් එනවා.ඒ පිළිබඳ සොයා බලා කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම 6.5.3 යෝජනාව යටතේ කතා කළොත් ඇත්තටම මේක මෑත කාලයේ ආව අර්බුදයක් නෙමෙයි. මේකේ දැන් අවුරුදු පහක් දහයක් තිස්සේ ආව ක්‍රමවේදයක් තියෙනවා.ගොඩක් තැන්වල සුදුසු නිලධාරීන් නෙමේ සුදුසු තැන්වලට පත් කරලා තියෙන්නේ.ඒ අයට විශාල වගකීම් සමූහයක් බාරදීලා තියෙනවා.නමුත් ඒ වගකීම් නිසි පරිදි ඉටු වෙන්නේ නැහැ.ලේකම්තුමිය හොඳ වැඩියි මෙතැනදී.මේ තනතුර එතුමියට බර වැඩියි.සමහරක් වෙලාවට,ඒ නිසා ඔබතුමිය ගන්න තීන්දු තීරණ වැඩි වගකීමක් සහිත ව තීරණ ගන්න.

(මන්ත්‍රීවරුන්ගේ ඝෝෂාව නිසා අදහස් පැහැදිලි ව නොඇසේ.)

මේ පල්ලෙහා පැත්තේ සේවකයෝ දහයක් පහළොවක් කොයිවෙලාවෙත් පාරේ ඇවිද ඇවිද ඉන්නවා.ඒ අයගෙන් නිසි පරිදි සභාවට සේවයක් වෙන්නේ නැහැ. කොපමණ වැරදි කරපු සේවකයෝ වුණත් ඒ අයට දඬුවම් වශයෙන් ලිපියක්වත් ගහන්න තවම බැරි වුණා.ඒවගේ කාටහරි දඬුවමක් කළා නම් මේ අනිත් සේවකයින් හැදෙනවා.දැන් හරි එක්කෙනෙක්ට හරි දඬුවමක් දීලා මේක නිසි පරිදි යහමගට ගන්න දැඩි ලෙස ශක්තිය ධෛර්යය ලැබේවා කියලා මම නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා**
ඇත්තටම මම නම් දකින්නේ මේ යෝජනාව සුදුසු වෙලාවේ නෙමෙයි යෝජනා කළේ.පසුගිය කාලය පුරාවට ම යම් යම් අඩුපාඩුකම් වැරදුණ තැන් විවේචනය කර කර ආපු කාලවකවානුවක් අපි ගත කලේ.ඇයි අපි එහෙම කළේ?කසුන් මුණසිංහට පෞද්ගලික ව සභාපතිතුමා එක්ක තරහක් නැහැ.ලේකම්තුමිය එක්කත් ඒ අය පෞද්ගලික ව තරහක් නැහැ.කමිටු පත් කරනකොට ඒ ඒ කමිටුවලට පත්වුණු අය පෞද්ගලිකව මේ සභාවේ නිලධාරීන් එක්ක ගැටලුවක් තියෙනවා ද?ඒත් නැහැ.මොකද අපි මේ සභාවට ආපු පළවෙනි දවසේම නිලධාරීන් අපිව උණුසුම් අයුරින් පිළිගත්තා.ඒ සේවකයන්,නිලධාරීන් තමයි අදත් ඉන්නේ.ඔවුන් සමග අපේ පෞද්ගලික ගැටුම් නැහැ.හැබැයි අපට ජනතා නියෝජිතයින් වශයෙන් වගකීමක් තියෙනවා.ඒ වගකීම වෙනුවෙන් තමයි කසුන් මුණසිංහලා වැරැද්ද පෙන්නුවේ. එහෙනම් වැරැද්ද වැරැද්ද ලෙස දකින්න පුරුදු වෙන්න.අද වැරැද්ද හෙට නිවැරදි වෙනවා නම් ඒක නෙමෙයි සිදුවිය යුත්තේ.නිවැරදි දේ හරියට කතා කරන්න පුරුදුවෙන්න.තමන්ගේ කොට්ඨාශයේ ඡන්ද දීපු ජනතාවට කෙලින් වැඩ කරන්න පුරුදු වෙන්න.ඒකයි ජනතා නියෝජිතයෙක් කියන්නේ.අද එකක් කියනවා,හෙට එකක් කියනවා,තව දවසක තව එකක් කියනවා.අපි අපි අතර මොකක්ද මේ වෙන්නේ.එක එක්කෙනාගේ අදහස් වියරුවෙන්.මේ නිලධාරීන්,මේ සේවකයන් කිසිම කෙනෙක් එක්ක මේ මන්ත්‍රීවරුන්ට ගැටුම් නැහැ.ප්‍රශ්න නැහැ. සභාපතිතුමා, ලේකම්තුමිය අතින් වැරදි වෙන්න ඇති.හැබැයි අපි ඒ වැරැදි පෙන්වා දුන්නා. ඒ පෙන්නලා දීලත් ඒවා හදාගන්න කාලයක් දෙනවා.එ වැනි තීන්දු තීරණ අපට වඩා ඉහළින් ඉන්න නිලධාරීන් ගන්නවා.අපි ඒවාට යටත් වෙනවා.ඒක තමයි අපි ඒ නිලධාරීන්ට කරන ගෞරවය.ඒ තුළ තමයි අපිට මේ පරිපාලනයෙන් ඉදිරියට යන්න පුළුවන්.අද මොකක්ද වෙලා තියෙන්නේ.දැන් අපි මේ මොකක් හරි එකක් අල්ලගෙන අපි අතරම ආපහු ගැටුමක් නිර්මාණය වෙලා.

හරි දේ පිළිබඳ ව පමණක් කතා කරන්න.මේ යෝජනාව පිළිබඳව මගේ නම් වැඩි මනාපයක් නැහැ.මම දකින්නේ මේ කාලය අපරාදේ.අපට පරිපාලනය තුළින් හෙට ලේකම්තුමිය මාරු කලත් තව ලේකම් කෙනෙක් එනවා.අපි ඒ ලේකම් එක්කත් වැඩ කරනවා.මේ ලේකම් හිටියත් මේ ලේකම් එක්කත් වැඩ කරනවා.සභාපතිතුමා මෙතන හිටියොත් අපි එතුමා සමගත් මේ ගමන යනවා.හැබැයි අපිට පුළුවන් වෙන්න ඕන අපිට ඡන්දය දුන්න මිනිස්සුන් වෙනුවෙන් කොන්ද කෙළින් තියාගෙන කොට්ඨාශයට ගිහිල්ලා,"අපි ඔබලා වෙනුවෙන් වැඩක් කළා" කියන්න.මම දකින්නේ මේ යෝජනාව කාලෝචිත නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**
ස්වාමීන් වහන්සේ ඉදිරිපත් කළ යෝජනාව පිළිබඳ ව අදහසක් කෙටියෙන් ඉදිරිපත් කරන්න ඕන.මේ පිළිබඳ ව විශාල අදහස් ප්‍රමාණයක් ඉදිරිපත් කළා.මේ ලේකම්තුමිය වැඩ බලන ලේකම් ධූරයෙන් ස්ථිර ලේකම්වරියක් වශයෙන් පත් කරන්න කියන එක තමයි මේ හාමුදුරුවන්ගේ ඉල්ලීම වෙන්නේ.මම හිතන්නේ ඔබතුමිය මේ සභාවේ ලේකම්වරිය වශයෙන් පත් වෙන්නේ 2019 දෙසැම්බර් මාසයේ.සභාවේ ලේකම්වරියගේ භූමිකාව කරන්නේ අවුරුදු දෙකයි මාස ගණනාවක් වගේ කාලයක්.ඒ කාලය ඇතුළත සිදු වුණුදේට තමයි ලේකම්තුමිය වගකිව යුතු වන්නේ.සාපේක්ෂ ව අපි හැමෝගෙම ගුණ අගුණ තියෙනවා.මනුෂ්‍යයෙක්ගේ අතින් වැරදි සිදු වෙන්න පුළුවන්.ඒ වැරදි නිවැරදි කර ගන්න පුළුවන්.රටේ වෙලා තියෙන්නේ වැරදි කරන අයගේ වැරදි නිවැරදි කර ගන්නේ නැති එක සහ වැරදි වැරදි විදිහටම කරගෙන යන එක.

(මන්ත්‍රීවරුන්ගේ ඝෝෂාව නිසා අදහස් පැහැදිලි ව නොඇසේ.)

තීන්දු තීරණ ගැනීමේ දී යම් යම්අඩුපාඩුකම් තියෙන්න පුළුවන්.මම කියන්නේ වැරැද්ද නිවැරදි කර ගැනීමට අවස්ථාව දුන්නම ඒ වැරැද්ද නිවැරදි කර ගන්නවද කියලා බලන්න ඕන.මේ වැරදි නිවැරදි වෙමින් තියෙනවා.සියලු දේම එකවර නිවැරදි කර කරගැනීමට හැකියාවක් නැහැ.

(මන්ත්‍රීවරුන්ගේ ඝෝෂාව නිසා අදහස් පැහැදිලි ව නොඇසේ.)

යම්කිසි වැරැදි ප්‍රමාණයක් දැන් නිවැරදි කරගෙන තියෙනවා.ඒ වගේ ම මේ සියළු ම වැරදිවලට ලේකම්තුමියට පමණක් වග කියන්න බැරි බවත් මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.ඒ ඉතිරි වැඩ කටයුතු නිවැරදි කරගෙන මේ සභාවේ ලේකම්තුමියගේ වැඩ කටයුතු නිවැරදි ව කරගෙන යන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහොමඩ් හමීඩ් රම්සාන් මහතා**
ඒ දවස්වල මේ සභාවේ නිසි අයුරින් මේ වැඩ කටයුතු සිදු කෙරුණා නම් හොඳ දෙයක් වෙන්න තිබුණා.ඒ වෙලාවේ ඔබතුමන්ලා මැදිහත් මැදිහත් වෙලා මේක කළා නම් ඒ දවස්වලම මේක හදාගන්න තිබුණා.ඒ වගේ ම ගරු සභාපතිතුමා සහ ලේකම්තුමිය දැනගන්න ඕන ඒ ඒ අයට තියෙන බලතල පිළිබඳ ව.ඒ බලතල භාවිත කරලා මේ සභාවට හොඳ දෙයක් කරන්න.මේ මන්ත්‍රීතුමන්ලා ඒ වැරදි පෙන්වා දුන්නාට පස්සේ ඒවා හදාගන්න.මේ වැරදි පෙන්නලා දෙන්නේ පෞද්ගලික තරහකට නෙමෙයි.මේක ඒ දවස්වල ම විපක්ෂයේ මන්ත්‍රීවරු එක්ක එකතු වෙලා කරන්න තිබුණ දෙයක්.එ නිසා සභාපතිතුමා සහ ලේකම්තුමිය ඉදිරියට මේ සභාව නිවැරදි මාර්ගයට ගෙන යන්නයි කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මේ ලේකම්තුමිය මේ සභාවේ වාඩි වුණු පළවෙනි දිනයේ ම මේ සභාව ලේකම්තුමිය එක්ක ගෙනියන්න බැහැ කියලා මම කිව්වා.ඒ දවස්වල වාර්තාවල ඇති, බලන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**
මුලින්ම මතක් කරන්න ඕන ඇත්තට ම මේ යෝජනාව දැමීමෙන් මට අවශ්‍ය වුණේ මේ මන්ත්‍රීවරු සහ නිලධාරීන් අතර තියෙන ගැටුම,වැරදි මතය ඉවත් කරන්න.හොඳ අදහස් කීපයක් ඉදිරිපත් වුණා. මේ පිළිබඳ ව කාටවත් පෞද්ගලික ප්‍රශ්නයක් නැහැ.හැමෝගෙම තියෙන්නේ පොදු අරමුණක් සහ මතයක්.අනික ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා කිව්වා මේ යෝජනාව ගෙනාපු එකෙන් සභාව හැල්ලුවට ලක් වුණා කියලා.මේවට උත්තර නොදී ඉන්න බැහැ.මම නිසා නෙමේ සභාව හැල්ලුවට ලක් වෙලා තියෙන්නේ,මන්ත්‍රීවරු නිසා යි මේ සභාව හැල්ලුවට ලක් වෙලා තියෙන්නේ.හැල්ලුවට ලක් කරන වැඩ අපි කරලා නැහැ.මේ සභාවේ හැමදාම අපි බලාපොරොත්තු වුණේ ඒකයි.ලේකම්තුමිය වැරදි කරලා තියෙනවා නම්, හොරකම් කළා කියලා ඔප්පු වුණොත් මම ම තමයි ලේකම්තුමිය යවන්න යෝජනාව ගේන්නේත්.මේ සභාවේ අපි කොපමණ යෝජනා සාකච්ඡා කලත් අපිට ලේකම්තුමිය යවනවාද නැද්ද කියන බලතලයක් නැහැ.ඒක සභාපතිතුමාට තියෙන්නේ.එහෙම නැතිනම් ඉහළ කොමසාරිස්ලාට තියෙන්නේ.ලේකම්තුමිය හොරකම් කරපු කෙනෙක් නොවන බව අපි දන්නවා.මේ කතාවල දී මන්ත්‍රීවරු කියන්නෙත් "ලේකම්තුමියගේ පරිපාලනයේ අඩුපාඩුකම් තිබුණා,දුර්වලකම් තිබුණා.මේ අඩුපාඩුකම් ටික හදාගන්න"කියලා.ලේකම්තුමියට මේ සභාව පවත්වා ගෙන යන්න කිහිපදෙනෙක් සහයෝගය දෙන්නෙත් නැහැ.සමහර තොරතුරු මන්ත්‍රීවරුන්ටත් දීලා.මන්ත්‍රීවරුන් සහ නිලධාරීන් අතර වෛරයක් බවට පත් කරලා තියෙනවා.(මේ සත්‍ය තොරතුරු දුන්නාට කමක් නැහැ.)ඒක තමයි සමාජයට පෙන්නන්නේ.හැබැයි මන්ත්‍රීවරු මේක කරන්නේ ඇත්තටම සද්භාවයෙන්.අපි අවුරුදු තුන හතරයි ඉන්නේ.එළියට යනකොට අපට මේ කුණුගොඩවල් දාගෙන යන්න බැහැ.හැබැයි අපටත්

තොරතුරු එනවා.නමුත් අපට අවශ්‍ය වුණේ මේක නිවැරදි කරගෙන ගමනක් යන්න.නැති නම් කිසිසේත්ම මේ යෝජනාව දැම්මේ කඩාකප්පල් කරන්න නෙමයි.මම කසුන් මන්ත්‍රීතුමාව ළඟින් ම ඇසුරු කරන කෙනෙක්.ළඟින් ඇසුරු කරා කියලා මම දාපු යෝජනාවට එතුමා කැමැති වෙන්න ඕන කියලා එකක් නැහැ.අපේ හිතවත්කම් වෙනයි.මම ඒක තේරුම් අරගෙන තියෙනවා.මේ යෝජනාව දැම්මේ සභාපතිතුමා හෝ ලේකම්තුමිය කියලා නෙමෙයි.මේ යෝජනාව දෙනකොටත් මේක දාන්න එපා කියලා මේ දෙපළම ඉල්ලීමක් කළා.මේක මගේ මතය.මට අවශ්‍ය වුණේ සභාපතිතුමා සහ නිලධාරීන් අතර ඇති වෙලා තියෙන වැරදි මතය නැති කරන්න.අපි කවදාවත් ඔවුන්ව රකින්න උත්සාහ කරන්නේ නැහැ.අපි මේ සභාව නිවැරදි කරගෙන යහපත් ලෙස ඉදිරියට යන්නයි මේ යෝජනාව සද්භාවයෙන් දැම්මේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මම මේ තොරතුරු දුන්න එක සම්බන්ධ ව කතා කරන්නේ.මට වැරදි තොරතුරක් දුන්නාද නැද්ද කියන එක අද මේ සභාවේ දී ඔප්පු වෙලා තියෙනවා.පළවෙනි තොරතුර තමයි නිකේෂලා කියන සේවිකාව අයථා ලෙස අත්සන් කරලා වැටුප් ගන්නවා කියන එක.මම දන්නෙ නෑ ඒ සඳහා විමර්ශනය කරලා ඒ වාර්තාව පිළිබඳ ව තාමත් මේ සභාව දැනුවත් කරලා නැහැ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඒ විමර්ශන වාර්තාව තාම ලැබිලා නැහැ.එතෙක් ඒ සේවිකාව අයතා ලෙස අත්සන් කළ දිනවලට අදාල ව අයකර ගන්නා ලෙස දැනුවත් කරලා තියෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ඊට අමතර ව සභාපතිතුමා,ගිය සභාවෙදි ලේකම්තුමිය මට පොරොන්දු වුණා උප සභාපතිතුමාගේ නිල කාමරය අළුත්වැඩියා කරපු එකේ වාර්තාව දෙනවා කියලා.2019දි මම මේක ඉල්ලුවේ.අදටත් මේවා ලැබිලා නැහැ.මම දන්නේ නැහැ තව දුරටත් මේ සභාවේ ලේකම්තුමිය ඉන්නවා ද නැද්ද කියලා තීරණය කරන්න.ඊට අමතර ව කවුරුවත් අපිට වැරදි තොරතුරක් දීලා නැහැ. කොම්පෝස්ට් එකේ හොරකම් වෙනවා කියලා කතා කරලා කිව්වේ කොම්පෝස්ට් එකේම කම්කරුවෙක්.මේ ආයතනයට ආදරේ කරන සේවකයොත් මේ තැන්වල ඉන්නවා.ඒ තොරතුරු අපට දෙන එක වරදක් ද?දීලා මේවා නිවැරදි කරන එකේ තියෙන ගැටලුව මොකක් ද?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කමිල් කුමාර මහතා**
ස්වාමීන් වහන්සේ කළ යෝජනාව සම්බන්ධ ව මම ඇත්තට ම අදහස් දක්වන්න ඕන.මම කියන්නේ මේ ලේකම්තුමිය තවදුරටත් ලේකම් තනතුරේ වැඩ කරගෙන යන්න ඕන.මම එතුමිය එක්ක වැඩ කරන කාලයේ එතුමියගේ අවංකභාවය පිළිබඳ ව ගැටලුවක් නැහැ.සමහර තැන්වලදී තේරුණා නිලධාරීන්ගේ ගැටලුවල දී ලේකම්තුමිය කටයුතු කරපු විදිහ.සමහර වෙලාවට මට තේරුණා නිලධාරීන් කරන වැරදිත් ලේකම්තුමිය පිටින් යන්නේ කියලා.මේ නිලධාරීන් සම්බන්ධ ව ඍජු ව කටයුතු කරන්න.

(මන්ත්‍රීවරුන්ගේ ඝෝෂාව නිසා අදහස් පැහැදිලි ව නොඇසේ)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
වෙනත් පැහැදිලි කරගැනීමක් දැනගන්න තියෙනවා.දූෂමානයක් තියෙනවා මේ සභාවේ ලේකම්තුමියගේ අත්සන ව්‍යාජ ලෙස යොදලා යම්කිසි තැනැත්තෙක් විසින් ලිපියක් සකසලා

කඩ කාමර සම්බන්ධ කුමන හෝ දෙයකට යොදා ගෙන තියෙනවා කියලා.එහෙම දෙයක් තියෙනවා ද?එහෙම තියනවා නම් මේ සභාව ඒ පිළිබඳ ව දැනුවත් කරන්න.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ලේකම්තුමියගේ අත්සන සහ සීල් එක ස්කෑන් කරලා,ලිපියක් මුද්‍රණය කරලා තවත් පුද්ගලයෙකුට දුන්නාට පස්සේ ඒ කෙනා ලේකම්තුමියගේ නිවසට ගිහිල්ලා ඒ ගැන විමසලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කාන්ත සිරිවර්ධන මහතා**
කවුද සභාපතිතුමා දීලා තියෙන්නේ?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
පුද්ගලයා ගැන මට වාර්තා කළේ නැහැ.

ඒ ලිපිය අරගෙන ලේකම්තුමියගේ නිවසට ගිහිල්ලා ලේකම්තුමියගේ මහත්තයාගෙන් විමසලා තියෙනවා,"මේ මුදල් ගෙවීම පිළිබඳව" උපදෙසක් ලබා ගන්න.එතකොට තමයි මහත්තයා ඇවිත් අහලා තියෙන්නේ"මොකක්ද මේ ප්‍රශ්නයක් තියෙනවා ද?" කියලා.ලේකම්තුමිය මේ පිළිබඳ ව කටයුතු කරන්න අවශ්‍ය නිසා එතුමියගේ ආරක්ෂාවට පොලිසියේ පැමිණිල්ලක් දාලා තියෙනවා.ඒ පිළිබඳ පොලිසියේ විමර්ශන සිදුවෙමින් පවතිනවා කියලයි වාර්තා වෙන්නේ. මට මේ පිළිබඳ ව ලිඛිතව ලැබිලා නැහැ.ඒ නිසා ඒක ලේකම්තුමියට තියෙන අයිතියක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
සභාවේ තියෙන අයිතියක් කවුරු හරි කෙනෙක් අයතා ලෙස භාවිත කරලා තියෙනවා නම් ඒකේ අවමානය මේ මතුගම ප්‍රාදේශීය සභාවේ නිලධාරීන්ට එල්ල වෙනවා.මේ සම්බන්ධයෙන් නීතිමය කටයුතු ආරම්භ කරලා තියෙන්න ඕන මේ වෙනකොට.කූඨ ලේඛන සකසලා තියෙන්නේ.මේ කරපු කෙනාව අත්අඩංගුවට ගන්න ඕන කාරණයක් මේක.මේ වැනි ම සිදුවීමක් මීට පෙර මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙත් සිදු වුණා.ඊට පසු ව මේ සිදුවීම දැන ගන්න ලැබිලා තියෙන්නේ.මෙතන ඊට එහා ගිහින් කූඨ ලේඛනයක් සකස් කරලා තියෙන්නේ.මේ කූට ලේඛන සකස් කිරීම ඉතා විශාල වරදක්.මතුගම ප්‍රාදේශීය සභාවේ සීල් එක මේ යොදාගෙන තියෙන්නේ.මේ පිළිබඳ ව නීතිය ක්‍රියාත්මක වෙනවා නම් අපි ඒ පිළිබඳ ව සතුටු යි.

**6.6 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා විසින් ඉදිරිපත් කරන ලද යථා පරිදි කල් දී ඇති යෝජනා -:**

6.6.1 2022 සැප්තැම්බර් 20 දින පල වූ ලංකාදීප පුවත්පත් වාර්තාවේ “මතුගම ආපන ශාලාවකින් ලක්ෂ 20ක බදු සෙල්ලම් ”යන ශීර්ෂය යටතේ පල වූ වාර්තාවේ සඳහන් පරිදි සභාවේ මිශ්‍ර ආදායම් විෂය කළමණාකරන සේවා නිළධාරිනියගේ වාර්තාවක් ඇත්නම් සභාගත කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා විසින් ගරු සභාවට යෝජනා කරන ලදී.

6.6.2 පසුගිය සභා වාරයේ දී මා විසින් ඉදිරිපත් කර සභා සම්මත වූ මතුගම නගරය සංචාරක කළාපයට ඇතුළත් කර ගැනීමේ යෝජනාව ප්‍රායෝගික ව කර ගැනීම සඳහා කමිටුවක් නිර්දේශ කර එ මඟින් කඩිනම් යෝජනාවලියක් සහ සැලසුම් වාර්තාවක් නිර්මාණය කර ගැනීම සඳහාත් ඒ උදෙසා වූ කමිටුව මෙම සභාවාරයේ දී ම ස්ථාපනය කර මෙම මස තුළ ම යෝජනා පත්‍රයක් නිර්මාණය කර ගැනීමට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා විසින් ගරු සභාවට යෝජනා කරන ලදී.

6.6.3 කෝපිවත්ත මාතෘ සායනය අසළ ත්‍රීරෝද රථගාලක්(ගොරක්ගොඩවත්ත)ස්ථාපනය කිරීමට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා විසින් ගරු සභාවට යෝජනා කරන ලදී.

<u>තීරණය</u>

6.6.1 2022 සැප්තැම්බර් 20 දින පල වූ ලංකාදීප පුවත්පත් වාර්තාවේ "මතුගම ආපන ශාලාවකින් ලක්ෂ 20ක බදු සෙල්ලම් "යන ශීර්ෂය යටතේ පල වූ වාර්තාවේ සඳහන් පරිදි සභාවේ මිශ්‍ර ආදායම් විෂය කළමණාකරන සේවා නිළධාරිනියගේ වාර්තාවක් ඇත්නම් සභාගත කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා විසින් ගරු සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දගේ හින්ටන් ගුණසිරි මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

6.6.2 පසුගිය සභා වාරයේ දී මා විසින් ඉදිරිපත් කර සභා සම්මත වූ මතුගම නගරය සංචාරක කළාපයට ඇතුළත් කර ගැනීමේ යෝජනාව ප්‍රායෝගික ව කර ගැනීම සඳහා කමිටුවක් නිර්දේශ කර එ මඟින් කඩිනම් යෝජනාවලියක් සහ සැලසුම් වාර්තාවක් නිර්මාණය කර ගැනීම සඳහාත් ඒ උදෙසා වූ කමිටුව මෙම සභාවාරයේ දී ම ස්ථාපනය කර මෙම මස තුළ ම යෝජනා පත්‍රයක් නිර්මාණය කර ගැනීමට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා විසින් ගරු සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දගේ හින්ටන් ගුණසිරි මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

6.6.3 කෝපිවත්ත මාතෘ සායනය අසළ ත්‍රීරෝද රථගාලක්(ගොරක්ගොඩවත්ත)ස්ථාපනය කිරීමට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා විසින් ගරු සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දගේ හින්ටන් ගුණසිරි මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

(මන්ත්‍රීවරුන්ගේ ඝෝෂාව නිසා අදහස් පැහැදිලි ව නොඇසේ.)

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා ඉල්ලීමක් කළා ඉම්රිච් ආයතනය සම්බන්ධ ව පුවත්පත් වාර්තාවක් ගියා කියලා,ඒක පලවෙලා තිබුණ ආකාරය පිළිබඳ ව විමසීම කරන්නේ.පුවත්පත් වාර්තාවේ සඳහන් වෙලා තිබුන දේ පිළිබඳවයි ඔබතුමා ඇහුවේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා**
ඇත්තෙන්ම ඔව්,මේ පුවත්පත් වාර්තාවේ තියෙන්නේ ඉම්රිච් ආයතනය සම්බන්ධ ව අයවෙන්න තියෙන මුදල පිළිබඳ ව සභාවේ මිශ්‍ර ආදායම් නිලධාරීනියගෙන් තොරතුරු ලබා ගත්තා කියලා.ඒත් මේ පිළිබඳ ව හොයන්න පටන් ගත්තේ මම ගිය සභා වාරයේ දී ඉදිරිපත් කළ ප්‍රශ්න නිසා.

(මන්ත්‍රීවරුන්ගේ ඝෝෂාව නිසා අදහස් පැහැදිලි ව නොඇසේ.තව ද හඬපටය පටිගත වීමේ දී සිදු වූ දෝශයක් හේතුවෙන් හඬපටය පටිගත වී නැත.)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
අපි ඔය ඉම්රිච් ආයතනයෙන් සල්ලි එකතු නොකළ එකට පරීක්ෂණයක් ඉල්ලුවා. මේ ඉල්ලන ඒවා මොකක්වත් හම්බ වෙන්නේ නැහැ.ඇයි මේ සල්ලි එකතු නොකළේ?ලක්ෂ විසි ගාණක් යනකම් මොනවද කළේ? අපට මේ සම්බන්ධයෙන් සල්ලි එකතු නොකළේ ඇයි කියලා වාර්තාවක් දෙන්න.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
නැහැ,පසුගිය මාසේ මේ ප්‍රශ්නය ආව ගමන් මේ කඩ හිමියන්ව ගෙන්නුවා.අපි කටයුතු කළ ආකාරය පිළිබඳ ව පැහැදිලි කරන්න,ඒ වාර්තාව දෙන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මේකට වැරදිකාරයෝ කවුද කියලා මුලින් ම කියන්න.මේ හැමදේම හංගන්න එපා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මොනවාද හංගන්න තියෙන්නේ?ඒකෙන් අය වෙන්න ඕන ගාණ තියෙනවා.ඒ ආර්.අයි. මහත්තයත් මාරු කරලා තියෙනවා.මට හංගන්න දෙයක් නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කාන්ත සිරිවර්ධන මහතා**
ඔය වාර්තාව දෙන්න.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මේ ඉම්රිච් ආපනශාලාව සම්බන්ධ ව අපේ සභාවට අයවෙන්න ඕන මාසික කුලිය පිළිබඳ ව අපි තීරණයක් ගත්තා.එහි දී මන්ත්‍රීවරු සකච්ඡා කිරීමෙන් අනතුරු ව ඔක්තෝම්බර් සිට මාසික කුලිය රුපියල් 90 000.00 සමඟ හිඟයෙන් අවමය රු.50 000.00 බැගින් මාසික ව ගෙවිය යුතු බවට තීරණය වුණා.

එහි දී වසර දෙකක උපරිම කාල සීමාවක් තුළ ගෙවා අවසන් කිරීමටත්,

ඊටත් අමතර ව බදුකරු විසින් සාකච්ඡාවේ දී අදහස් දැක් වූ පරිදි ණය පහසුකමක් ලබා ගෙන හෝ ඉතිරිය ගෙවා අවසන් කිරීමටත් “ඉම්රිච්” ආයතනයට ලිඛිත ව දැනුම් දෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මේකේ පොඩි ගැටළුවක් තියෙනවා.මේ කොඩිඩ් කාල සීමාව තුළ එයාට සහන කාලයක් දීලා තියෙනවා.මොකද මේ කාල සීමාව ආපන ශාලාවක් පවත්වා ගෙන යන්න පුළුවන් කාල සීමාවක් නෙමෙයි.ඊට පස්සේ ගෑස් ප්‍රශ්න ඒවා මේවා ආවා.ඒ නිසා ඔහුට දෙන්න පුළුවන් උපරිම සහන කාල සීමාවක් ලබා දෙන්න.මාස හයක් වුණත් කමක් නැහැ ඒ සහන කාල සීමාව ලබා දෙන්න.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඉන්පසුව මේ පුබුදු මධුරංග ජයනෙත්ති මන්ත්‍රීතුමා ගිය සභා වාරයේදී ඉදිරිපත් කළ මතුගම නගරය සංචාරක කළාපයට ඇතුළත් කර ගන්නා මෙන් කළ යෝජනාව සම්බන්ධයෙන් සංචාරක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට යෝජනාවලියක් නිර්මාණය කරගැනීම සඳහා කමිටුවක් පත් කර ගැනීම පිළිබඳ ව ඉල්ලීමක් කළා.මේ පිළිබඳ ව උනන්දුවක් තියෙන මන්ත්‍රීවරුන් ඉදිරිපත් වෙලා කමිටුවක් වශයෙන් පුළුවන් සහයෝගය දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.
මේ කමිටුව සඳහා මන්ත්‍රීවරුන් සාකච්ඡා කිරීමෙන් අනතුරු ව ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහොමඩ් හමීඩ් රම්සාන් මහතා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා යන මන්ත්‍රීවරුන් එක් විය.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මේ වියදම් කිරීමට තියෙන චක්‍රලේඛනය ඉවත් කරලා අවස්ථාව දීලා තියෙනවා අපට වැඩ කරන්න.ඒ පිළිබඳ අපි රජයට ස්තුතිවන්ත වෙනවා.මේ සම්බන්ධයෙන් කටයුතු කරනකොට අපි විශේෂයෙන් හඳුනාගත්ත කොටස් ටිකක් තියෙනවා.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා යෝජනා කළා නගරයට බොජුන් හලක් හදන්න.ඒ වගේ ම මතුගම ක්‍රීඩා පිටිය ඉදිරියේ

නැබඩ පාරේ තියෙන ගෙවල් යටවෙනවා.ඒ කානුව ප්‍රතිසංස්කරණය කරන්න හඳුනාගෙන තියෙනවා.මතුගම බස් නැවතුම්පොළේ සෝදාපාළුවට ලක් වෙන ස්ථානයක් තියෙනවා.එතන පැති බැම්මක් ගහලා ආරක්ෂා කරන්න වැඩපිළිවෙළක් සකසා ගෙන තියෙනවා.මේ වියදම් කිරීමට තියෙන චක්‍රලේඛනය ඉතාම ප්‍රබල යි.නිලධාරීන් බිය වෙනවා ඒ නිසා.හැමෝම ඉල්ලුවාට පසුව යි චක්‍රලේඛනය අයින් කළේ.තවත් යෝජනා තියෙනවා නම් ඉදිරිපත් කරන මෙන් ඉල්ලා සිටිනවා.

**7. කාරක සභා වාර්තාව සලකා බැලීම.**

2022.09.27 වන දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති කාරක සභාවේ කමිටු වාර්තාව හා තාක්ෂණ ඇගයුම් කමිටු වාර්තාව සභාගත කරන ලදී.එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් සථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය. (ඇමුණුම 01)

<u>**2022.09.27** දින ප.ව.**03.00** ට මතුගම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ පැවති මුදල් සහ ප්‍රතිපත්ති කාරක සභාවේ සංක්ෂිප්ත වාර්තාව</u>

සහභාගිත්වය-ධූරධාරීන්

1. මෙරිල් මුණසිංහ මහතා - ගරු සභාපති
2. හින්ටන් ගුණසිරි මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී(සාමාජික)
3. ධම්මික විජේසිංහ මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී(සාමාජික)
4. එන්.ප්‍රේමරත්න මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී(සාමාජික)
5. නිශාන්ත කුලතුංග මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී(සාමාජික)
6. ප්‍රියංකා ගුණවර්ධන මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී(සාමාජික)
7. පුබුදු ජයනෙත්ති මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී(සාමාජික)

සහභාගිත්වය-නිලධාරීන්

1. අයිරාංගනී තෙන්නකෝන් මිය - ලේකම්
2. සමින්ද කුමාර මයා - වැඩ අධිකාරී
3. එම්.කේ.ඩී.සී.අවන්ති මෙනෙවිය - සංවර්ධන නිලධාරී(සභා)

<u>සාකච්ඡා කළ කරුණු</u>

01. සභාව සතු සියලු වාහන ඉදිරි වර්ෂය සඳහා රක්ෂණය කිරීමට රක්ෂණ සමාගමක් තෝරා ගැනීමේ දී වාහනවල වර්තමාන වටිනාකම යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ තක්සේරුවක් මගින් නිර්දේශයක් ලබා ගෙන එම වටිනාකම් අනුව ඉදිරිපත් වූ රක්ෂණ සමාගම් වෙතින් නැවත මිළ ගණන් කැඳවා සුදුසු රක්ෂණ සමාගමක් තෝරා ගැනීමටත් එය මහ සභාවේ අනුමැතියට යොමු කිරීමටත් නිර්දේශ කරන ලදී.

02. පළාත් සභා අරමුදල් යටතේ ක්‍රියාත්මක වන බෙලිවත්ත කන්ද පානීය ජල ව්‍යාපෘතියේ ජල මෝටරය ජිනසේන සමාගමෙන් මිළ දී ගැනීමටත් PVC බට මිළ දී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් වාර්තාවක් ලබා ගෙන එය මහ සභාවට යොමු කිරීමට නිර්දේශ කරන ලදී.ඒ සඳහා පහත ආයතනවලින් මිළ ගණන් ලැබී ඇත.

| ආයතනය | විස්තරය | මාදිලිය | වගකීම | දිග | මිළ |
|---|---|---|---|---|---|
| 1. චාමර ට්‍රේඩර්ස් පුද්ගලික සමාගම | PVC Pipe 2"(type 1000) With socket<br><br>PVC Pipe 2"(type 1000) Without socket | s-lon<br><br>s-lon | Lifetime<br><br>Lifetime | 04m<br><br>04m | 11090.00<br><br>10680.00 |
| 2. සිරිජය ට්‍රේඩින් පුද්ගලික සමාගම | PVC Pipe 2"(type 1000) With socket<br><br>PVC Pipe 2"(type 1000) Without socket<br><br>2" without socket | Arpico<br><br>Arpico<br><br>s-lon | -<br><br>-<br><br>- | 4m<br><br>4m<br><br>4m | 6776.00<br><br>6330.00<br><br>8795.00 |

| 3. ආයතනය | විස්තරය | Qty | Unit | Unit Price | Amount |
|---|---|---|---|---|---|
| ජිනසේන පුද්ගලික සමාගම | CENTRIC Type pumping Unit-<br>HM 200/3-W<br>Suction-pipe-Dm:2"<br>Delivery-pipe-Dm:2"<br>Mid-Range:2400Imp.gph@340ft<br>Max-Suction-Lift:25ft<br>Max-Total-Head:420ft<br>Min-Operating-Head:170ft<br>Prime-Mover:JEM-IE2-12.5 HP,3 | 1.00 | pcs | 785,795.00 | 785,795.00 |

03. අංක 9 අළුත්ගම්ගොඩ කොට්ඨාශයේ යෝජිත ව්‍යාපෘතිය යටතේ ටෙන්ට් එකක් සෑදීමට අවශ්‍ය යකඩ අවම මිළට ලබා ගැනීමටත් ප්ලාස්ටික් පුටු 50ක් මිළ දී ගැනීමටත් කැඳවන ලද මිළ ගණන් තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවක් මගින් මහ සභාවට යොමු කිරීමට නිර්දේශ කරන ලදී.ඒ සඳහා පහත ආයතනවලින් මිළ ගණන් ලැබී ඇත.

<u>නිල්කමල් ආයතනය</u>

| විස්තරය | ප්‍රමාණය | Unit Price without VAT | VAT 12% | Unit price with VAT | Total Price with VAT |
|---|---|---|---|---|---|
| 1.Plastic Armless chair Opal | 1 | 3281.25 | 393.75 | 3675.00 | 3675.00 |
| 2. Plastic Armless chair Amelia | 1 | 2491.07 | 298.93 | 2790.00 | 2790.00 |

<u>දම්රෝ ආයතනය</u>

| විස්තරය | Qty | Unit price | Amount | Discount | Discounted Amount |
|---|---|---|---|---|---|
| 1.BIG 122 CHAIR ROSE WOOD | 50 | 2610.00 | 130,500.00 | 5% (6525.00) | 123,975.00 |

යකඩ මිළ දී ගැනීම සඳහා **අරුණ රබර් කම්පනි(පුද්)සමාගම,M.N.කන්ස්ට්‍රක්ෂන්,චාමර ට්‍රේඩ් සෙන්ටර්,සිරිජය ට්‍රේඩින් (පුද්)සමාගම** යන ආයතන මගින් මිළ ගණන් ලැබී ඇත**. (ඇමුණුම 05)**

04. පුස්වැල්තැන්න හරස් මාර්ගයේ බෝක්කුව ඉදි කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිළ දී ගැනීමේ දී අවම මිළ ගණන් යටතේ මිළ දී ගැනීමට නිර්දේශ කරන ලදී.මෙම බෝක්කුව ඉදි කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිළ දී ගැනීම සඳහා **තිලකරත්න ට්‍රේඩර්ස්, H.S.M.මෙටල්, N.T.S.හාඩ්වෙයාර්,ලක්ජය හාඩ්වෙයාර් යන ආයතන** මගින් මිළ ගණන් ලැබී ඇත.

| අනු අංකය | ද්‍රව්‍ය | ප්‍රමාණය | තිලකරත්න ට්‍රේඩර්ස්(එකක මිළ) | H.S.M.මෙටල් (එකක මිළ) | N.T.S.හාඩ්වෙයාර් (එකක මිළ) | ලක්ජය හාඩ්වෙයාර්(එකක මිළ) |
|---|---|---|---|---|---|---|
| 1 | සිමෙන්ති 50Kg | 68 | 3150.00 | - | 3250.00 | 3200.00 |
| 2 | ¾ “කළු ගල් | Cube 3 | 1 4500.00 | 13000.00 | 18500.00 | 18000.00 |
| 3 | 1 ¾” කළු ගල් | Cube 3 | 1 4500.00 | 13000.00 | 11000.00 | 11000.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 4 | ABC මිශ්‍රණය | Cube 3 | 1 2500.00 | 11500.00 | 12500.00 | 12000.00 |
| 5 | ගංගා වැලි | Cube 4 | 25750 .00 | - | 26500.00 | 26000.00 |
| 6 | 1" ලෑලි | 40m² | 87.50 | - | 44.50 | අඩි එකක් මිළ-100.00 |
| 7 | 10 දගර වානේ කම්බි | Nos15 | 1475.00 | - | 1600.00 | 1500.00 |

05. මාර්ග අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය තාර මිළ දී ගැනීම අවම මිළ ගණන් යටතේ සිදු කිරීමට නිර්දේශ කරන ලදී.ඒ අනුව අවශ්‍ය තාර මිළ දී ගැනීම සඳහා **"බෙන්කෙම් හෝල්ඩින්ග්ස්** ආයතනය" සහ **"බිටුලින්ක් ඉමල්ෂන් පුද්ගලික සමාගම"** මඟින් මිළ ගණන් ලැබී ඇත.

| අනු අංකය | ආයතනය | ද්‍රව්‍ය වර්ගය | අවශ්‍ය ප්‍රමාණය | ඒකක මිළ |
|---|---|---|---|---|
| 1. | බෙල්කෙම් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම | තාර 80/100 (180 L) | 08 | 37,800.00 |
| 2. | බිටුලින්ක් ඉමල්ෂන් පුද්ගලික සමාගම | තාර 80/100 (180 L) | 08 | 38,800.00 |

ඒ අනුව බෙල්කෙම් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම අවශ්‍ය තාර මිළ දී ගැනීම සඳහා නිර්දේශ විය.

06. මතුගම ප්‍රධාන කාර්යාලය සඳහා ඇඹිලි සලකුණු යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සඳහා රු113850.00ක මුදලක් වැය වන අතර අළුතින් මිලදී ගැනීම සඳහා රු.133410.00ක මුදලක් වැය වන බැවින් ඇඟිලි සලකුණු යන්ත්‍රයක් මිළ දී ගැනීමට නිර්දේශ කරන ලදී.

07. සාරානන්ද මාවත,නාරවිල බෝපිටිය සම්බන්ධ කෙරෙන ප්‍රධාන මාර්ගයේ පිහිටි,ප්‍රධාන පාලමේ ආරක්ෂිත වැටවල් දෙක කැඩී බිඳී ගොස් ඇති බැවින් ඒ සඳහා සභාවේ පැස්සුම්කරු යොදවා අළුත්වැඩියා කටයුතු සිදු කිරීම අසීරු බැවින් ඒ පිළිබඳ විෂය දැනුමැති පුද්ගලයෙකු හෝ ආයතනයකින් එම කාර්යය කඩිනමින් ඉටු කරවා ගැනීම සුදුසු බව නිර්දේශ කරන ලදී.

මෙරිල් මුණසිංහ මහතා -

නිශාන්ත කුලතුංග මහතා -


ප්‍රේමරත්න නාකන්දල මහතා -



ධම්මික විජේසිංහ මහතා -



ප්‍රියංකා දමයන්ති මිය -



හින්ටන් මද්දගේ මහතා -



පුබුදු මධුරංග මහතා -

ඒ අනුව අංක 09 අලුත්ගම්ගොඩ කොට්ඨාශයේ යෝජිත ව්‍යාපෘතිය යටතේ ටෙන්ට් එකක් සඳහා ප්ලාස්ටික් පුටු මිළ දී ගැනීමට “නිල් කමල් ආයතනය” වෙතින් “PLASTIC ARMLESS CHAIR AMELIA”වර්ගයේ පුටු මිළ දී ගැනීම සුදුසු බව තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාව මඟින් නිර්දේශ විය.

පළාත් සභා අරමුදල් යටතේ ක්‍රියාත්මක වන බෙලිවත්ත කන්ද පානීය ජල ව්‍යාපෘතියේ ජල මෝටරය ජිනසේන සමාගමෙන් මිළ දී ගැනීමටත් PVC බට මිළ දී ගැනීම සඳහා අදාළ ද්‍රව්‍ය චාමර ට්‍රේඩ් සෙන්ටර් වෙතින් ලබා ගැනීම සුදුසු බව තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාව මඟින් නිර්දේශ විය.

**8. ආදායම් සහ වියදම් වාර්තා සලකා බැලීම.**

2022 අගෝස්තු මස ආදායම් සහ වියදම් වාර්තා සභාවේ දැන ගැනීම සඳහා සභාගත කරන ලදී.

**9. පුද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

න්‍යාය පත්‍රානුකූල ව මෙදිනට නියමිත කටයුතු අවසන් වීමෙන් පසු ව මහ සභාවේ කටයුතු ප.ව.2.45ට පමණ අවසන් විය.